"සරසවි සඳරැස" කතෘ ධූරය දැරූ

සබරගමුවේ

වේරගම පුඤ්ඤවිබණ්ඩාර පණ්ඩිතුමන්

විසින් රචනා කරන ලද

සිංහල ව්‍යාකරණ

පද නීතිය

PADANITIYA

or

A SINHALEASE GRAMMAR

by

WERAGAMA PUNCHIBANDARA

of

SABARAGAMUWA

Editor of the

"SARASAVI SANDARESA"

අධ්‍යාපන ග්‍රන්ථ මණ්ඩලය විසින් නිර්දේශ කරණ ලදින්
අධ්‍යාපන අධ්‍යක්ෂතුමන් විසින් පාඨශාලීය ව්‍යාකරණ
පොතක් වශයෙන් අනුමත කරණ ලදී.

සිංහල ව්‍යාකරණ

පද නීතිය

"සරසවි සඳරස" කතෘධුරය දැරූ
සබරගමුවේ වේරගම පුඤ්ඤබණ්ඩාර පඬිතුමන්
විසින් රචනා කරණ ලදී.
විද්‍යෝදය පරිවෙණාධීශ්වර ව සිටි පණ්ඩිත ශිරොමණි
සිප්කඩුවේ ශ්‍රී සුමංගලාභිධාන
නායක මාහිම්පාණන් වහන්සේ
විසින් පිළිගන්නා ලදි.

PADANITIYA

or

A SINHALESE GRAMMAR

by

WERAGAMA PUNCHI BANDARA

OF SABARAGAMUWA

'Editor of the "Sarasavi Sandaresa"

ප්‍රකාශනය
සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම
61, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
(මාලිගාකන්ද පාර)
මරදාන - කොළඹ 10.

ප්‍රථම මුද්‍රණය - 1988
දෙවන මුද්‍රණය - 2012

සිංහල ව්‍යාකරණ

පද නීතිය

© සමයවර්ධන පොත්හල (පෞද්ගලික) සමාගම

ISBN 978 - 955 - 570 - 658 - 2

මුද්‍රණය

සමයවර්ධන මුද්‍රණශිල්පියෝ (පෞද්ගලික) සමාගම
53, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි මාවත,
(මාලිගාකන්ද පාර)
මරදාන - කොළඹ 10.

සංඥාපනය.

ඉතා පහසුවෙන් සවල්ප කාලයකදී සැහෙන පමණ සිංහල ව්‍යාකරණ ඉගෙණගැණීමට පාඨශාලාවන්හි ව්‍යවහාර කටයුතුවූ ව්‍යාකරණ ග්‍රන්ථයක්හුගේ අවිද්‍යමාන භාවය දීර්ඝ කාලයක පටන් අපේ භාෂාවට තුබුණු මහත් පාඩුවකි.

පුරාණ භාෂාවට වඩා වර්තමාන භාෂාව බොහෝ වෙනස්ව තිබේ. මේ වෙනස් ව්‍යාකරණ ග්‍රන්ථවල අන්තගීත කිරීමද අවශ්‍ය යෙන්ම කටයුත්තක් විය.

මේතාක් ප්‍රසිද්ධ කළ කොයිම ව්‍යාකරණ ග්‍රන්ථයකවත් මතක් නොකළ ඉතා වැදගත් ව්‍යාකරණ විධි බොහොමයක් පුරාණයේ පටන් භාෂාවේ පැවත එන බව පෙණේ. ඒවා ව්‍යාකරණ ග්‍රන්ථවල අන්තර්ගත කිරීමද අවශ්‍යයෙන්ම කටයුතුව තිබේ.

ඉංග්‍රීසි පාඨශාලාවන්හි විද්‍යොද්ග්‍රහණයෙහි නියුක්ත වන සිංහල තරුණයෝ ඒ ඉගෙණීමෙන් තොර වනවිට දහඅට ඇවිරිදි විසි හැවිරිදි වයසට පැමිණියෝ වෙති. ඉක්බිති සිංහල ඉගෙණීමට දැන් තිබෙන ව්‍යාකරණ පොත් අතට ගත්කල ඒවායේ ගැඩතාවත් සංක්ෂිප්ත භාවයත් නිසා ස්වල්ප කාලයකදී පහසුවෙන් ඔවුන්ගේ අභිමතාර්ථ සාධනය කරගත නොහැකි වෙයි. එහෙයින් සිංහල ඉගෙණීම ප්‍රතික්ෂේප කර රැකිරක්ෂාවල යෙදෙති. මේ නිසා ආණ්ඩුවේ රාජකෘත්‍යයන්හි නියුක්ත වන බොහෝ අයගේ සිංහල දැනීම ඉතා පහත බස්නේය.

යථොක්ත කරුණු සියල්ලම පිරිමසන අටියෙන් බොහෝ අයගේ මතත් පරීක්ෂාකර බලා අමුතු ක්‍රමයකට මෙම ග්‍රන්ථය රචනාකරණ ලදී. මෙම ග්‍රන්ථය සිංහල පාඨශාලාවන්හි පාඨනය කරවතොත් ඉතා ස්වල්ප කාලයකදී පහසුවෙන් සිංහල ව්‍යාකරණ ශිෂ්‍යයන්ට ඉගැන්විය හැකි වෙයි. මෙය ඉංග්‍රීසි ඉගෙණ බුද්ධිමත් වූ සිංහල තරුණයන්ට ගුරූපදෙශ රහිතවම ව්‍යාකරණ අවබෝධ කරගත හැකි වනසේ ශිථීල භාෂාවෙන් ගළපන ලද්දකි.

මේ පොත මුද්‍රණය කිරීමේදී අපගේ ආචාර්‍යවූ සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගල නායක ස්ථවිරෝත්තමයාණන් විසින්ද විලියම් ප්‍රේරා රණසිංහ ශ්‍රේෂ්ඨාධිකරණ සභාවේ පෙරකදෝරු මහතා විසින්ද අන්තිම ශොද්ධ්‍ය පත්‍ර බලා පොත නිර්දෝෂයයි පිළිගැණීමෙන් ග්‍රන්ථ ගෞරවය උසුලයි.

රිචඩ් ද සිල්වා, බ්ලොක් යන ඉන්ස්පැක්ටර් මහතුන් දෙදෙනා හා අල්පේවුස් පෙරේරා ස්කෝලේ මහත්මයා සමග සාකච්ඡා කොට පාඨශාලාවට ඔබිනා ලෙස පොත පිළියෙළ කළබව මතක් කරමු.

සිංහල ව්‍යාකරණ උගත් පූර්වදිග භාෂා ඉගෙණීමට ඉතා ආශාවක් ඇති පැලහැල ජේ. සමරදිවාකර මහතා විසින් මෙබඳු පොතක් කර දීම මේ කාලයේ සිංහල ව්‍යාකරණාභිලාෂීන්ට අත්‍යන්තොපකාරීයයි නොයෙක්විට කියා අප මේ වැඩෙහි යෙදවූ බව ස්තුතියෙන් මතක් කරමු.

ලාඞ්කික ජනයෝ මාගධ සංස්කෘත උතුම්කොට සලකා ඒ භාෂාවලින්ම ආගම ශාස්ත්‍ර හදාළෝය. මේ දෙකින් එකක ව්‍යාකරණ උගත් අයට සිංහල ව්‍යාකරණ ක්‍රමය ඉබේම වාගේ වැටහේ. විස්තර වශයෙන් සිංහල ව්‍යාකරණ ග්‍රන්ථ නොකළේ මේ නිසායැයි සිතිය හැකිය. නමුත් කේවල සිංහල ව්‍යාකරණ-ඥයන්ට විස්තර ව්‍යාකරණ පොත් නොමැති බැවින් මාගධ සංස්කෘත ව්‍යාකරණයන්ට නිතරම වහල්ව සිටින්නට සිදු වී තිබේ. අපේ භාෂාවේ ව්‍යාකරණ ඉගෙන ගැනීම වෙන භාෂාවල ව්‍යාකරණයන්ට වහල් කොට හැම කල්හිම තිබීම සිංහලයන්ගේ දියුණුවට කොපමණ බාධාවක් ද? පද නීතිය නම් වූ මේ ව්‍යාකරණ ග්‍රන්ථයේ විභක්ති භේදදිය බලන විට ස්වභාෂා ව්‍යාකරණාභිලාෂීන් බොහෝදුර මේ වහල් කමින් මුදවා තිබෙන බව කාට නොහැඟේද? විශාල සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයක් කිරීමෙහි දැන් යෙදී සිටිමු. ඒ වැඩේ අපේ ප්‍රාර්ථනාව ලෙස සමාප්ත

V

වී නම් මේ දසත්වයෙන් සම්පූර්ණ ලෙසම අපේ ස්වදේශීයයන් මිදවිය හැකි වේයයි සිතමිහ.

පද නිය නමින් කළ
දුහුනන් දැනුම් සඳහා
ඉසිවත් දනන් හැර
මෙම ගත් කහට නොරිසිද

1888 ක් වූ සැප්තැම්බ්‍ර මස
30 වෙනි දින දීය.

ප්‍රකාශක නිවේදන

සිදත් සඟරාවෙන් පසු පළමු කොටම සිංහලයන්ට ලැබුණු සම්භාවනීය ව්‍යාකරණ ග්‍රන්ථය වේරගම පුංචිබණ්ඩාර පඬිතුමන් විසින් සම්පාදිත මේ පද නීතිය බැව් බොහෝ වියතුන්ගේ පිළි ගැණීම වේ. පුරා අසූ වසකටත් වැඩි කලක් ආධුනික ජනතාවට හෙළු වියරණ ඉගෙණීම පිණිස මේ පොතින් ලැබුණු උපකාර ඉතා මහත් බැව් කිය යුතු නොවේ.

පිරිවෙන්වලත් පාසැල්වලත් නිතර පරිශීලනය කරන මේ ග්‍රන්ථය විද්‍යොදය පරිවේණාධිශ්වර පණ්ඩිත ශිරොමණි හික්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක මාහිමියාණන් වහන්සේ විසින් අවසාන ශුඞ්ධි පත්‍රාවලොකනයෙන් පිළිගන්නා ලද නමුදු, 2484 දක්වා මුද්‍රිත වාර කීපයකම පිටපත්වල මුද්‍රණ දෝෂ පෙණින. විද්‍යොදය පරිවෙණාධිපතිව වැඩ විසූ පණ්ඩිතාචාය්‍ය බද්දේගම සිරි පියරතනාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ යථාවකාශ පරිද්දෙන් ඒ සදෙස් තැන් බොහොමයක් ශුද්ධ කළ බැවින් අප විසින් ප්‍රකාශිත මේ සවන මුද්‍රණය ප්‍රයෝජන ගන්නා භවතුන්ට එය් විශාල සහනයකි.

අනුක්‍රමණිකා.

මෙහි දක්වන ව්‍යාකරණ විධි මේ ග්‍රන්ථයේ විස්තරකර තිබේ.

1. අකුරු
2. ස්වර
3. ව්‍යඤ්ජනාක්ෂර
4. සංස්කෘත භාෂාවේ අකුරු
5. පාලි භාෂාවේ අකුරු
6. අමිශ්‍ර සිංහල සහ මිශ්‍ර සිංහල
7. ලොප
8. ආදෙශ
9. ආගම
10. පූර්වරූප
11. පරරූප
12. ලිත්වරූප
13. සවරවිපර්‍යාසය
14. හ්‍රස්ව දීර්ඝ
15. හකාරය - ආදෙශ හකාරය
16. ආගම හකාරය
17. ප්‍රකෘති හකාරය
18. ප්‍රාණාක්ෂරය හා හකාරය

---

19. සන්ධි
20. පූර්වස්වරලෝප සන්ධි
21. පරසවරලොප සන්ධි
22. සවර සන්ධිය
23. සවරාදෙශ සන්ධිය
24. ගාත්‍රාදෙශ සන්ධිය
25. ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය
26. ආගම සන්ධිය
27. පූර්වරූප, පරරූප, ලිත්ව රූප සන්ධි

---

28. පද
29. නාමපද
30. ආඛ්‍යාත පද
31. උපසර්ගීපද
32. නිපාතපද
33. සර්වනාම
34. ලිඞ්ග

---

35. විභක්ති
36. එකවචන බහු වචන
37. විභක්ති නාම
38. විභක්ති ප්‍රත්‍යයයෝ
39. පදසිද්ධියේ
    1. වෙන ප්‍රකාරය
40. පදසිද්ධියේ
    2. වෙනි ප්‍රකාරය
41. පදසිද්ධියේ
    3. වෙනි ප්‍රකාරය
42. ශබ්ද වරනැගීම
43. ප්‍රථමා විභක්තිය
44. කර්ම විභක්තිය
45. කර්තෘ විභක්තිය
46. කරණ විභක්තිය

47. සම්ප්‍රදන විභක්තිය
48. අවධි විභක්තිය
49. සම්බන්ධ විභක්තිය
50. ආධාර විභක්තිය
51. ආලපන විභක්තිය
52. විභක්ති භේදය
53. ධාතු හා ප්‍රත්‍යයයෝ
54. අකර්මක හා සකර්මක ධාතු
55. කාලත්‍රය හා පුරුෂත්‍රය
56. කාලත්‍රයට හා පුරුෂත්‍රයට අයිති ප්‍රත්‍යයයෝ
57. අතීතකාල ක්‍රියා
58. වර්තමානකාල ක්‍රියා
59. අනාගතකාල ක්‍රියා
60. ආශීර්වාද ක්‍රියාව
61. විධි ක්‍රියාව
62. අසම්භාවන ක්‍රියාව
63. පූර්ව්ක්‍රියාව
64. මිශ්‍රක්‍රියාව
65. ප්‍රයෝජ්‍ය ක්‍රියාව
66. උක්තකර්තෘ හා අනුක්ත කර්තෘ
67. කර්ම්ක්‍රියාව
68. ක්‍රියාමාලාව

---

69. ක්‍රියාකාරක පද සම්බන්ධය
70. විශෙෂණ විශෙෂ්‍ය
71. තද්ධිත හෙවත් (ප්‍රත්‍යයාත්මනාම
72. කිතක හෙවත් ප්‍රත්‍යයාත්මනාම
73. සමාස
74. විශෙෂණ සමාසය
75. අව්‍යයීභාව සමාසය
76. දකාරාත්ම සමාසය
77. විභක්ති සමාසය
78. අන්‍යාත්ම සමාසය

---

79. නිෂ්පන්නාදී ශබ්ද
80. වාක්‍ය විග්‍රහය
81. නිවැරදි ව්‍යවහාර
82. ණ, ළ යෙදිය යුතු විධිය
83. වැරදි පාඨ හා නිවැරදි පාඨ

උපග්‍රන්ථය.

84. ව්‍යාකරණ විධි
85. විභක්ති විධානය
86. විභක්ති ප්‍රත්‍යයයෝ
87. අවිද්‍යමාන විධිය
88. අන්‍යාත්ම සමාසය
89. අබ්භාස සංඥක පද
90. පූජ්‍යාත්මයෙහි කරණ විභක්තිය
91. මෙහි තත්ත්වය

පද නීතිය

LETTERS

අකුරු

සිතෙහි හටගන්නා අදහස් වචනයෙන් ප්‍රකාශ කරනු ලැබේ. වචන නම් ශබ්දයි. ඒ ශබ්ද හෙවත් වචන ලියන පිණිස ඒ ඒ රටවල අය විසින් කරගෙන තිබෙන ලකුණු අකුරු නම් වෙයි. සිංහල වචන හෙවත් භාෂාව ලියන පිණිස ව්‍යවහාර කරන අකුරු මෙහි පහත දක්වනු ලැබේ :-

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ

ක ග ජ, ට ඩ ණ, ත ද න, ප බ ම,

ය ර ල ව

ස හ ළ අං

මේ අකුරු සවරය ව්‍යඤ්ජනයයි දෙවැදෑරුම්. 'අ' යන්න පටන් 'ඕ' යන්න අන්ත කොට ඇති අකුරු දෙළස සවර නම්. 'ක' යන්න පටන් 'අං' යන්න කෙළවර කොට ඇති අකුරු විස්ස ව්‍යඤ්ජන නම්. සවරයන්ට පණකුරු යයිද ව්‍යඤ්ජනයන්ට ගතකුරු යයිද සිංහල ව්‍යාකරණයෙහි ව්‍යවහාර කළෝය. සවර ව්‍යඤ්ජන යන ශබ්ද දෙක සංස්කෘත භාෂාවෙහි නාමයි.

ප්‍රශ්න - වචනයෙන් ප්‍රකාශ වන්නේ කිම්ද ? අකුරුවල ප්‍රයෝජන කිම ? සිංහල භාෂාවට අයිති අකුරු කවරේද ? කීයද ? සිංහල ව්‍යාකරණයෙහි සවරයන්ට කියන නම කුමක්ද? ගතකුරුයයි සිංහල ව්‍යාකරණයේ කියන්නේ කවර අක්ෂරයන්ටද?

VOWELS
සවර

සවරයෝ නම් තනිතනිවත් ශබ්ද කළහැකි නොහොත් ශබ්ද උපදවන අක්ෂරයි.

ඔව්හු හ්‍රස්වය දීර්ඝයයි විප්‍රකාරයි. අ ඇ ඉ උ එ ඔ යන අකුරු සය හ්‍රස්ව නමි. ආ ඈ ඊ ඌ ඒ ඕ යන මේ දීර්ඝ ශබ්ද ඇති හෙවත් ඇදිලා කියවෙන අකුරු සය දීර්ඝ නමි. හ්‍රස්වාක්ෂරයන්ට ලඝුයයිද දීර්ඝාක්ෂරයන්ට ගුරුයයිද කියාත් ව්‍යවහාර වේ.

ප්‍රශ්න - සවරයෝ කී වැදෑරුම්ද ? හ්‍රස්ව සවර කවරේද? දීර්ඝ සවර කවරේද ? හ්‍රස්වාක්ෂර කියවෙන්නේ කෙලෙසද ? ගුරු ලඝු කියන්නේ කුමකටද ?

CONSONANTS
ව්‍යඤ්ජනාක්ෂර.

ව්‍යඤ්ජනාක්ෂර නම් තනියම ශබ්ද කරන්ට දුෂ්කරවූ හල් අකුරයි. එනම්, ක් ග් ජ් යනාදියයි.

සුඛොච්චාරණය (*) පිණිස අකාරයක් ව්‍යඤ්ජනාක්ෂරයන් තුළට ලා යට දක්වනලදී. හල් කයන්න ඇතුළට අයන්න ලූකල 'ක' යන ශබ්දය නැගෙයි. හෙවත් හල් කයන්න තුළට අකාරය ලූකල කයන්න නැගෙයි. ආයන්නක් හල් කයන්නට ලූ කල කා යන්න වෙයි. මෙසේ සවර දෙළස හල් කයන්නට ලූකල දෙළොස් ආකාරයකින් ශබ්ද වෙයි. හෙවත් අකුරු දෙළසක් සෑදෙයි. ඒ මෙලෙසයි:

ක් + අ == ක	ක් + උ == කු
ක් + ආ == කා	ක් + ඌ == කූ
ක් + ඇ == කැ	ක් + එ == කෙ
ක් + ඈ == කෑ	ක් + ඒ == කේ
ක් + ඉ == කි	ක් + ඔ == කොා
ක් + ඊ == කී	ක් + ඕ == කෝ

(*) සුඛ උච්චාරණය, - සුවසේ කීම.

හල් ගයන්න ඇතුළට මේ සවර ලූකලද "ග ගා ගි ගී" යනාදි වශයෙන් දෙළොස් ආකාරයකින් ශබ්ද වෙයි. සෙසු ගතකුරුවලට මේ සවර දෙළස ලූකලත් මෙසේම එක අක්ෂරය දෙළොස් ආකාරයකින් ශබ්ද වෙයි.

ප්‍ර - ව්‍යඤ්ජනාක්ෂර කෙසේවූ අකුරුද ? ව්‍යඤ්ජනාක්ෂර ඇතුළට වැටෙන්නේ කුමක්ද ? ව්‍යඤ්ජනාක්ෂර ශබ්ද කරන්ට පහසු වෙන්නේ කුමක් කළ විටද ? හල් මකාරයට ඉයන්න ලූකල කෙසේ ශබ්ද වේද ? මි, නේ, රී, ලූ, හු යන මේ අක්ෂර තුළ තිබෙන පණකුරු කවරේද ?

THE ALPHABET AS USED IN SANSKRIT
සංස්කෘත භාෂාවේ අකුරු.

අ ආ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඓ
ඔ ඕ අං අඃ
ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ,
ත ථ ද ධ න, ප ඵ බ භ ම,
ය ර ල ව ශ ෂ ස හ

ප්‍ර - සිංහල භාෂාවට නොමැතිව සංස්කෘත භාෂාවේ තිබෙන අකුරු කවරේද ? සංස්කෘත භාෂාවට නොමැතිව සිංහල භාෂාවේ තිබෙන අකුරු කවරේද ?

THE ALPHABET AS USED IN PALI
පාලි භාෂාවේ අකුරු

අ ආ ඉ ඊ උ ඌ එ ඔ*
ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ,
ත ථ ද ධ න, ප ඵ බ භ ම,
ය ර ල ව ස හ ළ අං

---

* පාලි භාෂාවෙත් සංස්කෘත භාෂාවෙහි මෙන්ම එ ඔ දෙක දීඝමයි. සංයොගයට පූර්වයෙන් සිටි කල සමහර තැන් හ්‍රස්ව වී කියවේ. 'එතථ' 'ඔඨ්‍ය' යනාදියෙන් එය දත යුතුයි. ඒ ඕ දෙක කිසි තැනක හ්‍රස්වවී කියනු ලබන හෙයින් සමහර ආචාර්‍යවරයෝ පාලියෙහි සවර දසයයි කියති.

ප්‍ර - පාලියට නොමැතිව සිංහල භාෂාවේ තිබෙන අකුරු කවරේද ? එ ඔ යන අක්ෂර දෙක සම්බන්ධව සිංහල පාලි සංස්කෘත යන භාෂා තුනේ එකිනෙකට ඇති වෙනස කිම ?

'ඩ ඤ ණ න ම' යන අක්ෂරවලින් දෙකෙන් කොටසක් 'ග ජ ඩ ද බ'යන අක්ෂර පසේ පිළිවෙළින් බැඳේ. 'ගඟ, රජන්, හඬ, සඳ, බඹ' යනාදි තැන්වල එසේ බැඳී තිබේ. මේක පාලි සංස්කෘත දෙභාෂාවටම නැති සවභාවයකි. ඒ භාෂාවල බැඳෙන්නේ 'ඔක' 'ඤ්ජ' යනාදී වශයෙන් සම්පූර්ණයෙන්ම වර්ගාන්තාක්ෂරයි. ඔකාරය අමිශ්‍ර සිංහල භාෂාවට නොමැති බැවින් 'ගඟ' 'ඇඟ' යනාදි තැන්වල ගයන්නේ බැඳෙන්නේ බින්දු අර්ධයයි සලකනලදී.

PURE AND MIXED SINHALESE
අමිශ්‍ර සිංහල සහ මිශ්‍ර සිංහල.

සිංහල මිශ්‍ර අමිශ්‍රයයි දෙවැදෑරුම්. මාගධ සංස්කෘත වචන හා මිශ්‍ර නුවූ භාෂාව අමිශ්‍ර සිංහලයි. හෙවත් ශුද්ධ සිංහලයි. ශුද්ධ සිංහල ලියනකල යට දැක්වූ සිංහල අකුරු පමණක් යෙදේ. මාගධ සංස්කෘත යන භාෂාවල වචන අතරතුර වැටී මිශ්‍රවූ භාෂාව මිශ්‍ර සිංහලයි. *මිශ්‍ර සිංහල ලියනකල සංස්කෘත මාගධ භාෂාවලට අයත් (ශුද්ධ සිංහලට නොමැති) අක්ෂරත් යෙදේ. එබැවින් මාගධ සංස්කෘත යන උභය භාෂාවටම අයිති අක්ෂරද යට දැක්වීමු.

"මම බණ අසමි" 'හරක් ගොයම් කෑවෝ' මේ පාඨ දෙකම අමිශ්‍ර සිංහලයි. එබැවින් මේ දෙක ශුද්ධ සිංහලට අයිති අක්ෂරයන්ගෙන්ම සමන්විත විය.

'මම ධර්ම්ශ්‍රවණය කෙළෙමි' 'ඔව්හු මෘගයන් සමානයි.' මේ පාඨ දෙක අතරේ 'ධර්ම්ශ්‍රවණ' 'මෘග'යන සංස්කෘත වචන යෙදුනේයි. එබැවින් මේ මිශ්‍ර සිංහලයි. ශුද්ධ සිංහලට නොමැති 'ධ, ර්, ශ්‍ර, මෘ' යන සංස්කෘත භාෂාවේ අක්ෂරද මෙහි යෙදී තිබේ.

---

* දෙමළ, ඉංග්‍රීසි ආදී භාෂාවන්හි වචනද සිංහලට මිශ්‍රව තිබෙන බව සැලකිය යුතුයි.

කව්සිළුමිණ, මුවදෙව්දව, සියබස්ලකර යනාදී ගී පොත්ද; කව්සේකරය, ගුත්තිලය, සැළලිහිණි අස්න ආදී කව් පොත්ද, අමිශ්‍ර සිංහල භාෂාවෙන් කළෝය. වර්තමාන කාව්‍ය බන්ධනයද ශුද්ධ සිංහල භාෂාවෙන් කරති. ජාතක පොත, මහාවංශය, අමාවතුර, සද්ධර්මරත්නාවලිය යනාදි වාසගම් පොත් මිශ්‍ර සිංහල භාෂාවෙන් කළෝය. ප්‍රවෘත්ති පත්‍රද කථා ව්‍යවහාරයද මිශ්‍ර සිංහල භාෂාවෙන් කරණු ලැබේ. අමිශ්‍ර භාෂාවට වඩා මිශ්‍ර භාෂාව සුඛාවබොධයි.

ප්‍ර - සිංහල භාෂාව මිශ්‍රවූයේ කවර භාෂා සමගද ? අමිශ්‍ර භාෂාවට අයත් අක්ෂර කොතැන දක්වන ලදද ? සංස්කෘත මාගධ භාෂාවල අක්ෂර මෙහි කුමට දක්වන ලදද ? කථා ව්‍යවහාරය පවත්නේ මිශ්‍ර භාෂාවෙන්ද ? නොහොත් අමිශ්‍ර භාෂාවෙන්ද ? පක්ෂි සිටිති, කුරුල්ලෝ ඉගුලුනෝ, මෙයින් අමිශ්‍ර සිංහල පාඨය කවරේද ? මිශ්‍ර සිංහල කවර පොත්වල ලියා තිබේද ? කාව්‍ය බන්ධනය හා කථා ව්‍යවහාරයත් මිශ්‍ර භාෂාවෙන් පවතීද ? නොහොත් අමිශ්‍ර භාෂාවෙන්ද ? ජාතක පොත කොයි සිංහලෙන් ලියා තිබේද ?

ELISION

ලෝපය

ලෝපය නම් වචනවල අකුරු මකා දැමීමයි. හෙවත් අකුරු නොකියා හැරීමයි.

දහයහමාර යන වචනය :-

දහයමාර කියා ව්‍යවහාර කෙරෙති. මෙහි හමාර යන ශබ්දයේ තුබුන හකාරය මැකුනු බව හෙවත් නොකියා හැරිය බව පෙණේ. මෙසේ යම් යම් වචනවල පූර්වයෙන් පැවැති අකුරු කලකදී නොකියා හැරීම ලෝපයයි දතයුතුයි.

'රජහුගේ පිරිස්' යනු 'රජපිරිස්' යයි කියති. මෙහි 'හුගේ' යන අකුරු දෙක ලොප් විය. 'උඩ අල' යනු 'උඩල' කියා ව්‍යවහාර කෙරෙති. මෙහි අකාරය ලොප්වූ බව පෙණේ.

වචනවල මුල මැද අග යන කොයි තැන පිහිටි අකුරුත් ලොප් වේ: මෙසේ ලොප්වීමෙන් අර්ථ වෙනස් නොවේ. දහය හමාර යන්නෙන්ද දහයමාර යන වචනයෙන්ද එකම අර්ථය ප්‍රකාශ වෙයි.

ප්‍ර - ලෝපය යනු කුමක්ද ? කොතැන තිබෙන අකුරු ලොප් වේද ? ලොප්වීමෙන් අර්ථය වෙනස් වේද? රටල, පුරඟන, බේත්, දෙළහමාර යන මේ වචනවල ලොප් වූයේ කවර අකුරුද?

SUBSTITUTION

ආදේශය.

ආදේශය නම් යම් වචනයක තිබෙන අක්ෂරයක් ලොප්වී ඒ අක්ෂරය වෙනුවට අමුතු අක්ෂරයක් වැටීමයි.

මුනුබුරා යන වචනය :-

මුනුපුරා කියා ව්‍යවහාර කෙරෙති. මෙහි මුනුබුරා යන්නේ බයන්න මැකී ඒ වෙනුවට පයන්න ව්‍යවහාර වන බව පෙණේ. මෙසේ යම් වචනයක පළමුවෙන් තුබුන අක්ෂරය ලොප් වී ඒ වෙනුවට අමුතු අක්ෂර ව්‍යවහාර වීම ආදේශයයි දතයුතු. 'මාවීකල' යනු 'මාවීයල' යයි ව්‍යවහාර කෙරෙති. මෙහි කයන්නට යයන්න ආදේශ විය. 'සකුරු' යනු 'හකුරු' කියා ව්‍යවහාර කෙරෙති. මෙහි සයන්නට හයන්න ආදේශ විය.

මුනුබුරා, මුනුපුරා යන දෙකම එක අර්ථයි. එබැවින් යම් වචනයක තිබුන අකුරක් මැකී ඊට අමුතු අකුරක් ආදේශ වීමෙන් අර්ථ වෙනස් නොවෙයි. ආදේශය වචනයක කොතැන තිබෙන අකුරකටත් වෙයි.

ප්‍ර - ආදේශය යනු කවරේද ? ආදේශයෙත් ලෝපයෙත් ඇති වෙනස කිම ? ආදේශයක් වූවිට වචනයේ අර්ථ වෙනස් වේද ? නමය, දෙළහ, නිමණ, දික්ලීය යන මේ වචනවල කවර අකුරු ආදේශවීද ?

AUGMENT

ආගම.

ආගම නම් ශබ්දයකට අමුතු ව්‍යඤ්ජනාක්ෂරයක් එකතු වීමයි. හෙවත් සවරයකට අමුතු ව්‍යඤ්ජනාක්ෂරයක් වැටීමයි.

දම යන වචනය :-

දහම කියා ව්‍යවහාර කෙරෙති. මෙහි දම යන වචනයට අමුතු හකාරයක් පසුව එකතුවූ බව පෙණේ. මෙසේ යම් වචනයකට මුලින් නොතිබුණු අක්ෂරයක් නැවත පැමිණීම ආගමයි දතයුතු.

නො එක් යන වචනය :-

නොයෙක් කියා ව්‍යවහාර කෙරෙති. මෙහි නො එක් යන වචනයේ මුලින් නොතිබුන යයන්නක් එයන්න උඩට වැටී තිබේ. 'දවල්' යනු 'දහවල්' යයි ව්‍යවහාර කරති. මෙහි අමුතු හකාරයක් ආගම විය. 'ඒ ආකාර' යනු 'එයාකාර' යයි ව්‍යවහාර කෙරේති. මෙහිද යකාරයක් ආගම වී තිබේ.

අක්ෂර ආගම වීමෙන් අර්ථ වෙනස් නොවේ. පූර්ව රූපාදිය වීමෙන්ද වචනාර්ථ වෙනස් නොවන බව සැලකිය යුතුයි.

ප්‍ර - ආගම යනු කවරේද ? ලෝප ආදේශ දෙකට වඩා ආගමේ ඇති වෙනස කවරේද ? ගෙවුයන්, මෙයාකාර දෙයක්, දූවිලි යන මේ වචනවලට ආගම වී තිබෙන අකුරු කවරේද ?

SUBSTITUTION OF THE FINAL CONSONANT FOR THE INITIAL OF A WORD WHEN BROUGHT INTO CONTACT

පූර්වරූප.

මුලින් තිබෙන ව්‍යඤ්ජනාක්ෂරයේ රූපය ඊළඟ තිබෙන ව්‍යඤ්ජනාක්ෂරයටත් වීම පූර්වරූප නම්.

සිත්කරු යන වචනය :-

සිත්තරු කියා ව්‍යවහාර කෙරෙති. මෙහි සිත් යන වචනයේ පිහිටි තයන්නේ රූපයම ඊළඟ තිබෙන කරු යන්නේ කකාරයට වූ බව පෙනේ. මෙසේ මුලින් තිබෙන අක්ෂරයේ

රූපයම ඊළඟ තිබෙන අක්ෂරයටත් වීම පූර්වරූපයයි දතයුතු. පූර්වරූව වීමේදී මුලින් තිබෙන අක්ෂරයේ රූපය පරකුරට ආදෙශ වන බව පෙනේ. 'පෙන්වති' යනු 'පෙන්නති' කියා ව්‍යවහාර වේ. මෙහි මුලින් තුබුන නකාරයේ රූපය ඊළඟ පරව තිබෙන වකාරයට වූ බව පෙනේ. 'ගෙත්කම්' යනු 'ගෙත්තම්' කියා ව්‍යවහාර වේ. මෙහි පූර්වයෙන් තිබෙන තකාරයේ රූපය ඊළඟ තුබුන කකාරයට වූබව පෙනේ.

ප්‍ර - පූර්වරූප යනු කවරේද ? එය වෙන්නේ කෙලෙසද ? කම්මල, රඹුක්කන, කුරුල්ලන්නේ, දෙවියන්නේ යන මේ ශබ්දවල කවර අක්ෂරයන්ට කවර අක්ෂරයන්ගේ රූප වීද ?

THE SUBSTITUTION OF THE INITIAL CONSONANT FOR THE FINAL

පරරූප

එක තැන තිබෙන අකුරු දෙකින් අගින් තිබෙන අක්ෂරයේ රූපය ඊළඟ මුලින් තිබෙන අක්ෂරයට වීම **පරරූප** නම්.

සත්දවස යන වචනය :-

සද්දවස යයි ව්‍යවහාර කෙරෙති. මෙහි දවස යන වචනයේ දයන්නේ රූපය ඊළඟ ඉහළින් තුබුන තයන්නට වූ බව පෙනේ. මෙසේ අගින් තිබෙන අක්ෂරයේ රූපය ඊළඟ ඉහළින් තිබෙන අකුරට ආදෙශ වීම පරරූපයයි සැලකිය යුතුයි. 'දුක්පත්' යනු 'දුප්පත්' කියා ව්‍යවහාර කෙරෙති. මෙහි පයන්නේ රූපය ඊළඟ ඉහළින් තුබුන කයන්නට වූබව පෙණේ. 'ගප්සාවීම' යනු 'ගස්සාවීම' කියා ව්‍යවහාර වේ. මෙහිද අගින් තිබෙන සයන්නේ රූපය ඊළඟ ඉහළින් තුබුන පයන්නට වූබව පෙණේ.

ප්‍ර - පරරූප යනු කවරේද ? පූර්වරූපයෙත් පරරූපයෙත් එකකට එකක ඇති වෙනස කිම ? දුක්ගෙණ, බද්දෙන, ගොප්පන් යන මේ වචනවල කවර අක්ෂරවලට කවර අකුරුවල රූප වීද ?

REDUPLICATION
ද්විත්වරූපය.

ශබ්දයක එක ව්‍යඤ්ජනාක්ෂරයක් දෙක වීම ද්විත්වරූප නමි.

ගත්දෙය යන වචනය :-

ගත්ත දෙය කියා ව්‍යවහාර වේ. මෙහි තයන්න දෙක වූ බව පෙණේ. මෙසේ යම් ව්‍යඤ්ජනාක්ෂරයක් දෙක වීම ද්විත්වරූපයි දතයුතුයි. 'දුන්දෙය' යනු 'දුන්න දෙය' කියා ව්‍යවහාරවේ. මෙහි නයන්නදෙක වූ බව පෙණේ. 'ගුරුළුකෙත' යනු 'ගුරුල්ල කෙත' කියා වේ. මෙහි ලයන්න දෙක වූ බව පෙණේ.*

ප්‍ර - ද්විත්වරූපය යනු කිම ? ද්විත්ව වෙන්නේ සවරද ? ව්‍යඤ්ජනද ? පූර්වරූපයෙත් ද්විත්වරූපයෙත් ඇති වෙනස කිම ? වල්ල, බද්ද, පස්ස, පිත්ත, බට්ට යන මේ වචනවල කවර අක්ෂර ද්විත්ව වීද ? මෙහි මුල් ශබ්ද කවරේද ?

VOWEL CHANGES
ස්වර විපර්‍යාසය.

යම් වචනයක තිබෙන සවරයක් හෙවත් ප්‍රාණාක්ෂරයක් වෙනින් ප්‍රාණාක්ෂරයක් වීම සවර විපර්‍යාස නමි. මීට පිළි පෙරළියයි කියති.

උගෙණ යන වචනය :-

ඉගෙණ කියා ව්‍යවහාර වෙයි. මෙහි උපකාරය විපර්‍යාස වී හෙවත් පෙරළී ඉකාරය වූ බව පෙනේ.

විහාර යන වචනය :-

වෙහෙර කියා ව්‍යවහාර කෙරෙති. මෙහි වියන්නේ තුබුන ඉයන්නත් හායන්නේ තුබුන ආයන්නත් එයන්න වූබව පෙනේ. මෙසේ යම් වචනයක තුබුන ප්‍රාණාක්ෂර පසුව අමුතු ප්‍රාණාක්ෂරවලට පෙරළීම සවර විපර්‍යාසයයි දත යුතුයි. 'පබලු'යනු 'පබුලු' කියා ව්‍යවහාර කෙරෙති. මෙහි බයන්නේ තුබුන අයන්න උයන්න වූබව පෙනේ.

---

* ගුරුළු යන්නේ උකාරය ලොප් වේ. එවිට ගුරුල් කියා වේ. පසුව ද්විත්ව වීමෙන් ගුරුල්ල කියා වෙයි.

ප්‍ර - සවර විපර්‍යයාසය යනු කවරේද ? මීට වෙන කියන නම් කවරේද ? උතුරුදිග, දකුණුදිග, අතුර, හාමුදුරුවෝ යන මේ වචනවල වී තිබෙන පිළි විපර්‍යාස කවරේද ?

හ්‍රසව දීඝී.

ශබ්දවල දීඝීසවර ලුහුඬු කොට කීම හ්‍රසව නම් වේ. මීට මාත්‍රාහාණියයිද කියති. හ්‍රස්ව ස්වර දීඝී කොට කීම දීඝී නම් වේ. මීට මාත්‍රාවෘඩියයිද කියති. 'ගේ' යන ශබ්දය දීඝී නමුත් 'ගෙට' යයි හ්‍රසව කොට කියති. 'පෙල' යන ශබ්දයේ පෙයන්න 'පේලි' කියා දීඝී කොට කියති. මෙසේ ශබ්දවල හ්‍රසව අක්ෂර ඇතැම් තැන දීඝී කොටද ඇතැම් තැන දීඝීාක්ෂර හ්‍රසව කොටද ව්‍යවහාර කෙරෙති.

ප්‍ර - බෝපෙට, පොළොව, මූද, පෙණෙන දෙය යන මේ ශබ්දවල කවර අක්ෂර හ්‍රසව වීද ? කවර අක්ෂර දීඝී වීද ?

ලොප ආදෙශ ආදි ව්‍යාකරණ විධි කීපයක්ද සමහර ශබ්දවල පෙණේ. ඖෂධයට 'බෙහෙද' යයි පුරාණ සිංහල භාෂාවේ ව්‍යවහාර විය. වර්තමාන භාෂාවේ 'බෙහෙත්' කියාද 'බේත්' කියාද ව්‍යවහාර වේ. 'බෙහෙද' යන්නේ දකාරයට තකරාදෙශ වූකල 'බෙහෙත්' කියා පදය සෑදේ. නැවත හකාරය ලොප් වී බෙයන්න තුළ තිබෙන එයන්න දීඝී වූකල බේත් කියා පදය සෑදේ. මෙසේ බෙහෙදයයි පුරාණ භාෂාවේ පැවැති වචනය වර්තමාන කාලයේ බේත් කියා සිඬවීමට ලොප ආදෙශ දීඝී යන ව්‍යාකරණ විධි තුනක් විය.

'ගබ්සා' යයි පුරාණ ව්‍යවහාරවූ ශබ්දය වර්තමානයේ 'ගස්සා' යයි ව්‍යවහාර කෙරෙති. 'ගබ්සා' යන්නේ බකාරයට පයන්න ආදෙශ වූ කල 'ගප්සා' කියා පදසිඬිය වේ. මෙසේ 'ගබ්සා' යන පුරාණ සිංහල වචනය 'ගස්සා' කියා සිඬවීමට ආදෙශ පරරූප යන ව්‍යාකරණ විධි දෙකක් විය.

'සුමුටාන' යන්නෙහි සකාරයට හකාරයද මකාරයට බකාරයද ආදෙශ වී නැවත ඒ ආදෙශවූ හකාරයේ උකාරයට

පිළිපෙරළි වූකල 'හිඹුටාන' කියා පදසිඬිය වේ. මේ පදය සිඬවීමට ආදෙශ සවර විපයය්‍යාස යන ව්‍යාකරණ විධි දෙකක් විය.

'අරුමයක්සේ' යන්න 'අරුමැක්කේ' යයි ව්‍යවහාර වේ. 'අරුමයක්සේ' යන වචනයේ යකාරය ලොප් වී සකාරයට පූර්ව රූප වී මකාරයට සවර විපයය්‍යාස වූ කල "අරුමැක්කේ" කියා පදසිඬිය වෙයි. මෙසේ පදසිඬිය වීමට ලෝපය පූර්ව රූපය සවර විපයය්‍යාසය යන ව්‍යාකරණ විධි තුණක් විය.

පුරාණ සිංහල වචන කලින්කල මෙසේ නොයෙක් ලෙස වෙනස් වෙන බැවින් ඒ වෙනස් මෙසේ වීයයි පදසිඬිය දැන ගැනීමටත් ව්‍යවහාරයට අනුකූල ලෙස අභිමත පදයක් සාධනය කරගැණීමටත් ලොප ආදෙශාදි ව්‍යාකරණ විධි පැහැදිලි ලෙස දැනගෙණ තිබිය යුතුයි.

හකාරය

සිංහල භාෂාවේ හකාරය තුන් පරිද්දෙකින් ව්‍යවහාර වේ. සමහර ශබ්දවල සකාරයට හකාරය ආදෙශ වේ. ඇතැම් ශබ්දවල අමුතුවෙන්ම හකාරය ආගම වී තිබේ. ඇතැම් ශබ්දවල සවභාවයෙන්ම හකාරය පිහිටා තිබේ. ඊට ප්‍රකෘති හකාරයයි කියති. මෙසේ සිංහල භාෂාවෙ හකාරය ආදෙශ, ආගම, ප්‍රකෘති යයි තුන් වැදෑරුම්.

ප්‍ර - සිංහල භාෂාවේ හකාරය කී වැදෑරුම්ද ? ඊට කියන නම් කවරේද ?

ආදෙශ හකාරය

ආදේශ හකාරය නම් සකාරයට ආදේශවූ හකාරයයි. බොහෝ වචනවල සකාරය මැකී ඒ වෙනුවට හකාරය ව්‍යවහාර වීම සිංහල භාෂාවේ සවභාවයකි. 'කෙසෙල්' යනු 'කෙහෙල්' කියා ව්‍යවහාර වේ. මෙහි සකාරයට හකාරය ආදේශ විය. 'සතර' යනු 'හතර' යයි ව්‍යවහාර වේ. මෙහිද හකාරය ආදේශ විය.

ප්‍ර - ආදේශ හකාරය යනු කවරේද ? පහ, බැහැර, මහත්, පහුර යන මේ වචනවලින් කවර වචනවල ආදේශ හකාරය තිබේද ?

ආගම හකාරය.

වචනයක තිබෙන අකුරක් වෙනුවට නොව අමුතුවෙන් වැටෙන හකාරය ආගම හකාරයයි. 'සිඳුඅත්' යනු 'සිඳුහත්' කියා වේ.

'උඩුමාල්' යන්නට හකාරය ආගම වී 'උඩුමහල්' කියා වේ. මෙසේ ආගම වන හකාරය ආගම හකාරයයි.

ප්‍ර - ආගම හකාරය යනු කුමක්ද ? හුණරොගය, කොහොඹ, මේ ශබ්ද දෙකින් කොයි ශබ්දයේ ආගම හකාරය තිබේද ?.

ප්‍රකෘති හකාරය.

ප්‍රකෘති හකාරය නම් සවභාවයෙන්ම තිබෙන හකාරයයි. බොහොම, පහර, වෙහෙර යනාදි ශබ්දවල තිබෙන හකාරය අමුතුවෙන් ආදෙශව හෝ ආගමව පැමිණි හකාරයක් නොව සවභාවයෙන් පිහිටි හකාරයයි. මෙබඳු හකාර ප්‍රකෘති හකාර නමි.

ප්‍ර - ප්‍රකෘති හකාරය යනු කුමක්ද ? පෙළහර, ගහ, පුහුල, හැරගෙණ, එහෙයින්, මේ ශබ්දවල තිබෙන හකාර කවරේද ?.

ප්‍රාණාක්ෂරය හා හකාරය.

සමහර වචනවල හකාරය ලොප්ව ප්‍රාණාක්ෂරය ඉතිරි වේ. 'හිඟුරු' යනු 'ඉඟුරු'කියා ව්‍යවහාර වේ. මෙහි හකාරය ලොප් වී එහි තිබෙන ඉකාරය ඉතිරි වූ බව පෙණේ.

ප්‍ර - හකාරය ලොප් වී ඉතිරි වන්නේ කුමක්ද ?. ඉස, ඇම, කල, අගුළ මේ වචනවල ප්‍රාණාක්ෂර ඉතිරි වෙන්ට මත්තෙන් හකාරය සහිතව තිබුන ශබ්ද කවරේද ?

සකාරයට හකාරය ආදෙශ වී ඉතා බොහෝ තැන්වල ව්‍යවහාර වන බව පෙණේ. නමුත් ඇතැම් වචනවල සකාරයට හකාරය ආදෙශ වීම නුසුදුසු බවද පෙණේ. 'මසුරා' යනු 'මහුරා' කියා හකාරාදෙශ වුවහොත් ආශොභනයි. 'අසුරා' යනු 'අහුරා' කියා හකාරාදෙශ වුවහොත් විරුඬාථී හැඟේ. බොහෝ සෙයින් සකාරයට හකාරය ආදෙශ

වෙතත් ඇතැම් තැන්වල සකාරයට හකාරය ආදෙශ වීම ආශොභනයි. නොහොත් එයින් විරුඬත්ථ හැඟෙයි. ඒ නිසා පණ්ඩිත ව්‍යවහාරයට අනුව හකාරය ආදෙශ කටයුතුයි.

"බෙහෙත්" ශබ්දය "බේත්" යයි ව්‍යවහාර කෙරෙති. පහර යන ශබ්දය 'පාර' යයි ව්‍යවහාර කෙරෙති. එහෙයින් 'බෙහෙත්' 'පහර' යන දෙතැන තිබෙන හකාරය 'බේත්' 'පාර' යන ශබ්ද දෙකට ආගම වීයයි සිතෙයි. ඒ එසේ නොවෙයි. 'බෙහෙත්' ශබ්දය 'බෙහෙත්' යන්නේ සකාරයට හකාරාදෙශ වීමෙන් සිඬයි. 'පහර' යනු ප්‍රහාර යන සංසකෘත වචනයෙන් හෝ 'පහර' යන මාගධ වචනයෙන් සිංහලට බිදී අවුත් තිබෙන බැවින් එහි තිබෙන හකාරය ප්‍රකෘති හකාරයයි. මෙසේ ආදෙශ ප්‍රකෘති හකාරයන්ට ආගම හකාර යයි කියා රැවටෙන්නට පුළුවන් බැවින් මුල් ශබ්දය පරීක්ෂාකර බලා හකාරයන් විනිශ්චය කිරීමට උත්සාහ කටයුතුයි.

යම් ශබ්දයකට හකාරයක් ආගම වී නම් ඒ හකාරයට පෙරටුව තිබෙන දීඝස්වරය ලුහුඬු වේ. මාල් ශබ්දයට හකාරාගම වී මහල් කියා පදය සෑදෙන විට මා යන්න හ්‍රස්ව විය. මෙසේම යම් ශබ්දයක හකාරයක් ලොප් වූවිටද ඒ හකාරයට පෙරටු ලුහුඬු ස්වරය දීඝ වේ. 'මහතොට' යන වචනයේ හකාරය ලොප් වූවිට 'මාතොට' කියා මකාරයේ පිහිටි හ්‍රස්ව අකාරය දීඝ විය.

සකාරය හකාරය ආදෙශ වනු මිස හකාරයට සකාරය ආදෙශ වීමක් නොමැතියි. නමුත් 'බොහෝ' යයි ලිය යුතු තැන 'බොසෝ' කියා හකාරයට සකාරාදෙශ කර ව්‍යවහාර කෙරෙති. මේ ව්‍යවහාරය වැරදි ව්‍යවහාරයකි.

පද නීතියෙහි අක්ෂර භෙදධිකාරය මෙතෙකින් නිමි.

COMBINATION OF LETTERS
සන්ධි.

සන්ධිය නම් වෙන් වෙන්ව තිබෙන ශබ්ද දෙකක් හෙවත් අක්ෂර දෙකක් ලෝපාදියෙන් එකට ගැළපීමයි.

උඩ ඕවිට යන වෙන් වෙන්ව තිබෙන ශබ්ද දෙක උඩෝවිට කියා සන්ධි වේ. උඩ යන ශබ්දයෙහි ඩයන්නේ තිබෙන අයන්න ලොප් කළ විට 'උඩ්' කියාවේ. 'ඕවිට' යන ශබ්දයේ ඕයන්න හල් ඩයන්නට ආරූඪ කළ විට 'උඩෝවිට' කියා සන්ධි වෙයි.

ලී කැබලි දෙකක් හන්දි කරන්නට මත්තෙන් වෙන් වෙන්ව තිබෙතත් හන්දි කළ විට එක ලීයක් වැනි වෙයි. එසේම වෙන්ව තිබෙන ශබ්ද දෙකක් හන්දි කළ විටද එක ශබ්දයක්ව කියවෙයි. 'උඩ ඕවිට' කියා සන්ධි වෙන්ට ප්‍රථම ශබ්ද දෙක වෙන්ව තිබෙතත් 'උඩෝවිට' කියා සන්ධි කළ විට එකම ශබ්දයක් ලෙස කියවේ. මෙසේ වෙන් වී තිබෙන ශබ්ද අක්ෂර ලොප් කිරීම් ආදියෙන් එකට ගැළපීම සන්ධියයි දතයුතු.

ප්‍ර - සන්ධි යනු කුමක්ද? සන්ධි කරණ විට අක්ෂරයන්ට කුමක් වේද ? 'උඩෝවිට' යන වචනය සන්ධි වූයේ කෙලෙසද ? සන්ධි වීමෙන් වචනවලට වන වෙනස කුමක්ද ? සන්ධි කුමක් වැනිද ?

පූර්ණස්වරලෝප සන්ධිය.

සන්ධි වන වචන දෙකින් මුලින් තිබෙන වචනයේ අග සවරය ලොප් කොට ගළපන සන්ධි පූර්ණස්වරලෝප සන්ධි නමි.

පූර්ණස්වරය නම් සන්ධි වන ශබ්ද දෙකින් මුල ශබ්දයේ අග සවරයයි. අග වචනයේ මුල පිහිටි සවරය පරසවරයයි.

'වට ඕවිට' යනු-

'වටෝවිට' කියා සන්ධි වේ. මෙහි වට යන මුලින් තිබෙන ශබ්දයේ අග ටකාරයේ අයන්න පූර්ණස්වරයයි. එය ලොප්

කොට හෙවත් මකා ඔව්ට යන වචනයේ මුල තිබෙන සවරය හෙවත් ඕයන්න හල් ටයන්න ලූකල 'වටෝව්ට' කියා සන්ධි වෙයි. මෙසේ මුලින් පවත්නා වචනයේ අග සවරය ලොප් කොට ගළපන සන්ධි පූර්වසවර ලොප සන්ධි නමි. යට දැක්වූ උඩෝව්ට යනුද පූර්වසවර ලෝප සන්ධියකි.

ප්‍ර - පූර්වසවරලෝප සන්ධිය යනු කුමක්ද ? පූර්වසවරය කුමක්ද ? පරසවරය කියන්නේ කුමටද ? 'වටෝව්ට' යන්න සන්ධි වූයේ කෙලෙසද ? යනෙන, ගෙණෙන, මේ වචන සන්ධි වූයේ කෙලෙසද ? උෆරු අල, හිඟුරු අල මේ වචන සන්ධි කරන්නේ කෙලෙසද ? ගෙණ ආ දේ යන්න සන්ධි කළ විට කෙසේ කියවේද ?

පරසවරලෝප සන්ධිය

සන්ධි වන ශබ්ද දෙකින් අග වචනයේ මුල සවරය ලොප් වී වන සන්ධිය පරසවරලෝප සන්ධිය නමි.

උඩ එලිපත යනු-

'උඩලිපත' කියා සන්ධි වේ. මෙහි එලිපත යන වචනයේ මුල සවරයවූ එයන්න පරසවරයයි. එය ලොප් කළ විට උඩලිපත කියා සන්ධිය ගැළපේ.

ප්‍ර - පරසවරලෝප සන්ධිය යනු කුමක්ද ? සන්ධි වන වචන දෙකින් ලොප් වන්නේ කුමන අක්ෂරයක්ද ? රජතුමා, මැතිතුමා යන සන්ධි වුනේ කෙලෙසද ? පූර්වසවරයලොප සන්ධියෙත් පරසවරලොප සන්ධියෙත් එකිනෙකට ඇති වෙනස කිම ?

සවර සන්ධිය.

සන්ධි වන ශබ්ද දෙක අතුරෙන් මුල් වචනයේ අග හල් අක්ෂරයට අග ශබ්දයේ මුල සවරය ආරූඪවීමෙන් ගැළපෙන සන්ධිය සවර සන්ධි නමි.

නිල් උපුල් යන ශබ්ද දෙක-

'නිලුපුල්' කියා සන්ධි වේ. නිල් උපුල් යන ශබ්ද දෙකින් නිල් යන ශබ්දයේ අග හල් ලකාරයට උපුල් යන ශබ්දයේ සවරය ගැලපූ කල 'නිලුපුල්' කියා සන්ධි වෙයි. මෙහි සවර ලෝපයක් නොමැතියි.

ප්‍ර - සවර සන්ධි යනු කුමක්ද? නිලුපුල් යන්න විසන්ධිවූ කල* කෙලෙසද? මෙහි ආරූඪවූ සවරය කුමක්ද? පූර්වයෙන් කී සන්ධිවලට වඩා මේ සන්ධියේ ඇති වෙනස කිම? රතුපුල්, දෙවිඳු මේ ශබ්ද දෙක සන්ධි වූයේ කෙලෙසද? නරන්, ඉඳු, මේ ශබ්ද දෙක සන්ධි කරන්නේ කෙලෙසද?

සවරාදේශ සන්ධිය.

සවරයකට අන්‍ය සවරයක් ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය සවරාදේශ සන්ධි නම්.

මහ ඉසුරු යනු-

මෙහෙසුරු කියා සන්ධි වේ. මෙහි මහ යන මුලින් තිබෙන ශබ්දයේ අග හකාරයේ පිහිටි 'අ' යන්නද අග ශබ්දයේ 'ඉ' යන්නද යන ('අඉ') සවර දෙකම ලොප් වේ. ඉන් පසු 'එ' යන්නක් ආදේශ වේ. අල් හකාරය 'එ' යන්නට පැමිණවීමද පිළිපෙරළිද කළ කල්හි මෙහෙසුරු කියා සන්ධි වෙයි.

මෙසේම 'මහ උදර' යන තන්හිද 'ලඹ උදර' යන තන්හිද 'ඔ, ඕ' යන සවරයන් ආදෙශ කිරීමෙන් සහ දකාර ලොපයෙන් 'මොහොර' කියාද 'ලඹෝරා' කියාද සන්ධි වෙත්. මේ ආදෙශය සංස්කෘත ව්‍යාකරණයේ ගුණ විධියට සමාන වේ.

ප්‍ර - සවරාදෙශ සන්ධි යනු කුමක්ද? 'මෙහෙසුරු' යන්නේ එයන්න කොයින් ලැබුනේද? 'තඹරොරේ' යන්න සන්ධි වූයේ කෙලෙසද? 'දම් උදර' යන්න සන්ධි වන්නේ කෙලෙසද?

---

* සන්ධි නුවූ විට.

ගාත්‍රාදේශ සන්ධිය.

ගාත්‍රාක්ෂරයකට අන්‍ය ගාත්‍රාක්ෂරයක් ආදේශ වීමෙන් ගැළපෙන සන්ධිය ගාත්‍රාදෙශ සන්ධි නම්.

අත කරු යනු-

අත්වරු කියා සන්ධි වේ. මෙහි පර ගාත්‍රාක්ෂරයවූ 'කරු' යන්නේ මුල පිහිටි කකාරයට වකාරාදෙශ කළ කල්හි 'අත්වරු' කියා සන්ධිය සෑදෙයි.

'ගිනි කම්' යන තන්හි පර ගාත්‍රාක්ෂරයවූ කකාරයට යකාරාදෙශ කළ කල්හි 'ගිනියම්' කියා සන්ධිය සෑදෙයි. 'කබ පිල්' යන තන්හි පූර්‍ව ගාත්‍රාක්ෂරයවූ බකාරයේ පිහිටි සවරය ලොප් කොට හල් බකාරයට 'ප' යන්නක් ආදේශ කළ කල්හි 'කප්පිල්' කියා සෑදෙයි.

'බුදු සරණ' යන තන්හි පූර්‍ව ගාත්‍රාක්ෂරයවූ හල් දකාරයට 'ත' යන්නක් ආදෙශ කළ කල්හි 'බුත්සරණ' කියා සන්ධිය සෑදෙයි.

ප්‍ර - ගාත්‍රාදේශ සන්ධි යනු කුමක්ද? අත්වරු යන්නේ වකාරය කොයින් ලැබුනේද? මහණුවම යන්න සන්ධි වූයේ කෙලෙසද? හෙප්තොට, සුත්බත් මේවා සන්ධි වන්නේ කෙසේද?

ගාත්‍රාක්ෂරලෝප සන්ධිය.

ගාත්‍රාක්ෂරයක් ලොප් කොට ඒ ගාත්‍රාක්ෂරය හා සංයුකතවූ ඌනමාත්‍ර බින්දුවට හෝ ඌනමාත්‍ර මකාරයට මාත්‍රාංශවෘඩි කිරීමෙන් ගළපන සන්ධිය ගාත්‍රාක්ෂරලෝප සන්ධි නම් වේ.

ගඟ රන් යනු - 'ගංරන්' කියා සන්ධි වෙයි. ගඟ යන තන්හි අන්තයෙහි පිහිටි සවර සහිත ගකාරය ලොප් කොට ඒ ගකාරය හා සංයෝගව පැවති ඌනමාත්‍ර බින්දුවට මාත්‍රාංශ වෘඩි කිරීමෙන් (සම්පූර්ණ බින්දුවක් කිරීමෙන්) 'ගංරන්' කියා සන්ධිය සෑදෙයි. 'නෙළඹු මල්' යනු 'නෙළම්මල්' කියා සන්ධි වෙයි. නෙළඹු යන තන්හි සවර සහිත බකාරය ලොප් කොට ඒ බකාරය හා සංයොගව පැවති ඌනමාත්‍රා මකාරයට

මාත්‍රාංශවෘඩි කිරීමෙන්ද (සම්පූර්ණ මකාරයක් කිරීමෙන්) ඉන්පසු බින්දුවට පරරූපදේශ වීමෙන් 'නෙළුම්මල්' කියා සන්ධිය සෑදෙයි.

ප්‍ර - ගාත්‍රාක්ෂරලෝප සන්ධිය යනු කුමක්ද? 'ගංරන්' යන්නේ බින්දුව කොයින් ලැබුනේද? මුංඇට, අම්මල් මේවා සන්ධි වූයේ කෙසේද? ගඟ ඉවුර, කැසුබු පොතු මේවා සන්ධි වන්නේ කෙසේද?

ආගම සන්ධිය.

ස්වරයකට ව්‍යඤ්ජනාක්ෂරයක් ආගම වීමෙන් ගැළපෙන සන්ධිය ආගම සන්ධි නම්.

කටු අල යන ශබ්ද දෙක-

කටුවල කියා සන්ධි වෙයි. කටු අල යන ශබ්ද දෙක අතරට වකාරය ආගම වූකල කටුව් අල කියා වෙයි. වකාරය ඇතුළට අල යන ශබ්දයේ අයන්න ලූකල 'කටුවල' කියා සන්ධි වෙයි.

ප්‍ර - ආගම සන්ධි යනු කුමක්ද? කටුවල යන්නේ වකාරය කොයින් ලැබුනාද? ගොටුවල, එයාකාරයෙන් යන ශබ්ද සන්ධිවූයේ කෙලෙසද? නොඑක් යනු සන්ධිවන්නේ කෙලෙසද?

පූර්වරූප, පරරූප, විකෘතරූප සන්ධි.

පූර්වරූප පරරූපාදි සන්ධි තුණ පූර්වරූපාදි ව්‍යාකරණ විධි තුන ආශ්‍රය කරගෙණ සන්ධි වේ. ඒ සන්ධි යට දැක්වූ පූර්වරූපාදිය වන පරිද්දෙන්ම දතයුතුයි.

පුත්හු යනු-

පුත්තු කියා සන්ධි වේ. මෙහි මුලින් තිබෙන තයන්නේ රූපය ඊළඟ අගින් තිබෙන 'හ' යන්නටත් වූබව පෙනේ. මෙය පූර්වරූප සන්ධියයි.

සත් දන යනු-

සද්දන කියා සන්ධි වේ. මෙහි මුලින් තිබෙන තයන්නට පරව තිබෙන දයන්නේ රූපය වූ බව පෙණේ. මෙසේ වන සන්ධි පරරූප සන්ධි නම්.

වල් අම්බලම යන මේ ශබ්ද දෙක-

වල්ලම්බලම කියා සන්ධි වේ. මෙහි වල් යන්නේ ලකාරය ලිත්ව වූවිට 'වල්ල්' කියා වෙයි. පසුව අම්බලම යන ශබ්දයේ අකාරය ලිඛවූ ලකාරයට ලූකල 'වල්ලම්බලම' කියා සන්ධිය ගැළපේ. මෙසේ ව්‍යඤ්ජනාක්ෂරය ලිඛ වීමෙන් ගැළපෙන සන්ධි ලිඛරූප සන්ධි නම්.

බලූ අන්ගේ යනු-

බල්ලන්ගේ කියා ලිඛ රූප සන්ධි වේ. මෙහිද බලූ යන ශබ්දයේ උයන්න ලොප්ව ලකාරය ලිඛ වූ බව පෙණේ.

ප්‍ර - පූර්වරූපාදීවූ සන්ධි තුණ ගැළපෙන ක්‍රමය කොතන දක්වන ලදද? පූර්වරූප සන්ධියෙත් පරරූප සන්ධියෙත් එකිනෙකට ඇති වෙනස කිම? ගොක්කොළ, ගෙත්තම් යන ශබ්ද දෙක කෙසේ සන්ධි වීද? කොලූ ආ, යනූ කෙසේ සන්ධි වේද?

එක තැනක සන්ධි වී පවතින ශබ්ද තවත් තැනක සන්ධි නොවීද තිබේ. 'යනෙන' යනූ 'යන එන' කියා විසන්ධිවද තිබේ. 'නිලූපුල්' යනූ නිල් උපුල් කියා විසන්ධිවද ව්‍යවහාර වේ. සමහර ශබ්ද නිතරම සන්ධි වීද පවතින බව ව්‍යවහාරයෙන් දතයුතුයි. ගොටුවල, කටුවල යනාදිය නිතරම සන්ධි වී තිබේ.

පද නීතියෙහි සන්ධි අධිකාරය මෙතෙකින් නිමි.

PARTS OF SPEECH

පද.

පද නම් අර්ථ ප්‍රකාශ කරණ අකුරුයි.

'අත' යන මේ අකුරු දෙක පදයෙකි. මක්නිසාද? යත්: මේ අක්ෂර දෙකින් හසත යන අර්ථයක් ප්‍රකාශ වන බැවිනි. 'කුකුළා' යන මේ අක්ෂර තුණද පදයකි. මෙයින්ද කුකුළා යන සතා ප්‍රකාශ වන බැවිනි. 'කෑවේ' යන මේ අක්ෂර දෙකද පදයකි. මෙයින්ද අර්ථයක් ප්‍රකාශ වන බැවිනි. 'ඩිර' යන මේ අක්ෂර දෙක පදයක් නොවෙයි. මෙයින් ප්‍රකාශ වන අර්ථයක් නොමැති බැවිනි.

නාම පදය, ආඛ්‍යාත පදය, උපසර්ග පදය, නිපාත පදය කියා පද සතර ආකාරයි.

ප්‍ර - පද යනු කුමක්ද? පද කී වැදෑරුම්ද? ඇස, කණ, ගස යන මේවා පදද? මීට පද කියන්නේ මක්නිසාද? ඩු, වී, මෙයින් පදය කවරේද?

NOUNS

නාමපද

නාමපද නම් සත්ත්වයන්ට හෝ ද්‍රව්‍යයන්ට කියන නමුයි. මිනිහා, ගොනා, ලියන්නා, වැල, රට, කුඹුර, යාම, දීම යන ශබ්ද නාමයි.

ප්‍ර - නාම පදය කුමක්ද? ගෝනිය, වී, කුකුළා මේවා කුමන පදද? කුරුල්ලා ඉගිලී ගියේය. එළදෙන තණ කයි. සතුරා පැරදුනේය. මේ පාඨවල නාමපද කවරේද?

VERBS

ආඛ්‍යාත පද.

ආඛ්‍යාත පද නම් ක්‍රියායි. කෙනෙකුගේ කිරීම හෝ වීම ක්‍රියායි.

ගොනා සිටී. මෙහි සිටී යනු ගොනාගේ කිරීමකි. එබැවින් සිටී යනු ක්‍රියාවකි. හෙවත් ආඛ්‍යාත පදයකි. 'කුමාරයා රජ වෙයි' මෙහි වෙයි යනු කුමාරයාගේ වීමකි. එබැවින් වෙයි යනු ක්‍රියායි. කුකුළා කයි. මෙහි කෑම කුකුළා කරණ ක්‍රියාවකි. එබැවින් 'කයි' යනුද ක්‍රියාවකි. මේ ආදි වශයෙන් කෙනෙක් කරණ ක්‍රියාවක් නැත්නම් කෙනෙකුගේ වීමක් ප්‍රකාශ කරන පද හෙවත් අක්ෂරයෝ ආඛ්‍යාත පදයයි සැලකිය යුතුයි.

ප්‍ර - ආඛ්‍යාත පද යනු කුමක්ද? නාම පදයෙත් ආඛ්‍යාත පදයෙත් එකිනෙකට ඇති වෙනස කිම? සුදු ගොනා එයි. ගොවියෝ කැති වලින් වල් කොටති, ශිෂ්‍යයෝ ගුරුවරුන් ගෙන් ප්‍රශ්න අසති. මේ පාඨවල නාමපද කවරේද? ක්‍රියාපද කවරේද?

PREFIXES
උපසර්ග පද.

නාමපදවල හෝ ක්‍රියාපදවල මුල යෙදී නොයෙක් අර්ථ ප්‍රකාශ කරන පද උපසර්ගයි.

ප, පර, අව, ස, අනු, නි, දු, වි, අ, අදි, සු, උ, අබි, පිරි, උප, අප, පස්, පිළි, අති, පි, මේ විස්ස උපසර්ග පදයි.

මේ උපසර්ග යෙදූ කල නාමයේ හෝ ක්‍රියාවේ අර්ථ වෙනස් වෙයි.

බල යනු ශක්තියට නමකි. මෙහි මුල 'ප' යන උපසර්ගය යෙදුන කල 'පබල' කියා වේ. පබල ශබ්දයෙන් අධික ශක්තිය ප්‍රකාශ වේ. මෙසේ බල ශබ්දයේ අර්ථ උපසර්ග යෙදීමෙන් වෙනස් විය. දන නාමයෙන් මනුෂ්‍යයා යන අර්ථය ප්‍රකාශ වේ. මෙහි මුල 'සු' යන උපසර්ගය යෙදුන විට 'සුදන' කියා වේ. සුදන ශබ්දයෙන් යහපත් ජනයා යන අර්ථය හැඟේ. 'දු' යන උපසර්ග යෙදුන විට 'දුදන' කියා වේ. දුදන ශබ්දයෙන් නපුරු මිනිහා යන අර්ථය ප්‍රකාශ වේ. මෙසේ එකම දන ශබ්දයට 'සු' 'දු' යන උපසර්ග දෙක යෙදුන විට දෙපරිද්දෙකින් අර්ථය වෙනස් විය.

'ගණී' යන ක්‍රියාපදයෙන් යම් දෙයක් ගන්නා බව හැඟේ. මීට 'උ යන උපසර්ගය යෙදූ විට 'උගණී' කියා වේ. 'උගණී' යන ක්‍රියාපදයෙන් යම් දෙයක් සිතට ගැනීම හෙවත් ඉගෙන ගැනීම යන අර්ථය හැඟේ. 'පිළි' යන උපසර්ග යොදා පිළිගණියයි කී විට අනුන් දුන් දෙයක් සතුටින් ගැනීම යන අර්ථය ප්‍රකාශ වෙයි.*

මෙසේ නාමපදවල හෝ ක්‍රියාපදවල මුල යෙදීමෙන් ඒවායේ අර්ථය නොයෙක් නොයෙක් අතට හරවන 'ප' යනාදි පද විස්ස උපසර්ගයයි දතයුතු.

ප්‍ර - උපසර්ග පද යනු කුමක්ද? උපසර්ග කීයද? උපසර්ග යෙදීමෙන් පදයට කුමක් වේද? දන යන ශබ්දයට 'දු' යන උපසර්ගය යෙදීමෙන් කවර වෙනසක් වීද? 'සුසැදි, දුබල, පවර, අනුමත, අබිදම්' යන ශබ්දවල කිනම් උපසර්ග යෙදුනේද? ලේකම් යන ශබ්දයෙන්

---

* වෙළෙන්ද, බඩු ගණී. කුමාරයා ශාස්ත්‍රය උගණී, ගුරුවරයා සතුටු පඬුරු පිළිගණී.

ලියන්නා යන අර්ථය හැඟේ. මීට උප යන උපසර්ගය යෙදූ විට කවර අර්ථයක් ප්‍රකාශ වේද? ගුණ ශබ්දයට දු යන උපසර්ගය යෙදූ විට කුමන වෙනසක් වේද?

PARTICLES

නිපාත පද.

නිපාත නම් නාමපදවල හා ක්‍රියාපදයන්හි අග හෝ මුල යෙදී නොයෙක් අර්ථ ප්‍රකාශ කරණ අකුරුයි.

ම, ද, වනාහි ලු, කිම්, හොත් යනාදිය නිපාත පදයි. නිපාතපද කිසි දෙයකට කියන නාම නොවෙයි. නමුත් නාමපද හෝ ක්‍රියාපද සමග යෙදූ විට නොයෙක් විසිතුරු අර්ථ ප්‍රකාශ කරන බව පෙණේ. 'ම' යන නිපාතයෙන් තනියම කිසි අර්ථයක් ප්‍රකාශ නොවෙතත් උඹම පලයන්, කියා 'උඹ' යන නාමපදයත් 'පලයන්' යන ක්‍රියාපදයත් සමග ගැළපූ විට අමුතු අර්ථයක් ප්‍රකාශ කෙරේ. ඒ අර්ථය නම් උඹම කියා නියම කිරීමයි. හෙවත් වෙන් කිරීමයි.

නිපාත පදයෙන් සමහර විට පදයේ අර්ථය සම්පූර්ණයෙන් වෙනස් වේ. 'උෆ ගියේය' මේ වචන දෙක අතරට 'නො' යන නිපාතය යෙදූ විට 'උෆ නොගියේය' කියා වේ. මෙහිදී උෆ ගියේය යන අර්ථය 'නො' යන නිපාතයෙන් ප්‍රතිෂේධවූ* බව පෙණේ. 'ගියහොත් හොඳයි' මෙහිද හොත් යන නිපාතය යෙදීමෙන් ගිය යන ක්‍රියාපදයේ අනියමාර්ථයක් ප්‍රකාශ වේ. මෙසේ නාම පද හෝ ක්‍රියාපද සමග යෙදී නොයෙක් විසිතුරු අර්ථ ප්‍රකාශ කරන පද නිපාත පදයි දතයුතුයි.

සමහර නිපාත පද කිසිම අර්ථයක් ප්‍රකාශ කරණ පිණිස නොව වාක්‍යය හෝ පදය පිරවීම පිණිස ව්‍යවහාර වේ.

විජය රජ 'වනාහි' අටතිස් හවිරුද්දක් රජ කෙළේය. මෙහි යොද තිබෙන 'වනාහි' යන නිපාතය පාඨය සම්පූර්ණ කරණ පිණිස නොහොත් පාඨය අලංකාර කරණ පිණිස යොදන ලද්දකි. එයින් අමුතු අර්ථයක් නොහැඟේ.

ප්‍ර - නිපාත යනු කුමක්ද? නිපාතය යම් දෙයකට කියන නමක්ද? නිපාතයෙන් අර්ථ ප්‍රකාශ වන්නේ කුමක් කළ විටද? උඹ පලයන් යන්නට උඹම පලයන් කියා 'ම' යන නිපාතය

* ප්‍රතිෂේධවූ, නැතිවූ, වැළකූ.

යෙදූ විට හැඟෙන අමුතු අර්ථය කිම? උඹ ගමට ගියෙහිද? උඟ තව නාවේය, අද ඒ බඩු නැවත දුන්නා, මේ පාඨවල තිබෙන නිපාත යෙදීමේ ඇති වෙනස කිම?

PRONOUNS
සර්නාම.

සියල්ලන්ටම ව්‍යවහාර කරණ නාම සර්නාමයි. නොහොත් වෙන නාමයක් වෙනුවට ව්‍යවහාර කරණ නාම සර්නාමයි.*

මම, උඹ, ඒ, මේ, තෝ, තමුසේ, අර, ඔය යනාදිය සර්නාමයි. කොයි මිනිස්සුත් තමන්ට 'මම' කියා ගනිති. සමීපයේ සිටින කාටත් 'මේ' යන නාමය ව්‍යවහාර කළ හැකියි. මෙසේ සියල්ලන්ටම කියහැකි බැවින් 'මම' යනාදියට සර්නාමයයි කියති.

ගොනා දිව්වා, උඟ නාම්බෙකි. මෙහි දෙවෙනි පාඨයේ තිබෙන උඟ යන 'සර්නාමයට'පූර්ව වාක්‍යයේ තිබෙන 'ගොනා' යන නාමය වෙනුවට යොදන ලදී. මේ නිසා සර්නාමයන්ට වෙන නාමයක් වෙනුවට යොදන නාමයයිද කියති. සර්නාමද නාමපදයේ කොටසකි.

ප්‍ර - සර්නාම යනු කුමක්ද? මම යනාදි නාමයන්ට සර්නාම කියන්නේ මන්ද? කොටියෙක් ගල්ලෙනේ සිටියේය. උඟ නපුරුයි. මෙහි උඟ යනු කුමක් වෙනුවට යොදන ලදද? ඒ ළමයා හොඳයි, මූ මහ නපුරෙකි, ඒ අය අපි දුටුවෙමු. මේ පාඨවල තිබෙන සර්නාම කවරේද? සර්නාම කුමන පදයකට අයිති වේද?

නාම, ආඛ්‍යාත, උපසර්ග, නිපාත යන පද සතරට සිංහල භාෂාවේ සියලුම ශබ්ද ඇතුළත් වේ. මේ සතර පදයම එක පාඨයේද යෙදේ.

පණ්ඩිතයෝ බොරුව නොපිළිගණිති.

මෙහි 'පණ්ඩිතයෝ' 'බොරුව' යන ශබ්ද දෙක නාමපදයි. 'නො' යන ශබ්දය නිපාත පදයි. 'පිළි'යනු උපසර්ගපදයි. 'ගණිති' යනු ක්‍රියා පදයි. උපසර්ග නිතරම ක්‍රියා හා ගැළපී

* ස්ත්‍රී පුරුෂ නපුංසක යන ලිඞ්ගත්‍රයටම කියහැකි බැවින් සර්නාමයයිද කියති.

තිබෙන බැවින් 'පිළිගණිති' යන්න උපසර්ගයක් සහිත වූවත් දෙකටම ක්‍රියාපදයයි කියහැකියි.

GENDER
ලිඬ්ග

පුරුෂයන්ට හෙවත් පිරිමි සතුන්ට කියන නම් පුරුෂ ලිඟුයි. සත්‍රීන්ට හෙවත් ගැහැනු සතුන්ට කියන නම් ස්ත්‍රී ලිඟුයි. අචේතන දේට හෙවත් අප්‍රාණික දේට කියන නම් නපුංසක ලිඟුයි.

මෙසේ සිංහල භාෂාවේ නාම, ලිඬ්ග තුනකට බෙදේ. මිනිහා, විජය රජ, ඇතා, කුකුළා, ගොනා යනාදි නාම පුරුෂ ලිඟුයි.

ගෑනි, බිසව, පබාවතී, එළදෙන, කිකිළී යන මේ ආදී නාම ස්ත්‍රී ලිඟුයි.

ගස, රට, කුඹුර, පොල්, කොස් අත යනාදි නාම නපුංසක ලිඟුයි.

සර්වනාම මේ ලිඬග තුණම භජනය කෙරේ. 'මේ' යන සර්වනාමය පුරුෂයෙකුට ව්‍යවහාර කරන කල 'මූ' කියාද ස්ත්‍රියකට 'මෑ' කියාද නපුංසක ලිඬ්ගික හෙවත් අප්‍රාණික දෙයකට 'මේක' කියාද ව්‍යවහාර කෙරෙති. ස්ත්‍රී පුරුෂ නපුංසක යන ලිඬ්ග භේදය මෙසේ සර්වනාමවල ඉතා ප්‍රකටව පිහිටා තිබේ. 'උෆ' කී විට පුරුෂයෙක් බවත් 'ඈ' කී විට ස්ත්‍රියක් බවත් 'ඒක' කී විට මේ දෙවර්ගයම නොවන දෙයක් බවත් වහා වැටහේ.

ම, වනාහි, වහා, පිණිස යනාදි නිපාත පදවල ලිඬ්ග භේදයක් නොමැතියි. එබැවින් නිපාත පද අලිඟුයයි දත යුතුයි.

ප්‍ර - කොයි වර්ගයට ව්‍යවහාර කරන නම් පුරුෂ ලිඬ්ගිකද? ගස්, ලී ආදියට කියන නම් කුමන ලිඟුද? ස්ත්‍රීන්ට කියන නාම කවර ලිඟුද? කිකිළී, කුකුළා, කුකුළු පිහාට්ට, මේ ශබ්ද තුන කුමන ලිඟුද? ලිඬ්ග භේදය ඉතා ප්‍රකටව පිහිටා තිබෙන්නේ කවර ශබ්දවලද? තී, අරූ, අරක මේ ශබ්ද කුමන ලිඟුද? ලිඟු නොමැති ශබ්ද කවරේද?

පදනීතියෙහි චතුර්විධ පදාධිකාරය

මෙතෙකින් නිමි.

TERMINATION
විභක්ති

නාමයක් වෙන ශබ්ද සමග ගැළපීමේදී එහි අගට අමුතු අක්ෂර යොදා වෙනස් කිරීම විභකතිය නමි.

නාමය වෙනස් කරන පිණිස අගට යොදන අක්ෂර විභකති ප්‍රත්‍යය නමි.

'සඳට විද්ද' මෙහි විද්ද යන ශබ්දය සමග සඳ ශබ්දය ගළපන කළ 'සඳට' කියා වෙනස් විය. මේ වෙනස විභකතිය යෙදීමයි. සඳ ශබ්දයේ අග යෙදුන විභක්ති ප්‍රත්‍යය නම් 'ට' යන්නයි. සඳින් රැස් විහිදුනේය. මෙහි 'රැස් විහිදුනේය' යන ශබ්ද දෙක සමග සඳ ශබ්දය ගළපන විට 'සඳින්' කියා අග වෙනස් වූ බව පෙනේ. මේ වෙනස් වීමද විභක්තියයි. මෙහි සඳ ශබ්දයේ අග යෙදුන විභක්ති ප්‍රත්‍යය 'ඉන්' යනුයි. සඳේ රැස් තිබේ. මෙහි 'රැස් තිබේ' යන ශබ්ද දෙක සමග සඳ ශබ්දය යෙදීමේදී 'සඳේ' කියා වෙනස් විය. මෙහි ප්‍රත්‍යය 'ඒ' යන්නයි. මෙසේ නාම ශබ්ද ඒ ඒ අදහස් ප්‍රකාශ කරණ පිණිස තවත් නාම ශබ්ද හෙවත් ක්‍රියා ශබ්ද සමග ගළපන කල අග වෙනස් කිරීම විභකතියි දතයුතුයි.

ප්‍ර - විභක්ති යනු කිම? නාමයක් වෙනස් කිරීමට අග යෙදෙන අක්ෂර කිනම්ද? මුවාට, මුවාගේ, මුවා මෙයින් කවර ශබ්දයේ විභක්ති තිබේද? 'සඳට' "සඳින්" මෙහි අග යෙදුන 'ට' 'ඉන්' යන අක්ෂර කවරේද?

NUMBER
එක වචන බහු වචන

එකක් හෝ එක සත්ත්වයෙක් ප්‍රකාශ කරන ශබ්ද ඒකවචනයි. ඊට වැඩිගණනක් ප්‍රකාශ කරණ ශබ්ද බහුවචනයි. පොලේ, ගොනා, කුඹුර, කුකුළා, මිනිහා මේ ශබ්ද ඒකවචනයි.

පොල් කී විට එක පොල් ගෙඩිය බව හැඟෙයි. ගොනා කී විටත් එයින් හැඟෙන්නේ එක ගොනයි. මෙසේ එක සඞඛ්‍යාවක් ප්‍රකාශ කරන ශබ්ද ඒකවචනයි.

පොල්, ගොන්නු, කුඹුරු, කුකුළෝ, දෙන්නෙක් යන ශබ්ද බහුවචනයි.

පොල් කී විට එක පොලයකට වැඩි ගණනක් ප්‍රකාශ වේ. ගොන්නු කී විට එක ගොනාට වැඩි ගණනක් ප්‍රකාශ වේ. එබැවින් පොල්, ගොන්නු යනාදිය බහුවචනයි. පොල්, කොස්, ගස් ආදී වශයෙන් සමහර අචේතන ශබ්දවල ප්‍රකෘති බහුවචනයෙන්ම පිහිටා තිබේ.

ප්‍ර - ඒකවචන යනු කුමක්ද? බහුවචන යනු කිම? ගොනා යන වචනයේ බහුවචනය කෙලෙසද? කුඹුරු යන වචනයේ ඒකවචනය කෙලෙසද? කණා, ලූල්ලු, කොල්ලෝ, අටුව, දෙල් මේ ශබ්ද අතරේ ඇති එකවචන බහුවචන කිම?

CASES
විභක්ති නාම

ප්‍රථමා විභක්ති, කර්ම විභක්ති, කර්තෘ විභක්ති, කරණ විභක්ති, සම්ප්‍රදන විභක්ති, අවධි විභක්ති, සම්බන්ධ විභක්ති, ආධාර විභක්ති, ආලපන විභක්ති කියා විභක්ති නවයක් වේ.

ප්‍ර - විභක්ති කීයද? ඒවායේ නම් කවරේද?

විභක්ති ප්‍රත්‍යයෝ.

යට දැක්වූ විභක්ති නවයට අයිති ප්‍රත්‍යයෝ නානා ප්‍රකාරයි. ඒකවචන බහුවචන වශයෙන් ඒ ප්‍රත්‍යයයෝ දෙයාකාරයි.

	එකවචන	බහුවචන
ප්‍රථමා	අ, ආ	ඌ, ඕ, හු
කර්ම	අ, ආ	අන්, උන්
කර්තෘ	අ, ආ	අන්, උන්
කරණ	ගෙන්, ඉන්, එන්	අන්ගෙන්, උන්ගෙන්
සම්ප්‍රදන	ට, අට, ආට	අන්ට, උන්ට, (ඉන්, එන්)
අවධි	එන්, න්	ත්, එන්
සම්බන්ධ	එ, ආගේ, ගේ	අන්ගේ, උන්ගේ
ආධාර	එ, එහි	අන්, අ
ආලපන	ආ, ඕ	එනි, අනේ

ප්‍ර - ප්‍රථමා විභක්ති ප්‍රත්‍යයෝ කවරහුද? අ ආ යන දෙක කොයි කොයි විභක්තිවල ප්‍රත්‍යයයෝ වෙත්ද? එකහැටි විභක්ති ප්‍රත්‍යයයන් ඇති විභක්ති කවරහුද? උන්, අන්, ගෙන්,ට, ආගේ, අනේ, මේ විභක්ති ප්‍රත්‍යයයෝ කොයි කොයි විභක්තිවලට අයිතිද?

DECLENTION
පදසිඬිය.

යට දැක්වූ විභක්ති ප්‍රත්‍යයයෝ ශබ්දවල අගින් තුන් ප්‍රකාරයකට යෙදී පදසිඬිය වෙයි. හෙවත් වරනැගෙයි.

පළමුවෙනි ප්‍රකාරය - සමහර ශබ්දවල අගට පූර්ව්සවර ලොප සන්ධි විධියෙන් හෝ සවර සන්ධි විධියෙන් විභක්ති ප්‍රත්‍යය යෙදී පදසිඬිය වෙයි.

බඹර ශබ්දයෙන් පරව ප්‍රථමා විභක්ති එකවචනයවූ 'ආ' යන ප්‍රත්‍යය තැබූ විට 'බඹර ආ' කියා පෙණේ. බඹර ශබ්දයේ අග සවරය ලොප් කළ විට 'බඹර් ආ' කියා වේ. පසුව ආයන්න හල් රකාරයට ලූවිට 'බඹරා' කියා ප්‍රථමා විභක්ති එකවචනයේ පදසිඬිය වෙයි. ප්‍රථමා විභක්ති බහුවචන ප්‍රත්‍යයවූ 'උ' යන්න තැබූ විට 'බඹර උ' කියා වේ. බඹර ශබ්දයේ අග රකාරසඵ* ආකාරය ලොප් වී ඒ හල් රකාරයට උයන්න පැමිණි විට 'බඹරු' කියා ප්‍රථමා විභක්ති සෑදේ. කම් කතෘ ආදී සෙසු විභක්ති ප්‍රත්‍යය වැටී පද සිඬිය වෙන්නෙත් මෙලෙසයි. අත් ශබ්දයෙන් පරව 'අ' යන ප්‍රථමා විභක්ති ඒක වචන ප්‍රත්‍යය තැබූ විට 'අත් අ'කියා පෙනේ. හල් තයන්නට අයන්න ලූකල 'අත' කියා සවර සන්ධි විධියෙන් පදසිඬිය වේ. 'බඹරට' බඹරගෙ යනාදියේ සවරයක් මුලට නොමැති ගාත්‍රාක්ෂර ප්‍රත්‍යය වැටී පදසිඬිය වන විට සවරලොපාදියක් නොවේ.

ප්‍ර - කී ප්‍රකාරයට විභක්ති ප්‍රත්‍යයයෝ නාම ශබ්දවල අගට යෙදෙත්ද? එයින් පළමුවැනි ප්‍රකාරය කෙලෙසද? 'බඹරා, බඹරු, අත' මේ වචන තුණේ පදසිඬිය කෙසේ වීද? බඹර ශබ්දයේ අගට කතෘ විභක්ති බහුවචනය ගළපන්නේ කෙලෙසද?

දෙවෙනි ප්‍රකාරය - විභක්ති ප්‍රත්‍යයයන්ට යකාර වකාරාගම වී ආගම සන්ධි ක්‍රමයෙන් සමහර ශබ්ද වරනැගේ.

පෙටි ශබ්දය අගින් ප්‍රථමා විභක්ති එකවචන ප්‍රත්‍යයවූ 'ආ' යන්න තැබූ විට 'පෙටි අ' කියා වේ. යකාරය ආගමවූ විට 'පෙටිය් ආ' කියා වේ. පසුව යකාරයට 'ආ' යන්න ලූකල 'පෙටියා' කියා ප්‍රථමා විභක්ති එකවචනයේ පදසිඬිය වේ. ප්‍රථමා විභක්ති බහුවචන ප්‍රත්‍යයවූ ඕ යන්න පෙටි ශබ්දයෙන්

* රකාරයෙහි පිහිටි

පරව තැබූ විට 'පෙටිඕ' කියා වේ. යකාරාගමවූ විට 'පෙටිය් ඕ' කියා වේ. යකාරයට ඕකාරය ලූවිට 'පෙටියෝ' කියා ප්‍රථමා විභක්ති බහුවචනයේ පදසිඬිය වේ. කම් කතෘ විභක්ති ආදියේ පදසිඬියත් මෙසේයි.

වඩු ශබ්දයෙත් පරව ප්‍රථමා විභක්ති එකවචන ප්‍රත්‍යයවූ 'අ' යන්න තැබූ විට 'වඩු ආ' කියා වේ. වකාරාගමය වූ විට 'වඩු ව් ආ' කියා වේ. වකාරයට ආයන්න ලූකල 'වඩුවා' කියා ප්‍රථමා විභක්ති ඒකවචනයෙහි පදසිඬිය වේ. බහුවචන ප්‍රත්‍යයවූ 'ඕ' යන්න තැබූ විට 'වඩුඕ' කියා වේ. වකාරාගමය වූවිට 'වඩුව් ඕ' කියා වේ. ඕයන්න වකාරයට ආරූඪ කළ විට 'වඩුවෝ' කියා ප්‍රථමා විභක්ති බහුවචනයේ පදසිඬිය වේ. කම් කතෘ විභක්ති ආදියේ පදසිඬියත් මෙසේම දතයුතුයි.

ප්‍ර - පදසිඬියේ දෙවෙනි ප්‍රකාරය කිම? පෙටියා, වඩුවා, යන මේ වචන දෙකේ විභක්ති ප්‍රත්‍යය කුමක්ද? මෙහි තිබෙන යකාර වකාර කෙසේ ආයේද? මේ යකාර වකාර දෙක පැමිණීම විධිය කොතැන දක්වා තිබේද? පෙටි ශබ්දයෙන් කම්විභක්ති බහුවචනය සෑදෙන්නේ කෙලෙසද? වඩු ශබ්දයේ සම්බන්ධ විභක්ති ඒකවචනය කෙලෙසද?

තුන්වෙනි ප්‍රකාරය - අග ව්‍යඤ්ජනාක්ෂරය ලිඛ වීමෙන් ලිඛ සන්ධි ක්‍රමයට සමහර ශබ්දවල පදසිඬිය වේ.

උකුසු ශබ්දයේ අග 'ආ' යන ප්‍රථමා විභක්ති ඒකවචන ප්‍රත්‍යය තැබූ විට 'උකුසු ආ' කියා වේ. අග සවරය ලොප්කළ විට 'උකුස් ආ' කියා වේ. සකාරය ලිඛවූ විට 'උකුස්ස් ආ' කියා වේ. ආයන්න සකාරයට ආරූඪ කළ විට 'උකුස්සා' කියා ප්‍රථමා විභක්ති ඒකවචනයේ පදසිද්ධිය වේ. බහුවචන ප්‍රත්‍යය වූ ඕ යන්න තැබූ විට 'උකුසුඕ' කියා වේ. උකුසු ශබ්දයේ අග සවරය ලොප් කර සකාරය ලිඛ කොට ලිඛවූ සකාරයට 'ඕ' යන ප්‍රත්‍යය ආරූඪ කළ විට 'උකුස්සෝ' කියා ප්‍රථමා විභක්ති බහුවචනයේ පදසිද්ධිය වේ. කම් විභක්ති ආදියේ පදසිද්ධියත් මෙලෙසයි.

පොලු ශබ්දයෙන් පරව ප්‍රථමා විභක්ති ඒකවචනය වූ 'අ' යන ප්‍රත්‍යය තැබූ විට 'පොලුඅ' කියා වේ.

ලකාරස්ථ උකාරය ලොප් කොට ලකාරය දිත්ව කළ කල 'පොල්ල් අ' කියා වේ. පසුව අයන්න විඡවූ ලයන්නට ලූකල 'පොල්ල' කියා ප්‍රථමා විභක්ති ඒකවචනයේ පදසිද්ධිය වේ.

ප්‍ර - පදසිද්ධියේ තුන්වෙනි ප්‍රකාරය කුමක්ද? උකුස්සා, උකුස්සෝ, මේ දෙකේ පදසිද්ධිය කෙසේද? උකුසු ශබ්දයේ කරණ විභක්ති බහුවචනය සෑදෙන්නේ කෙලෙසද? උකුසු ශබ්දය කුමන සන්ධි ක්‍රමයකින් වරනැගේද?

පූර්ණස්වරලොපසන්ධි විධියෙන් වරනැගෙන ශබ්ද.

බඹර ශබ්දය.

Singular. එකවචන		Plural බහුවචන.
ප්‍රථමා විභක්තිය	බඹරා	බඹරු
කර්ම විභක්තිය	බඹරා	බඹරුන්
කර්තෘ විභක්තිය	බඹරා	බඹරුන්
කරණ විභක්තිය	බඹරාගෙන්	බඹරුන්ගෙන්
සම්ප්‍රදාන විභක්තිය	බඹරාට	බඹරුන්ට
අවධි විභක්තිය	බඹරාගෙන්	බඹරුන්ගෙන්
සම්බන්ධ විභක්තිය	බඹරාගේ	බඹරුන්ගේ
ආධාර විභක්තිය	බඹරා කෙරෙහි	බඹරුන් කෙරෙහි*
ආලපන විභක්තිය	බඹරෝ	බඹරුනි, බඹරුනේ

දෙබර, මොනර, සොර, යනාදි ශබ්දද මෙසේයි.

ස්වරසන්ධි ක්‍රමයෙන් වරනැගෙන ශබ්ද

කොවුල් ශබ්දය.

ප්‍රථමා	කොවුලා	කොවුලෝ
කර්ම	කොවුලා	කොවුලන්
කර්තෘ	කොවුලා	කොවුලන්
කරණ	කොවුලාගෙන්	කොවුලන්ගෙන්

---

* සචේතනික ශබ්ද වරනැගෙන විට ආධාර විභක්තියෙහිදී ශබ්ද අගට වෙන විභක්තිවල මෙන් විභක්ති ප්‍රත්‍යය නොයෙදේ. මෙහි බඹරා යන ශබ්දය අගට කරා යන නාම වචනය යෙදී එහි අගට ප්‍රාණික ශබ්ද අගින් යෙදෙන 'එ' යන ආධාර විභක්ති ප්‍රත්‍යය වැටී 'බඹරා කෙරෙහි, බඹරුන් කෙරෙහි' කියා පදසිඬිය වූයේය. කරා යන වචනයෙන් ළඟ යන අර්ථය හැඟේ. එබැවින් බඹරා කෙරෙහි යනු බඹරා ළඟ යන අර්ථයි. නමුත් බඹරා කෙරෙහි පිහිටි කාලවණ්ණයයි කී විට ඒ වණ්ණය බඹරා ළඟ තිබෙන වණ්ණයක් නොව උගේ ශරීරයෙහි පිහිටි වණ්ණයක් බව හැඟේ. කරා යන්නේ ප්‍රකෘතිය කර යයිද සිතිය හැකිය.

Singular. එකවචනය		Plural බහුවචනය.
සම්ප්‍රදන	කොවුලාට	කොවුලන්ට
අවධි	කොවුලාගෙන්	කොවුලන්ගෙන්
සම්බන්ධ	කොවුලාගේ	කොවුලන්ගේ
ආධාර	කොවුලා කෙරෙහි	කොවුලන් කෙරෙහි
ආලපන	කොවුල, කොවුලෝ	කොවුලෙනි, කොවුලනේ

අත් ශබ්දය.

ප්‍රථමා	අත	අත්[1]
කර්ම	අත	අත්
කර්තෘ	අත	අත්
කරණ	අතින්, අතෙන්	අතින්, අත්වලින්[2]
සම්ප්‍රදන	අතට	අත්වලට
අවධි	අතින්,අතෙන්	අත්වලින්
සම්බන්ධ	අතේ, අතෙහි	අත්වල්[3]
ආධාර	අතේ, අතෙහි	අත්වල

ගස්, දෙඩම් යනාදි ශබ්දද මෙලෙසයි.

යකාරාගමවී ආගම සන්ධි විධියෙන් වරනැගෙන ශබ්ද.

පෙට්ටි ශබ්දය.

ප්‍රථමා	පෙට්ටියා	පෙට්ටියෝ
කර්ම	පෙට්ටියා	පෙට්ටියන්
කර්තෘ	පෙට්ටියා	පෙට්ටියන්
කරණ	පෙට්ටියාකරණකොට	පෙට්ටියන්කරණකොට
සම්ප්‍රදන	පෙට්ටියාට	පෙට්ටියන්ට
අවධි	පෙට්ටියාගෙන්	පෙට්ටියන්ගෙන්
සම්බන්ධ	පෙට්ටියාගේ	පෙට්ටියන්ගේ

1. අප්‍රාණික දේට කියන නම් ප්‍රථමා විභක්ති බහුවචනවලදී විභක්ති ප්‍රත්‍යය වැටී වරනොනැගී මෙසේ ප්‍රකෘතියෙන් සිටීම සිංහල භාෂාවේ බහුල්‍යයි. අප්‍රාණික ශබ්දවල ආලපන විභක්ති වර්තමාන ව්‍යවහාර භාෂාවේ අප්‍රකටයි.
2. වල් යනු බහුවචනය අවබෝධ කරවීමට අප්‍රාණික ශබ්දයන්ගේ අගට යොදන ප්‍රත්‍යයකි. ගෙවල් දේවල් යනාදී වශයෙන් ප්‍රථමා කර්ම විභක්ති බහුවචනවලද යොදනු ලැබේ. අප්‍රාණික ශබ්දවල එකවචන බහුවචන දෙකේ වෙනසක් නොමැතිව 'අතිනි' 'අතෙන්'යනාදිය බහුවචනවලද කාව්‍ය භාෂාවේ බොහෝසේ යෙදේ.
3. අත්වල් + අ - අත්වල.

Singular. එකවචනය		Plural බහුවචනය.
ආධාර	පෙටියා කෙරෙහි	පෙටියන් කෙරෙහි
ආලපන	පෙටියෝ, පෙටියෙනි	පෙටියනේ

දෙවි, දිවි, යක්ෂ, රාක්ෂ,[1] රාම, කොටි, මැඩි යනාදී ශබ්දද මෙලෙසයි.

වැඳිරි ශබ්දය.

ප්‍රථමා	වැඳිරි, වැඳිරිය	වැඳිරියෝ
කර්ම	වැඳිරි, වැඳිරිය	වැඳිරියන්
කර්තෘ	වැඳිරි, වැඳිරිය	වැඳිරියන්
කරණ	වැඳිරිකරණකොට	වැඳිරියකරණකොට
සම්ප්‍රදන	වැඳිරිට, වැඳිරියට	වැඳිරියන්ට
අවධි	වැඳිරිගෙන්, රියගෙන්	වැඳිරියන්ගෙන්
සම්බන්ධ	වැඳිරිගේ, වැඳිරියගේ	වැඳිරියන්ගේ
ආධාර	වැඳිරිය කෙරෙහි	වැඳිරියන් කෙරෙහි
ආලපන	වැඳිරියේ, වැඳිරි	වැඳිරියනි, වැඳිරියනේ

දේවී, කුමාරී, කිකිළී, පබාවතී යනාදි ශබ්දද මෙලෙසයි.

ගෙඩි ශබ්දය.

ප්‍රථමා	ගෙඩිය	ගෙඩි
කර්ම	ගෙඩිය	ගෙඩි
කර්තෘ	ගෙඩිය	ගෙඩි
කරණ	ගෙඩියකරණකොට	ගෙඩිකරණකොට
සම්ප්‍රදන	ගෙඩියට	ගෙඩිවලට
අවධි	ගෙඩියෙන්	ගෙඩිවලින්
සම්බන්ධ	ගෙඩියේ	ගෙඩිවල
ආධාර	ගෙඩියෙහි, ගෙඩියේ	ගෙඩිවල

බල, තැටි, කොඩි, ලී යනාදි ශබ්දද මෙසේයි.

වකාරාගම වී ආගම සන්ධි ක්‍රමයෙන් වරනැගෙන ශබ්ද.

වඩු ශබ්දය

ප්‍රථමා	වඩුවා	වඩුවෝ
කර්ම	වඩුවා	වඩුවන්
කර්තෘ	වඩුවා	වඩුවන්
කරණ	වඩුවාකරණකොට	වඩුවන්කරණකොට
සම්ප්‍රදන	වඩුවාට, වඩුවට	වඩුවන්ට

1. ආලපන බහුවචන යක්ෂයිනේ, රාක්ෂයිනේ කියාද වේ.

Singular. එකවචනය		Plural බහුවචනය
අවධි	වඩුවාගෙන්, වඩුවාගෙන්	වඩුවන්ගෙන්
සම්බන්ධ	වඩුවාගේ, වඩුවගේ	වඩුවන්ගේ
ආධාර	වඩුවා, කෙරෙහි	වඩුවන් කෙරෙහි
ආලපන	වඩුවෝ, වඩුවා	වඩුවනේ, වඩුවෙනි

එළු, ඔටු, ගිරා,[1] මදුරු යනාදී ශබ්දද මෙසේයි.

ඔලු ශබ්දය.

ප්‍රථමා	ඔලුව	ඔලු
කර්ම	ඔලුව	ඔලු
කර්තෘ	ඔලුව	ඔලු
කරණ	ඔලුවකරණකොට	ඔලුකරණකොට
සම්ප්‍රදන	ඔලුවට	ඔලුවලට
අවධි	ඔලුවෙන්	ඔලුවලින්
සම්බන්ධ	ඔලුවේ	ඔලුවල
ආධාර	ඔලුවේ, ඔලුවෙහි	ඔලුවල

මඩු, කොටු, පුර, ගඞ්ගා, භාර්‍යා[2], යනාදී ශබ්ද ද මෙසේයි.

අග ව්‍යඤ්ජන වී විසර්ගරූප සන්ධි ක්‍රමයෙන් වරනැගෙන ශබ්ද

උකුසු ශබ්දය.

ප්‍රථමා	උකුස්සා	උකුස්සෝ
කර්ම	උකුස්සා	උකුස්සන්
කර්තෘ	උකුස්සා	උකුස්සන්
කරණ	උකුස්සාකරණකොට	උකුස්සන්කරණකොට
සම්ප්‍රදන	උකුස්සාට, උකුස්සට	උකුස්සන්ට
අවධි	උකුස්සගෙන්, සාගෙන්	උකුස්සන්ගෙන්
සම්බන්ධ	උකුස්සගේ, සාගේ	උකුස්සන්ගේ
ආධාර	උකුස්සා, කෙරෙහි	උකුස්සන් කෙරෙහි
ආලපන	උකුස්සෝ, උකුස්සා	උකුස්සනේ, උකුස්සෙනි

කටුසු, බලු, යනාදී ශබ්දද මෙසේයි.

---

1. ගිරා ශබ්දය වරනැගීමේදී ගිරවා යනාදි වශයෙන් අකාරාන්ත වෙයි. ප්‍රථමා බහුවචනය 'ගිරව්'කියා වේ. සෙසු විභක්ති අකාරය මුලට ඇති විභක්ති ප්‍රත්‍යය වැටී වරනැගේ.
2. ගඞ්ගා, භාර්‍යා, උමා යනාදි ශබ්ද සංස්කෘත ස්ත්‍රීලිඞ්ගික ආකාරාන්තයි. මිශ්‍ර සිංහල ලිවීමෙහිදී සමහර විභක්ති ඔලු ශබ්දය මෙන්ද සමහරක් වඩු ශබ්දය මෙන්ද වරනැගිය යුතුයි.

පොලු ශබ්දය.

Singular. එකවචන		Plural බහුවචන.
ප්‍රථමා	පොල්ල	පොලු
කර්ම	පොල්ල	පොලු
කර්තෘ	පොල්ල	පොලු
කරණ	පොල්ලකරණකොට	පොලුකරණකොට
සම්ප්‍රදන	පොල්ලට	පොලුවලට
අවදි	පොල්ලෙන්	පොලුවලින්
සම්බන්ධ	පොල්ලේ	පොලුවල
ආධාර	පොල්ලේ, පොල්ලෙහි	පොලුවල

මලු, වලු, බටු යනාදි ශබ්ද ද මෙසේයි.

සර්වනාම ශබ්ද *

ප්‍රථමා	උහු, හෙතෙමේ, එතෙමේ	ඔවුහු
කර්ම	උහු	ඔවුන්
කර්තෘ	උහු	ඔවුන්

තශබ්දය

ප්‍රථමා	තෝ	තෙපි, තොපි
කර්ම	තා	තොප
කර්තෘ	තා	තොප

මශබ්දය

ප්‍රථමා	මම	අපි
කර්ම	මා	අප
කර්තෘ	මා	අප

අසුර ශබ්දය ආදි සමහර ශබ්ද අසුරා, අසුරෝ කියා බඹර ශබ්දය මෙන් පූර්වස්වරලෝප සන්ධි ක්‍රමයෙන් ද අසුරයා, අසුරයෝ යනාදි වශයෙන් පෙටි ශබ්දය මෙන් යකාරාගම වී ආගම සන්ධි ක්‍රමයෙන්ද වරනැගේ.

---

* සර්වනාමවල සෙසු විභක්ති වරනැගෙන පරිදි ව්‍යවහාරයෙන් දත යුතුයි.

'ඔහුන්' යනු වැරදි ව්‍යවහාරයකි.

මකුළු ශබ්දය ආදි සමහර මකුළා, මකුළෝ* කියා බඹර ශබ්දය මෙන්ද මකුළුවා මකුළුවෝ කියා වඩු ශබ්දය මෙන්ද වරනැගේ.

ඉත්තෑයා,* ඉත්තෑවා යනාදි වශයෙන් ඉත්තෑ ශබ්දය ආදි සමහර ශබ්ද විභක්ති ප්‍රත්‍යයට යකාරාගම වීමෙන් හා වකාරාගම වීමෙන්ද ව්‍රිප්‍රකාරව වරනැගේ.

'ලූලා''ලූල්ලු' යනාදි වශයෙන් ලූල් ශබ්දාදි සමහර ශබ්දවල එකවචන බඹර ශබ්දය මෙන්ද බහුවචන වරනැගීමෙහිදී අග ව්‍යඤ්ජනාක්ෂර ව්‍රිඳවී උයන්න මුලට ඇති උන්, උන්ගේ, යනාදි විභක්ති ප්‍රත්‍යය වැටීමෙන්ද වරනැගේ.

වලු ශබ්දාදි අචෙතන ශබ්ද බහුවචනයේදී ව්‍රිඳ නොවේ.

මේ දක්වන ලද්දේ බොහෝ සෙයින් ව්‍යවහාර භාෂාවේ වරනැගෙන ක්‍රමයයි. මෙහි නොදක්වන ලද විභක්ති ප්‍රත්‍යයයෝද ඉතා බොහෝයි. ඒවා ව්‍යවහාරයෙන් හා සිදත් සඟරාවෙන් දතයුතුයි. ව්‍යාකරණ ලක්ෂණ ඉගෙන ගත් කල ශබ්ද වරනැගීම සිංහල ජනයාට ඉතා පහසු වැඩකි.

කාව්‍ය භාෂාවේ ශබ්ද වරනැගීමේදී මෙහි නොකී වෙනස් තිබේ. එසේම විභක්ති ප්‍රත්‍යයද ඉතා බොහෝයි.

NOMINATIVE ප්‍රථමා විභක්තිය.

ලිඬ්ගාර්ථ උක්තාර්ථ දෙක්හි ප්‍රථමා විභක්තිය යෙදේ. ලිඬ්ගාර්ථය නම් නාම මාත්‍රය පමණක් කීමයි. උක්තාර්ථය නම් ක්‍රියාවෙන් කියවෙන හෙවත් හැඟෙන නාමයයි.

බඹරා, වඩුවෝ, බස්සා, ගෙඩි, පොල්ල, අත, මේ ශබ්ද සියල්ලම ලිඬ්ගාර්ථයේ ප්‍රථමා විභක්තියි. බඹරා 'ඉගුලුනා' බඹරා කළුයි, බඹරාගේ පිහාටු යනාදී වශයෙන් බඹර ශබ්දය සමග අමුතු ශබ්ද නොයොදා 'බඹරා, වඩුවෝ' කියා නාමය පමණක් කියන විට යෙදෙන විභක්තිය ලිඬ්ගාර්ථයේ ප්‍රථමා විභක්තියි.

'බඹරා ඉගිලේ, වඩුවෝ යති, පොල්ල වැටුනා, ලිය යයි, උඹ ගියා, මම ලියමි, තෝ යන්නෙහිය,

* ඇතැම් පලාත්වල මෙසේ නැත.

මේ පාඨවල තිබෙන 'බඹරා' 'වඩුවෝ' යනාදි නාම උක්තාඛ්‍යයෙහි ප්‍රථමා විභක්තියි. ඉගිලේ, යති යනාදි ක්‍රියා වලින් 'බඹරා' 'වඩුවෝ' යනාදිය උක්ත වේ.

ක්‍රියාධිකරණය ඉගෙණ ගන්නා තුරු උක්තාඛ්‍යය සුඛාවබෝධ (a) නොවෙයි.

පුරුෂ ලිඞ්ගික ප්‍රථමා විභක්ති එකවචනයෙන් පරව 'තෙමේ' යනුද ස්ත්‍රී ලිඞ්ගික ප්‍රථමා විභක්ති එකවචනයෙන් පරව 'තොමෝ' යනුද දෙකේම බහුවචනයෙන් පරව 'තුමූ' යනුද යොදනු ලැබේ.

කුමාරතෙමේ රජ විය. කුමාරී තොමෝ ගර්භිණී විය. කුමාරයෝ තුමූ රජවූහ. කුමාරියෝ තුමූ ගර්භිණියෝ වූහ.*

ප්‍ර - ප්‍රථමා විභක්තිය කවර අර්ථවල යෙදේද? ලිඞ්ගාර්ථය යනු කුමක්ද? ගොනා, ලීය, කුකුළෝ, අටුව, මේ වචන කවර අර්ථයක කවර විබත්ද? උක්තාඛ්‍යය යනු කුමක්ද? 'ගොනා දිව්වා' 'කොටියා සිටී' 'කිකිළි කුරුල්ලා' 'කුමාරී සිටී' මෙහි කොයි ශබ්දවල උක්තාඛ්‍යයෙහි ප්‍රථමා විභක්ති පිහිටියේද? තෙමේ, තොමෝ, තුමූ මේ තුණ කොතැන යෙදිය යුතුද?

පණ්ඩිතයා, අසුරයා, ගස, මේ ශබ්ද උක්තාඛ්‍යයෙහි ප්‍රථමා විභක්ති වී කොයි පාඨවල තිබේද?

ACCUSATIVE කර්ම විභක්තිය.

ක්‍රියාවට යටත් වන දෙය ප්‍රකාශ කරණ නාමයෙන් පරව කර්ම විභක්තිය යොදනු ලැබේ. කර්තෘගේ ක්‍රියාවෙන් කරණු ලබන දෙය කර්මයයි. එය ප්‍රකාශ කරණ විභක්තිය කර්ම විභක්තියයි.

දෙමළා,'බල්ලන්' මැරී.

මෙහි මැරී යනු ක්‍රියාවයි, ඊට යටත්වන හෙවත් මැරීම ලබන්නා ප්‍රකාශ කරණ නාමපදය බල්ලන් යනුයි. එබැවින් 'බල්ලන්' කියා කර්ම විභක්තියෙන් යොදනලදි.

කොලුවා 'පොල්ල' කඩයි.

(a) සුඛ අවබෝධය, පහසුවෙන් වැටහීම,

* වෘක්ෂයතෙමේ, ගඞ්ගාතොමෝ යනාදි වශයෙන් පුරාණ භාෂාව අනුව අප්‍රාණික ශබ්දවලින් පරවද තෙමේ තොමෝ යන දෙක ලියති.

මෙහි කඩනු ලබන්නේ හෙවත් කඩයි යන ක්‍රියාවට යටත් වන්නේ පොල්ලයි. එබැවින් 'පොල්ල' යනු කර්ම විභක්තියෙන් යෙදුනේයි.

කුරුල්ලෝ 'ගෙඩිය' කෑවෝය. පණ්ඩිතයෝ 'සත්‍යය' කියති, බළල්ලු 'මීයන්' කති. බළල්ලු මීයන් දුටුවෝ, මේ පාඨවල 'ගෙඩිය' 'සත්‍යය' 'මීයන්' යන මේ නාමපද කෑවෝ. කියති, කති, දුටුවෝ යන ක්‍රියාවලට යටත් යන බැවින් කර්මවිභක්තියෙන් යොදන ලදී. මෙසේ යම් තැනක ක්‍රියාවකට යටත් වන නාමයක් හෙවත් කර්තෘ කරණ ක්‍රියාව විඳින නාමයක් තිබේ නම් එය කර්ම විභක්තියෙන් යොදන බව සැලකිය යුතුයි.

මෙන් යන නිපාතය සමග යෙදීමෙහිදී නාමයේ අගින් කර්ම විභක්තිය යොදනු ලැබේ.

'යුරෝපීයයන් මෙන් ද්‍රවිඩයෝ යුධ දක්ෂයෝ නොවෙති. මෙහි 'මෙන්' යන නිපාතය සමග යෙදුන බැවින් 'යුරෝපීයයන්' කියා කර්ම විභක්තිය විය.

ප්‍ර - කර්ම විභක්තිය කවර අර්ථයක යොදනු ලැබේද? 'බළල්ලු මීයන් කති' මෙහි 'මීයන්' යනු කුමක් හෙයින් කර්ම විභක්ති වීද? දෙමළා බල්ලන් මැරුවේ' 'කොලුවා පොල්ල කඩයි' 'පාර්සි රටවාසීහු ගිනි දෙවියන් පුදති.' මේ පාඨවල කර්ම විභක්ති කවරේද? කුකුළා, ලීය, මේ ශබ්ද දෙක කර්ම විභක්ති වෙන්ට පාඨ යෙදිය හැකිද?

කර්ම විභක්ති අර්ථයෙහි සම්ප්‍රදාන විභක්තිප්‍රත්‍යය වශයෙන් දක්වූ විභක්ති ප්‍රත්‍යයයෝද වැටෙති. 'ගෙට ගියෝය' 'ගමට ආවේය'. මෙහි ගියේය, ආවේය යන ක්‍රියාවලට කර්මයවූ ගේ, ගම් යන නාමවලින් පරව සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යය වශයෙන් දක්වූ 'ට' 'අට' යනු යෙදී තිබේ. එබැවින් සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යය වශයෙන් දක්වූ විභක්ති ප්‍රත්‍යයද කර්මාර්ථයෙහි සමහර තැනක යෙදෙන බව සැලකිය යුතුයි.

INSTRUMENTAL කර්තෘ විභක්තිය.

ක්‍රියාව කරන්නා ප්‍රකාශකරණ නාමය කර්තෘ විභක්තියෙන් යොදනු ලැබේ.

'බඹරා රොන්ගත් මල,

මෙහි 'ගත්' යන ක්‍රියා ශබ්දයේ කර්තෘ බඹරායි. එබැවින් 'බඹරා' යන නාමය කර්තෘ විභක්තියෙන් යොදන ලදී.

'කාලිදාස කවිවරයා' කළ කුමාරසම්භව කාව්‍යය, මෙහි 'කළ' යන ක්‍රියා ශබ්දයේ කර්තෘ කාලිදාස 'කවිවරයා' යනුයි. එහෙයින් 'කාලිදාස කවිවර' යන නාමය කර්තෘ විභක්තියෙන් යොදන ලදී.

වඩුවන් තනන ගේ, රජුන් කළ අණ, ගෙඩිය වැටුන බිම, රථය ගිය මාර්ගය, මේ පාඨවල තනන, කළ, වැටුන, ගිය යන මේ ක්‍රියා ශබ්දවල කර්තෘවූ වඩුවන්, රජුන්, ගෙඩිය, රථය යන නාම කර්තෘ විභක්තිවලින් යුක්තයි.

කර්තෘ විභක්තියේ අග 'විසින් යන නිපාතය ඇතැම් තැන්වල යෙදේ. විසින් යනු කර්තෘ විභක්තිය අඟවන සලකුණක් ලෙස සැලකිය යුතුයි.

වඩුවා 'විසින්' තනන ගේ, ගොවියන් 'විසින්' කෙටූ හේන ප්‍රථමා විභක්තියත් කර්තෘ විභක්තියත් දෙකෙන්ම ක්‍රියාවක් කරන්නා ප්‍රකාශ කරයි. මෙහි වෙනස ක්‍රියාධිකාරයේ දක්වන්නෙමු.

සමග, සහ, හා වන නිපාතද සමග යන අර්ථය අඟවන එක්ව, කැටුව යනාදියද යෙදෙන විට කර්තෘ විභක්තිය යොදනු ලැබේ.

'චාණක්‍ය පණ්ඩිතයා' සමග චන්ද්‍රගුප්ත රජ මිත්‍රව සිටියේය. නිවුල පණ්ඩිතයා 'කාලිදාස කවිවරයා' සහ මිත්‍රව සිටියේයි. සිංහලයෝ 'දෙමළුන්' හා නොයෙක් කාලවල යුද්ධ කළෝය. රාම කුමාරයා, 'ලක්ෂ්මණ කුමාරයා' කැටුව වනයට ගියේය.

මේ පාඨවල සමග, සහ, හා, කැටුව යන ශබ්දවලට පෙරටුව යෙදුන චාණක්‍ය පණ්ඩිතයා, කාලිදාස කවිවරයා, දෙමළුන්, ලක්ෂ්මණ කුමාරයා, යන පද කර්තෘ විභක්තියෙන් යෙදුනේයි.

ප්‍ර - කර්තෘ විභක්තිය කවර අර්ථයක යෙදේද? 'බඹරා' රොන් ගත් 'මල' මෙහි බඹරා යනු කර්තෘ විභක්තියෙන්

යොදන්නට කරුණු කිම? ගොනා, වඩුවා යන ශබ්ද දෙක කර්තෘ විභක්තිවෙන්ට ක්‍රියා ශබ්ද දෙකක් යෙදිය හැකිද? විසින් යනු කුමන විභක්තියෙන් අඟවන ශබ්දයක්ද? සමග, හා, කැටුව, යනාදිය සමග කුමන විභක්තියක් යෙදේද? 'පණ්ඩිතයන් ලියූ පොත්, කොළ වැටුන පොළොව, දරුවා නිදා සිටින ඇඳ, හීවිට ගිය තැන' මේ පාඨවල කර්තෘ විභක්ති කවරේද?

AUXILIARY කරණ විභක්තිය.

1. යම් ක්‍රියාවක් කිරීමට අතිශයින්ම උපකාරවන දෙයක් ප්‍රකාශ කරන නාමය කරණ විභක්තියෙන් යෙදේ.

වඩුවා 'වෑයෙන්' ලීය සැස්සේය.

ගොවියෝ 'දෑකැතිවලින්' ගොයම් කපති.

මෙහි සැස්සේය, කපති යන ක්‍රියා කිරීමට වෑය, දෑකැති යන ද්‍රව්‍ය අතිශයින්ම උපකාර විය. එබැවින් වෑය දෑකැති යන නාම දෙක 'වෑයෙන්' 'දෑකැතිවලින්' කියා කරණ විභක්තියෙන් යොදන ලදි.

පාඨශාලාව 'ශිෂ්‍යයන්ගෙන්' බැබළුනේය.

ගොවියෝ 'මීමුන්ගෙන්' කුඹුරු හාති.

මෙහිද බැබළුනේය, හාති යන ක්‍රියා කිරීමට ශිෂ්‍යයන් මීමුන් උපකාරවූ බැවින් 'ශිෂ්‍යයන්ගෙන්' 'මීමුන්ගෙන්' කියා කරණ විභක්ති යොදන ලදි.

2. යම් කාලයකින් යම් ක්‍රියාවක් කොට නිමවනු ලැබේද ඒ කාලාර්ථ ශබ්දයද කරණ විභක්තියෙන් යෙදේ.

ක්ෂණය, මොහොත, දවස, මාසය යනාදි නාම කාලාර්ථ ශබ්දයි.

දූතයා මොහොතකින් ආවේය.

මෙහි ආවේය යන ක්‍රියාවකර නිමවූ කාලය මොහොතයි. එය 'මොහොතකින්' කියා කරණ විභක්තියෙන් යොදන ලදි.

චන්ද්‍රයා 'විසිනව දවසකින්' රාසි චක්‍රය ඉක්මවයි.

මෙහි 'ඉක්මවයි' යන ක්‍රියාව කර නිමවන කාලය විසිනව දවසක් යනුයි. එය 'විසිනව දවසකින්' කියා කරණ විභක්තියෙන් යෙදුනේය.

3. යමක් හේතුකොට ගෙන යමක් සිඬ වේ නම් ඒ හේතුව ප්‍රකාශ කරණ නාමයද කරණ විභක්තියෙන් යෙදේ.

'විද්‍යාවෙන්' යසස ලැබේ. 'ධනයෙන්' වංශවත් වෙති.

මෙහි යසස ලැබීමට හේතුවූ විද්‍යාවත් වංශවත් වීමට හේතුවූ ධනයත් ප්‍රකාශ කරණ 'විද්‍යා' 'ධන' යන නාම දෙක 'විද්‍යාවෙන්' 'ධනයෙන්' කියා කරණවිභක්තියෙන් යෙදුනේය.

4. උපලක්ෂණාර්ථයෙහිද කරණ විභක්තිය යෙදේ. උපලක්ෂණය නම් යමක පෙණෙන ලක්ෂණයෙකි.

ඒ පුරුෂයා නිර්‍ඝෘණයෙන් සිටී.

මෙහි නිර්‍ඝෘණබව පුරුෂයා කෙරෙහි පෙණෙන ලක්ෂණයකි. එය 'නිර්‍ඝෘණයෙන්' කියා කරණ විභක්තියෙන් යොදනලදි.

5. ක්‍රියාවිශෙෂණය අඟවන ශබ්දද කරණ විභක්තියෙන් යෙදේ.

ක්‍රියා විශෙෂණය නම් ඉක්මන්, පමා ආදි ක්‍රියාවේ යම්කිසි අමුතු සවභාවයක් අඟවන ශබ්දයි.

'අශ්වයෝ තදින් දුවති, සර්පී විෂ ඉක්මනින් පැතිරේ'.

මෙහි දුවති, පැතිරේ යන ක්‍රියාවල වෙනස් සවභාවයක් 'තදින්, ඉක්මනින්, යන ශබ්දවලින් ප්‍රකාශ වේ. එබැවින් තද, ඉක්මන් යන ශබ්ද දෙක කරණ විභක්තියෙන් යොදනලදි.

6. යමකින් යුකත වේ නම් එය කරණ විභක්තියෙන් යෙදේ.

පාඨශාලාව 'ශිෂ්‍යයන්ගෙන්' යුක්තයි. හෙවත් සමන්විතයි. මෙහි 'ශිෂ්‍යයන්ගෙන්' යනු යුක්තාර්ථයෙහි කරණ විභක්තියි.

ප්‍ර - කරණ විභක්තිය යෙදෙන පළමුවැනි විධිය කිම? උපලක්ෂණාර්ථ යනු කුමක් ද? පළමුවැනි විධියෙත් තුන් වැනි විධියෙත් එකිනෙකට ඇති වෙනස කිම? උභ දහදවසකින් යයි, ඇසින් රූප දකිති, පවින් නිරයේ උපදිති, ඒ අය නිරන්තරයෙන්ම එයි. මේ පාඨයන්හි තිබෙන කරණ විභක්ති කොයි කොයි අර්ථවල යෙදුනේද?

DATIVE
සම්ප්‍රදන විභක්තිය.

1. යමෙකුට දෙනු ලැබේද, ප්‍රිය කෙරේද, දරාද ඒ දීම ආදියට නිමිත්ත වූ නාමය සම්ප්‍රදන විභක්තියෙන් යොදනු ලැබේ.

ශිෂ්‍යයා 'ගුරුවරයාට' සතුටු පඬුරු දෙයි. මහත්මයා 'වැඩකරුවන්ට පඩි දෙයි.

මෙහි සතුටු පඬුරු ලැබූ 'ගුරුවර' යන නාමයද පඩි ලැබූ 'වැඩකරු' යන නාමයද 'ගුරුවරයාට''වැඩකරුවන්ට' කියා සම්ප්‍රදන විභක්තියෙන් යොදන ලදි.

'ගසට' වතුර ඉසී, මෙහිද ගස වතුර ලබන සෙයින් 'ගසට' කියා සම්ප්‍රදන විභක්තියෙන් යොදන ලදි.

පියා 'පුත්‍රයාට' ප්‍රියයි, ගුරුවරයා 'ශිෂ්‍යයාට' සතුටුයි. මෙහි ප්‍රිය වීමට නිමිතත්වූ පුත්‍ර, ශිෂ්‍ය යන නාම දෙක 'පුත්‍රයාට' 'ශිෂ්‍යයාට' කියා සම්ප්‍රදන විභක්තියෙන් යොදන ලදී.

වැඩකරුවා 'මහත්මයාට' කුඩය අල්ලයි, වැඩකරුවා 'සවාමියාට' බර උහුළයි, මෙහි 'මහත්මයාට, සවාමියාට' යන සම්ප්‍රදන විභක්ති දැරීම් අර්ථයෙහි විය. 'වැඩකරුවා මහත්මයාට කුඩය අල්ලයි' කී විට මහත්මයාට වැඩකරුවා කුඩය දරන බව හැඟේ.

2. කෝප (a) ඊර්ෂ්‍යා (b) වැරදීම් (c) යන මේ අර්ථයන්හිද සම්ප්‍රදන විභක්ති යෙදේ.

යමෙකුට කෝප, ඊර්ෂ්‍යා, වරද කරණු ලැබේද ඒ අය ප්‍රකාශ කරන නාමයද සම්ප්‍රදන විභක්තියෙන් යොදනු ලැබේ.

නයා මනුෂ්‍යයාට (a) කිපුනේය. දුර්ජනයා සත්පුරුෂයාට (b) ඊර්ෂ්‍යාවෙන් සිටී. මම උඹට (c) වරද්දමි.

මෙහි ඉංග්‍රීසි අක්ෂරවලින් සලකුණු කළ මනුෂ්‍යයාට යනාදිය කෝප ආදි අර්ථයන්හි යෙදුන සම්ප්‍රදන විභක්තියි.

3. දේශනා කිරීම (a) කීම (b) සුදුසු (c) ආශීර්වාද (d)* හැරීම හෙවත් යැවීම (e) සෑහීම (f) ප්‍රයෝජන (g) යන මේ අර්ථයන්හිද සම්ප්‍රදන විභක්තිය යෙදේ.

---

* ආශීර්වාදය නම් යමක් පැතීමයි.

යමෙකුට දේශනා කිරීම් ආදිය වේ නම් ඒ ද සම්ප්‍රදන විභක්තියෙන් යොදනු ලැබේ.

ලොකයාට (a) භික්ෂූහු දම් දෙසති. ඔහුට (b) දැනුමැතිකම් කීවේය. පණ්ඩිතයන්ට (c) ඉවසීම සුදුසුයි හෙවත් යෝග්‍යයි, දරුවන්ට (d) අභිවෘධියක් වේවා, පියා පුත්‍රයාට (e) පනිවිඩ හැරියේය හෙවත් යැවීය, මේ හාල් තුන් දෙනෙකුට (f) සෑහෙයි, රෝගාතුරයාට (g) ඖෂධය ප්‍රයෝජනයි.

මෙහි ඉංග්‍රිසි අක්ෂරවලින් සලකුණු කළ ලොකයාට යනාදිය දේශනා ආදි අර්ථයන්හි යෙදුන සම්ප්‍රදන විභක්තියි.

4. ණය හිමියාද සම්ප්‍රදන විභක්තියෙන් යොදනු ලැබේ. මම 'වෙළෙන්දට' රුපියලක් ණයව සිටිමි, අශ්ව වෙළෙන්ද 'මහත්මයාට' අශ්වයෙක් ණයයි.

මෙහි ණය හිමියා වූ වෙළෙන්ද, මහත්මයා යන නාමදෙක 'වෙළෙන්දට' 'මහත්මයාට' කියා සම්ප්‍රදන විභක්තියෙන් යොදන ලදි.

5. යමක් ප්‍රයෝජනය කරගෙන යම් ක්‍රියාවක් කරණු ලැබේ නම් එයද සම්ප්‍රදන විභක්තියෙන් යොදනු ලැබේ. 'යුධයට' සැරසුනෝය, කටුවැල්බටු 'බෙහෙතට' ගනිති.

මෙහි සැරසීම යුධය ප්‍රයෝජන කරගෙණ කරණ ක්‍රියාවකි. හෙවත් යුධය පිණිස කරණ ක්‍රියාවකි. එබැවින් යුධයට කියා සම්ප්‍රදන විභක්තිය විය.

කටුවැල්බටු බෙහෙත ප්‍රයෝජනය කරගෙන හෙවත් බෙහෙත් පිණිස ගන්න බැවින් 'බෙහෙතට' කියා සම්ප්‍රදන විභක්තිය විය.

'කෑමට' ගියා. 'දෙන්නට ගෙණාවෝ'. යනාදියද සම්ප්‍රදන විභක්තියි.

ප්‍ර - සම්ප්‍රදන විභක්තිය යෙදෙන ප්‍රකාරය අඟවන පළමු වැනි සූත්‍රය කවරේද? දෙවෙනි සූත්‍රය කිම? මම ඔහුට සතුටු වෙමි. සත්‍යය කාට අප්‍රිය වේද? හිඟන්නාට ධනය දේ, ළමයාට කුඩය අල්ලයි, රජුන්ට පඬුරු යැවුවෝයි, භික්ෂූන්වහන්සේ දායකයාට ධර්මය දෙසූසේක, සිරිවද්දනහාමි අනඳහාමිට

කුපිත විය, දුෂ්ට මිනිහා කාටත් ඊෂ්‍යාවෙන් සිටී. මේ පාඨයන්හි තිබෙන සම්ප්‍රදන විභක්ති කවර අර්ථවල යෙදුනේද? මිනිහා, නයා, හාල්, බත් යන මේ නාමවලින් සම්ප්‍රදන විභක්ති ඇති පාඨ කවරේද?

ABLATIVE අවධි විභක්තිය.

1. යමකින් පහවීමේදී ඒ පහවන ඉම අවධි විභක්තියෙන් යොදනු ලැබේ.

ශිෂ්‍යයා 'පාඨශාලාවෙන්' ගියේය.

ශිෂ්‍යයා 'පාඨශාලාවේ සිට එයින්' පහවූ බව හෙවත් අහක්වූ බව මෙයින් හැඟේ. ශිෂ්‍යයාගේ පහවීමට ඉම වූයේ පාඨශාලාවයි. එබැවින් 'පාඨශාලාවෙන්' කියා අවධි විභක්තිය යෙදුනේය.

'මලින්' සුවඳ නික්මේ, ලේනා 'අත්තෙන්' වැටුනේය. ගොනා 'ගාලෙන්' ආවේය.

මෙහිද නික්මීම, වැටීම, ඒම යන ක්‍රියාවලට සීමාවූ මල, අත්ත, ගාල යන ශබ්ද මලින්, අත්තෙන්, ගාලෙන් යයි අවධි විභක්තියෙන් යොදන ලදි.

2. යමෙකුගෙන් ගැණීම (a), ඉපදීම (b), පහළවීම (c) ඇසීම (d), ඉගෙණීම (e), වැළකීම (f), රැකීම (g), ප්‍රශ්නකිරීම හෙවත් ඇසීම (h), යන මේ අර්ථවලද අවධි විභක්තිය යෙදේ.

වෙළෙන්දගෙන් (a) බඩු ගත්තා, සත්‍රීන්ගෙන් (b) දරුවෝ උපදිති, ශ්‍රීකාන්තාව කිරි මුහුදින් (c) පහළ විය. භික්ෂූන්වහන්සේගෙන් (d) බණ අසයි, ගුරුවරයාගෙන් (e) ශාස්ත්‍ර උගණිති, සුරාපානයෙන් (f) වැළකිය යුතුයි, කොටින්ගෙන් (g) ගවයන් රැකගනිති, ගුරුවරුන්ගෙන් (h) ශිෂ්‍යයෝ ශෙල්කවල අර්ථ කෙසේදැයි විචාරති.

මේ වාක්‍යවල වෙළෙන්දගෙන් යනාදි ඉංග්‍රීසි අක්ෂරවලින් සලකුණු කළ පද ගැණීම් ආදි අර්ථයන්හි පිළිවෙළින් යෙදුන අවධි විභක්තියි.

3. දුර, ශුඬ, මිදීම, ප්‍රමාණ යන අර්ථයන්හිද අවධි විභක්තිය යෙදේ.

මම ඔහු 'දුරින්' දුටුවෙමි, මව්පිය 'දෙවංශයෙන්' ශුඬ තැනැත්තා, 'මාරබන්ධනයෙන් ' මිදුනේයි, 'දිගින්' දෙරියනයි, යනාදිය දුර ආදී අර්ථයන්හි අවධි විභක්තියෙන් යෙදුන පාඨයි.

4. රාශියකින් හෙවත් සමූහයකින් යමක් හෝ යමෙකු වෙන්කිරීමෙහිද අවධි විභක්තිය යෙදේ.

'පුවක්වලින්' එකක් දියන්.

මෙහි පුවක් රාසියකින් එක ගෙඩියක් වෙන් කොට කීමෙහි 'පුවක්වලින්' යයි විභකතිය යෙදුනේය.

'මිනිසුන්ගෙන්' රජා උතුම්.

මෙහිද මනුෂ්‍ය සමූහයකින් රජා වෙන් කර කීමෙහි 'මිනිසුන්ගෙන්' කියා අවධි විභකතිය විය.

'ඔවුන්ගෙන්' රන්හාමි හොඳ සත්පුරුෂයායි.

මෙහිද සමූහයක් අතරෙත් රන්හාමි වෙන් කර කියන විට ඒ සමූහයා ප්‍රකාශ කරන නාමය 'ඔවුන්ගෙන්' යයි අවධි විභක්තිය විය.

ප්‍ර - අවධි විභක්තිය අර්ථ කියන යෙදෙන පරිදි පළමුවැනි සූත්‍රයෙන් කියන ලද්දේද? ගසෙන් පොතු ගැලෙව්වෝය, ගවයන්ගෙන් ගොයම රැකගත යුතුයි. මෙහි තිබෙන අවධි විභක්ති කවර අර්ථවල යෙදී තිබේද? ශිෂ්‍යයෝ පාඨශාලාවෙන් ගියෝය, යන මෙහි පාඨශාලා යනු කුමක්නිසා අවධි විභක්තිවීද? දෙවෙනි සූත්‍රයේ කියනලද අවධි විභක්තිය යෙදෙන අර්ථ කවරේද? උදාහරණ කිම? කුකුළා, පෙට්ටිය යන මේ නාම දෙකින් අවධි විභක්තිය ඇති පාඨ කවරේද?

GENITIVE සම්බන්ධ විභක්තිය.

1. යමක් යමෙකුට අයිතිබව කීමෙහි අයිති තැනැත්තා හෙවත් හිමියා ප්‍රකාශ කරන නාමය සම්බන්ධ විභක්තියෙන් යොදනු ලැබේ.

'වෙළෙන්දගේ' ධනය.

මෙහි ධනය වෙළෙන්දට අයිතියි, එබැවින් 'වෙළෙන්දගේ' කියා සම්බන්ධ විභක්තිය යෙදුනේයි.

'පණ්ඩිතයාගේ ' පොත.

මෙහි පොත හිමියා පණ්ඩිතයායි. එබැවින් 'පණ්ඩිතයාගේ කියා සම්බන්ධ විභක්තියෙන් යෙදුනේයි.

"ගසේ" අත්ත.

මෙහිද අත්ත හිමි ගස 'ගසේ' කියා සම්බන්ධ විභක්තියෙන් යෙදුනේයි.

කම් විභක්තියට අයිති විභක්ති ප්‍රත්‍යයෝද සම්බන්ධ විභක්තියට අනතර්ගත වෙති.

'බුදුන් ගුණ' 'මිනිසුන් රාශියක්' 'ගොනුන් රැළක්' මෙහි බුදුන්, මිනිසුන්, ගොනුන් යනු බුදුන්ගේ, මිනිසුන්ගේ, ගොනුන්ගේ යන අර්ථයි. එබැවින් ඇතැම් තැන්වල කම් විභක්ති ප්‍රත්‍යයන්ද සම්බන්ධ විභක්ති අර්ථයෙහි යෙදෙන බව සැලකිය යුතුයි.

සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යයයෝද සම්බන්ධ විභක්තියට අයත් වෙති. 'ඔහුට' ධන තිබේ.

මෙහි ඔහුට යනු සම්බන්ධ විභක්තියි, ඔහුගේ ධන යන අර්ථයි. මෙසේ සමහර තැන්වල සම්ප්‍රදාන විභක්ති ප්‍රත්‍යයෝද සම්බන්ධ අර්ථයෙහි යෙදෙතියි දතයුතුයි.

2. සමානාර්ථයෙහිද සම්බන්ධ විභක්තිය යෙදේ.

මේ තැනැත්තා 'ගොනාට' සමානයි. 'සිංහයාට' සදෘශවූ වික්‍රම ඇති සිව්පාවෙක් නොමැතියි.

මෙහි 'ගොනාට' 'සිංහයාට' යනු සමානාර්ථයෙහි සම්බන්ධ විභක්තියි.

ප්‍ර - සම්බන්ධ විභක්තිය කුමන අර්ථයක යෙදේද? වෙළෙන්දගේ ධනය, මෙහි වෙළෙන්දගේ යනු මක්නිසා සම්බන්ධ විභක්තිය වීද? ගසේ කොළ, ගසේ කුරුල්ලෝ සිටිති. මෙහි සම්බන්ධ විභක්තිය කොයි පාඨයේ තිබේද? සම්බන්ධ විභක්තියට කවර කවර විභක්ති ප්‍රත්‍යය යෙදේද? ගොනුන් දසදෙනෙක්, ගොනුන් මැරුවෝ, ඒ ස්ත්‍රියට දරුවෝ නැත. ස්ත්‍රියට ඊර්ෂ්‍යාකළෝයි මේ පාඨවල සම්බන්ධ විභක්ති කවරේද? මක්නිසාද?

LOCATIVE ආධාර විභක්තිය

1. ක්‍රියාව යම් ස්ථානයක පවතී නම් ඒ ස්ථානය ආධාර විභක්තියෙන් යොදනු ලැබේ.

'දියේ' මත්ස්‍යයෝ සිටිති.

මෙහි, සිටිති යන ක්‍රියාව පවත්නේ දියෙහියි. එබැවින් 'දියේ' කියා දිය ශබ්දය ආධාර විභක්තියෙන් යුක්ත විය.

'සැළියේ' බත් උයති.

මෙහි උයති යන ක්‍රියාව පවත්නා ස්ථානය සැළියයි. එබැවින් 'සැළියේ' කියා ආධාර විභක්තිය යෙදුනේය.

ගොනා 'මාඟියේ' යයි, දරුවෝ 'වත්තේ' ඇවිදිති.

මෙහිද 'යයි' 'ඇවිදිති' යන ක්‍රියාවලට ආධාර වන බැවින් 'මාඟියේ, වත්තේ' යන දෙතැනම ආධාර විභක්ති විය.

මෙසේ යම් තැනක ක්‍රියාව පවතී නම් ඒ ස්ථානයට කියන නාමය ආධාර විභක්තියෙන් යෙදෙන බව සැලකිය යුතුයි.

2. යම් කාලයක් තුළ ක්‍රියාවක් පවත්නේ නම් ඒ කාලය අඟවන ශබ්දයද ආධාර විභක්තියෙන් යුක්ත වේ.

'බක් මාසේ' අඹමල් පිපේ.

මෙහි 'පිපේ' යන ක්‍රියාව පවත්නා කාලය බක් මාසයයි. එබැවින් 'බක් මාසේ' කියා ආධාර විභක්තියෙන් යොදන ලදි.

'මේ කාලේ' යුරෝපීයයෝ ලඬකාවේ වෙසෙති.

වෙසෙති යන ක්‍රියාව පවත්නා කාලය මේ කාලය යනුයි. එබැවින් 'මේ කාලේ' කියා ආධාර විභක්තියෙන් යුක්ත විය.

'මේ අවුරුද්දේ' සෙනසුරා, මේෂ රාශියේ සිටී.

මෙහි 'සිටී' යන ක්‍රියාව පවත්නා කාලයවූ අවුරුද්ද 'අවුරුද්දේ' කියා ආධාර විභක්තියෙන් යොදන ලදී.

3. යම් නැකතක් පවත්නා කාලයවූ ක්‍රියාවක් කියන විට ඒ නැකත් ශබ්දයද ආධාර විභක්තියෙන් යුක්ත වේ.

'අනඳහාමී' කැතිනැකතේ උපන්නා.

කැතිනැකත ඇති කාලයෙහි අනදහාමි උපන්නා යන අර්ථය මෙයින් හැඟේ. මෙහි නැකත් ශබ්දයට 'නැකතේ' කියා අධාර විභක්තිය යෙදී තිබේ.

'දී' යන අක්ෂරය ආධාර විභක්තිය අඟවන පිණිස ශබ්ද අග යොදන බව පෙණේ.

'ගමදී' කළ වැඩ.

මෙහි 'ගමදී' යනු ගමේ සිටින කාලයේදී යන අර්ථයි. සමහර තැන්වල ආධාර විභක්තියේ අගින්ද 'දී' යන අක්ෂරය යෙදේ. 'ගමේදී කළ වැඩේ' මෙහි 'ගමේ' යන ආධාර විභක්ති එකවචනයෙන් පරව 'දී' යන අක්ෂරය යෙදී තිබේ.

ප්‍ර - ආධාර විභක්තිය කවර අර්ථවල යෙදේද? දියේ මත්ස්‍යයෝ සිටිති, මෙහි දියේ කියා ආධාර විභකතිය කුමක් හෙයින් වීද? පළමුවැනි පැයේ කළ වැඩ, ගසේ සිටි වඳුරා, රෙහෙණේ නැකතේ උපන් දරුවා. මේ පාඨවල ආධාර විභකති කවරේද? සිරිවද්දනහාමි වෙසක් මාසේ කැතිනැකතේ හාරිස්පත්තුවේ උපන් කෙනෙකි. මෙහි තිබෙන ආධාර විභකති කවර අර්ථවල යෙදී තිබේද?

VOCATIVE ආලපන විභක්තිය

1. ආමන්ත්‍රණය කරණු ලබන්නා ආලපන විභකතියෙන් යුකත වේ.

ආමන්ත්‍රණය නම් ඉදිරිපිට නැති කෙනෙකුට අඬගැසීමය. හෙවත් ඉදිරිපිට සිටින කෙනෙකුගේ නම කියා තමන්ට අභිමුඛ කරගැණීමයි.

'පුතේ, මෙහෙ වරෙන්, 'දරුවනේ, ඉගෙණගන්ට පලයල්ලා.

මෙහි 'පුතේ, දරුවනේ' යනු ආලපන විභකතියි. ආමන්ත්‍රණය හෙවත් කැඳවීම ලබන බැවිනි.

ප්‍ර - ආලපන විභක්තිය කොතැන යෙදෙද්ද? පුතේ මෙහෙ වරෙන්, යන්නෙහි 'පුතේ' යනු මක්නිසා ආලපන විභක්තිය වීද? අම්මා, නගා, මේ ශබ්ද දෙකින් ආලපන විභක්තිය ඇති පාඨ කවරේද?

සමහර අර්ථවල විභක්ති දෙකද යෙදේ.

හයේ 'සෙනසුරා' සිටීම හොඳයි, හයේ 'සෙනසුරාගේ සිටීම' හොඳයි.

මෙහි කර්තෘ විභක්ති සම්බන්ධ විභක්ති යන දෙකම එක අර්ථයේ යෙදුනේයි.

'පණමකින්' අඟගෙඩි හතරක් ගත්තා, පණමකට අඟගෙඩි හතරක් ගත්තා.

මෙහි 'පණමකින්' කියා කරණ විභක්තියද, පණමකට කියා සම්ප්‍රදාන විභක්තියද යන දෙකම එක අර්ථයෙහි යෙදුනේයි.

'ඉක්මනින්' ආයේය. 'ඉක්මනට' ආයේය. මෙසේ ක්‍රියා විශෙෂණාර්ථයෙහිද කරණ සම්ප්‍රදාන විභක්ති දෙකම යෙදුනේය.

අනදහාමි 'රෙහෙණෙ නැකතින්' උපන්නා.

'රෙහෙණේ නැකතේ' උපන්නා.

නැගෙනහිරින් 'සිටියේය', නැගෙනහිරේ 'සිටියේය', 'දවාලෙන්' ආවා, 'දවාලේ' ආවා.

මේ පාඨවල එකම අර්ථයෙහි කරණ, ආධාර යන විභක්ති දෙක යෙදුනි.

ජාපනේ 'ගාල්ලෙන්' බොහොම දුරයි.

ජාපනේ 'ගාල්ලට' බොහොම දුරයි.

උෆරා 'වලහාගෙන්' පැරදුනා,

උෆරා 'වලහට' පැරදුනා,

'කොළඹට' හැතැප්ම 56කට පමණ දුරින් රත්නපුරය පිහිටියේය.

'කොළඹින්' හැතැප්ම 56කට පමණ දුරින් රත්නපුරය පිහිටියේය. 'මීට' අවුරුදු දොළහකට පෙර, මෙයින් අවුරුදු දෙළහකින් පෙර.

මේ පාඨවල එකම අර්ථයේ අවධි, සම්ප්‍රධාන නොහොත් සම්බන්ධ යන විභක්ති යෙදී තිබේ.

ඒ 'කාලයට' සිටි, ඒ 'කාලයේ' සිටී. මෙහි ආධාර සම්ප්‍රදන විභක්ති දෙකම යෙදෙන බව සැලකිය යුතුයි.

කිසිම විභක්ති රූපයක් නොමැතිව නාමය ඒ ඒ විභක්ති අර්ථවල ස්වකීය රූපයෙන්මත් සමහර තැන්වල යෙදේ.

'කොළඹට ගියා' යයි කම් විභක්ති ප්‍රත්‍යය ඇතිව තිබිය යුතු තැන 'කොළඹ ගියා' යයි කීයකි. මෙහි කොළඹ ශබ්දය විභක්ති රූපය නොමැතිවම කර්මාර්ථයෙහි යෙදී තිබේ.

කාව්‍ය භාෂාවෙහි විභක්ති ප්‍රත්‍යය නොමැතිව ස්වකීය රූපයෙන් ප්‍රථමා, කම් ආදි ඒ ඒ විභක්ති අර්ථවල නාම යෙදීම ඉතා බහුලයි. කථා ව්‍යවහාරයේද වාසගම්වලද ප්‍රථමා, කම්, කර්තෘ යන විභක්ති අර්ථවල විභක්ති ප්‍රත්‍යය නොයෙදී ස්වකීය රූපයෙන්ම බොහෝ තැන්වල නාම යෙදේ.

මෙහි විභක්ති යෙදෙන අර්ථ සංක්ෂේපයෙන් දැක්වීමු. විසතර ව්‍යවහාරයෙන් දතයුතු.

පදනීතියෙහි විභක්ත්‍යාධිකාරය

මෙතෙකින් නිමි.

ROOTS OF VERBS AND THEIR INFLECTIONS

ධාතු හා ප්‍රත්‍යයයෝ.

ධාතු නම් ක්‍රියාව සෑදෙන මූලයි. ක්‍රියා සෑදීමට ධාතු අගින් යෙදෙන අක්ෂර ප්‍රත්‍යයයි.

නාමයක අගින් ප්‍රත්‍යය යෙදීමෙන් ඒ ඒ විභක්ති සැදේද එසේම ධාතු අගින් ප්‍රත්‍යය යෙදීමෙන් ඒ ඒ අර්ථ ප්‍රකාශ කරණ ක්‍රියා සැදේ.

'කරති' යනු ක්‍රියාවයි, මෙහි ධාතුව කර යනුයි. 'කර' යන ධාතුව අගින් යෙදී තිබෙන 'අති' යනු ප්‍රත්‍යයයි*

* කර, අති කරති මෙහි රයන්නේ තිබෙන අකාරය ලොප්විය.

'සිටියා' මෙහි 'සිටී' යනු ධාතුවයි. එය අගින් යෙදී තිබෙන 'යා' යනු ප්‍රත්‍යයයි. 'කාපන්' යනුද ක්‍රියාවකි. මෙහි ධාතුව 'කා' යන්නයි. එය අගින් යෙදුන 'පන්' යනු ප්‍රත්‍යයයි.

මෙසේ ක්‍රියා සෑදෙන මුල්, ධාතු බවද ඒ ධාතු අගට ක්‍රියා සෑදෙන පිණිස යෙදෙන අක්ෂර ප්‍රත්‍යය බවද ධාතු වත් ප්‍රත්‍යයත් එක්වූ විට එය ක්‍රියාව බවද සැලකිය යුතුයි.

ප්‍ර - ධාතු යනු කවරේද? ප්‍රත්‍යය කිම? කරති යන මෙහි ධාතුව කිම? ප්‍රත්‍යය කවරේද? කුමක් පිණිස ධාතුව අග ප්‍රත්‍යය යෙදේද? ධාතුවක් ප්‍රත්‍යයක් එක් වූ විට ඊට කියන නම කුමක්ද? යති, දෙති, වසති, දුවයි, ඇකිළේ, මෙහි ධාතු කවරේද? ප්‍රත්‍යය කවරේද?

INTRANASITIVE AND TRANSITIVE

අකර්මක ධාතු හා සකර්මක ධාතු,

කර්මය නම් කර්තෘ විසින් කරණ ක්‍රියාව විඳින දෙයයි. හෙවත් කර්තෘගේ ක්‍රියාවට යටත්වෙන දෙයයි. යම් ධාතුවකින් සෑදෙන ක්‍රියාවක් කර්තෘත් සමග යෙදූ විට ක්‍රියා වෙන් කරණු ලබන්නක් නොමැති නම් හෙවත් කර්මයක් නොහැඟේ නම් ඒ ක්‍රියාව උපන් ධාතුව අකර්මකයි.

'ගොනා වත්තේ සිටියා' මෙහි සිටියා යන ක්‍රියාව කරණ ගොනා යන කර්තෘව මිසක් ඒ ක්‍රියාවෙන් කරණු ලබන දෙයක් නොමැතියි. එබැවින් 'සිටියා' යන ක්‍රියාව සෑදුන 'සිටී' යන ධාතුව අකර්මකයි.*

ගොනා වත්තේ සිටියා යි කීවත් වත්ත, සිටියා යන ක්‍රියාව පවත්නා ආධාරය වනු මිස කර්මයක් නොවෙයි.

'දරුවා හඬයි' මෙහිදී හඬයි යන ක්‍රියාව කරණ දරුවා යන කර්තෘ මිසක් කර්මයක් නොමැති බැවින් මේ ක්‍රියාව සෑදුන 'හඬ' යන ධාතුව අකර්මකයි.

'ගොනා තණ කයි' මෙහි 'කයි' යන ක්‍රියාවට යටත්වන දෙයක් තිබේ. එනම්, 'තණ' යනුයි. එබැවින් මේ ක්‍රියාව සෑදුන 'කා' යන ධාතුව සකර්මකයි.

---

* සිටි ධාතුවෙන් පරව 'ආ' ප්‍රත්‍යය යෙදී යකාරාගම වූවිට සිටියා කියා පදය සෑදේ.

වඩුවා ලීය 'කපයි' මෙහි කපයි යන ක්‍රියාව 'ලීය' යන කර්මයෙන් යුක්ත වේ. එබැවින් එය සෑදුන 'කප' යන ධාතුවද සකර්මකයි.

යම් ධාතුවක් සකර්මකද අකර්මකදැයි දැනගන්ට ඒ ධාතු වෙන් සෑදෙන ක්‍රියාවක් කර්තෘත් සමග යෙදිය යුතුයි. ක්‍රියාව කර්තෘත් සමග යෙදූ විට කර්මයක් ඕනෑ වේ නම් හෙවත් කර්මයක් ඇති බව හැඟේ නම් සකර්මකයි. කර්මයක් ඕන නොවේ නම් අකර්මකයි.

අකර්මක ධාතුවකින් සෑදුන 'සිටියා' යන ක්‍රියාව ගොනා යන කර්තෘ සමග යොදා 'ගොනා සිටියා' කීවිට සිටියා යන්නට කර්මයක් ඕනෑ නොවෙයි. එබැවින් එය අකර්මකයි. ගොනා තණ කයි කීවිට කන්නේ කිමදැයි කර්මයක් ඕනෑ වෙයි. හෙවත් කර්මයක් සෙවෙයි. එබැවින් 'කයි' යනු සකර්මක ධාතුවකින් සෑදුන ක්‍රියාවක් බව හැඟේ.

රඳ, නිදි, බබල යන මේ ආදි ධාතු අකර්මකයි.
කර, උය, නම, බඳ, විඳ, මර, කඩ, තන,
සද යන මේ ආදි ධාතු සකර්මකයි.

ප්‍ර - සකර්මක ධාතු යනු කිම? අකර්මක ධාතු යනු කිම? සිටි යන ධාතුව අකර්මකද? ඒ ඇයි? කඩයි, රඳයි, ලියයි, කිපෙයි, මෙහි සකර්මක ධාතුවලින් සෑදුන ක්‍රියා කිම? කයි යන ක්‍රියාව සකර්මකයයි කියන්නේ මක්නිසාද? දුවයි, මේ ක්‍රියාව සමග යෙදෙන කර්මයක් තිබේද? පිස, මර යන මේ ධාතු දෙක සකර්මකද අකර්මකදැයි පරීක්ෂා කරන්නේ කලෙසද?

ද්විකර්මක ධාතු හෙවත් කර්ම දෙකක් ඇති ධාතුද තිබේ. එනම් හර, ගණ යනාදි ධාතුයි.

මහත්මයා බඩු ගමට හරී.

මෙහි 'බඩු ගමට' යන දෙකම 'හරී' යන ක්‍රියාවේ කර්මයි. වැඩකරුවා මිදුලෙන් බඩු 'ගෙට' ගනී, මෙහිද 'ගෙට, බඩු' යන දෙක 'ගනී' යන ක්‍රියාවේ කර්මයි. මෙසේ කර්ම දෙකක් ඇති ධාතුද තිබෙන බව දතයුතුයි.

සීනි දිය කරති.

මෙහි කරති යන ක්‍රියාවට 'සීනි, දිය' කියා කම් දෙකකි. මෙයින් සීනි යනු ප්‍රකෘති කර්මයි. දිය යනු විකෘති කර්මයි. ප්‍රකෘතිය නම් සවභාවයි. 'සීනි' සවභාවයෙන් තුබුන වර්ගයක් බැවින් ප්‍රකෘති කර්මයි දිය යනු සීනි අමුතු සවභාවයකට පැමිණවීමෙන් කළ දෙයක් බැවින් විකෘති කර්මයි.

යකඩ අලු කළේය. තඹ සුදු කළේය.

මෙහිද 'යකඩ, තඹ' යන ශබ්ද ප්‍රකෘතිකම් බවත් ඒවා අමුතු සවභාවයකට පැමිණවූ බව ප්‍රකාශ කරන අලු, සුදු යන ශබ්ද විකෘතිකම් බවත් සැලකිය යුතුයි,

වතුර ලේ විය.

මෙහි 'වතුර' ලේ යන දෙකම විය යන ක්‍රියාවේ කර්තෘයි. සවභාවයෙන් තුබුන බැවින් 'වතුර' යනු ප්‍රකෘති කර්තෘයි. අමුතු සවභාවයකට පැමිණි දෙයක් බැවින් 'ලේ' යනු විකෘති කර්තෘයි. කුමාරයා රජ වී, මෙහිද කුමාරයා යනු ප්‍රකෘති කර්තෘයි. රජ යනු විකෘති කර්තෘයි.

මෙසේ යම් දෙයක් හෝ යමෙක් අමුතු සවභාවයකට පැමිණි බව කිමෙහි පූර්වයෙන් තුබුන දෙය ප්‍රකෘති කර්මය හෝ කර්තෘ වෙන බවත් ඒ වෙනස ප්‍රකාශ කරණ නාමය විකෘති කර්මය හෝ කර්තෘ වෙන බවත් සැලකිය යුතුයි.

TENSES AND PERSONS

කාලත්‍රය හා පුරුෂත්‍රය.

කාලය - අතීත, වර්තමාන, අනාගතයි තුන් ප්‍රකාරයි.

පසුගිය කාලය අතීත කාලයයි, දැන් පවත්නා කාලය වර්තමාන කාලයයි. මතු පැමිණෙන කාලය අනාගත කාලයයි.

කර නිම වූ ක්‍රියාව අතීත කාල ක්‍රියාව නම් වේ.

සිරිසඟබෝ රජ තෙමේ 'ලඞ්කා රාජ්‍යය' කෙළේය.

මෙහි කෙළේය යන ක්‍රියාව පූර්වයෙහි කොට නිමවූ ක්‍රියාවකි. එබැවින් අතීත කාල ක්‍රියායි.

වඩුවෝ ගේ තැනුවෝ, අපි ගියෙමු.

යන මේ ක්‍රියාද කර නිමවූ බැවින් අතීත කාල ක්‍රියායි.

පටන්ගෙණ කරලා ඉවර නුවූ ක්‍රියාව වර්තමාන කාල ක්‍රියා නමි.

ඉංග්‍රීසි ජනයෝ ලඬකාවේ සිටිති.

මෙහි 'සිටිති' යනක්‍රියාව වර්තමාන කාල ක්‍රියාවකි. මක්නිසාදයත්? ඉංග්‍රීසි ජනයන්ගේ සිටීම් තවම පවත්නා බැවිනි.

පණ්ඩිතයෝ පොත් 'ලියති', දරුවා 'නිදයි'.

මෙහි තිබෙන 'ලියති, නිදයි' යන දෙකම කර නිමවූ ක්‍රියාත් නොව පටන් නොගත් ක්‍රියාත් නොව පටන්ගෙන කෙළවර නොවී කරණ ක්‍රියා බැවින් වර්තමාන කාල ක්‍රියායි.

මතු කරන ක්‍රියාව අනාගත කාලක්‍රියාවයි.

දරුවා අවුරුද්දකින් 'එන්නෙමි'යි කියා ගියේය.

මෙහි තිබෙන 'එන්නෙමි' යන ක්‍රියාව අනාගත කාල ක්‍රියාවකි. මක්නිසාදයත්? දරුවාගේ ඒම කළාවූ හෝ පටන්ගත්තාවූ ක්‍රියාවක් නොව අවුරුද්දකින් පසු කරණ ක්‍රියාවක් බැවිනි.

උඹ මගේ වැඩේ කවද කරන්නෙහිද? වෙළෙන්ද කවද බඩු ගන්නේද?

මේ වාක්‍යවල තිබෙන 'කරන්නෙහි, ගන්නේ' යන ක්‍රියා දෙකත් මත්තට කරණ ක්‍රියා බැවින් අනාගත කාල ක්‍රියායි.

ප්‍රථම පුරුෂ, මධ්‍යම පුරුෂ, උත්තම පුරුෂයයි පුරුෂ තුනක් වේ. මේ පුරුෂ තුනට අන්‍යකාරක, තශබ්දකාරක, මශබ්දකාරකයයිද කියති.

තමනුත් නොව තෝ, උඹ, තමුසේ යන ශබ්දවලින් කියවෙන ඉදිරිපිට සිටින කෙනෙකුත් නොව අන් කෙණෙකු විසින් කරණු ලබන ක්‍රියාව ප්‍රථම පුරුෂ ක්‍රියාවයි.

උෆ කපයි, ගොනා තණ කයි.

මෙහි 'කපයි, කයි' යන ක්‍රියා දෙකම මම, තෝ, උඹ යනාදි කෙණෙක් නොව අන්‍ය කෙනෙක් කරන ක්‍රියායි. එබැවින් ප්‍රථම පුරුෂ ක්‍රියායි.

ඔව්හු ගියෝ, පණ්ඩිතයෝ පොත් ලියති.

මේ ක්‍රියාද ප්‍රථම පුරුෂ ක්‍රියායි.

තෝ, උඹ, තමුසේ යන ශබ්දයකින් යුකත ක්‍රියා මධ්‍යම පුරුෂ ක්‍රියායි.

තෝ 'ගියෙහි' තොපි 'ගියෙහු' නුඹලා 'යන්නාහු' තමුසේලා 'උගත්තහු'

මේ ක්‍රියාවල කර්තෘ තෝ, තොපි, නුඹලා, තමුසේලා යන ඉදිරිපිට සිටින අය බැවින් මධ්‍යම පුරුෂ ක්‍රියායි.

මම, අපි යන ශබ්දවලින් යුක්තවන ක්‍රියා උත්තම පුරුෂ ක්‍රියායි.

මම ගියෙමි. අපි කෙළෙමු.

මෙහි 'ගියෙමි, කෙළෙමු' යන ක්‍රියා දෙකම මම, අපි යන ශබ්දවලින් ප්‍රකාශ කරණ අයගේ ක්‍රියා බැවින් හෙවත් තමන් කරණ ක්‍රියා බැවින් උත්තම පුරුෂ ක්‍රියායි.

මෙසේ ක්‍රියාවේ කාල තුනක්ද පුරුෂ තුනක් ද තිබේ.

ප්‍ර - කාලය කී වැදෑරුම්ද? අතීත යනු කිම? කෙළේ යනු අතීත කාල ක්‍රියාවකැයි කියන්නේ මන්ද? වර්තමාන කාලය කුමක්ද? ලියති යන්න වර්තමාන කාල ක්‍රියායයි කියන්නේ කුමක් හෙයින්ද? අනාගත කාලය යනු කුමක්ද? ගියේය, ආවේය, එන්නේය, කරයි, දුවයි, කියන්නේය. මේ ක්‍රියා කොයිකාලවලට අයිතිද?

ප්‍රථම පුරුෂය කවරක්ද? ගියෙමි, මේ කවර පුරුෂ ක්‍රියාවක්ද? උත්තම පුරුෂය යනු කිම? තෝ, තමුසේ, මේ කවර පුරුෂද? යමි, යත්, යෙහි, මේ කවර පුරුෂ ක්‍රියාද?

TERMINATION.

පුරුෂත්‍රයට අයිති අතීත කාල ක්‍රියා ප්‍රත්‍යයයෝ.

	Singular එකවචන	බහුවචන Plueral
ප්‍රථම පුරුෂ	Third Person ඊ, ඒ, ආ	ඕ, හු, හ
මධ්‍යම පුරුෂ	Second Person එහි	හු
උත්තම පුරුෂ	First Person එමි, එම,ඉමි	එමු, ම්හ, මු, මෝ

පුරුෂත්‍රයට අයිති වර්තමාන කාල ක්‍රියා ප්‍රත්‍යයයෝ.

ප්‍රථම පුරුෂ - ඉ, ඒ, අත්, ඉත්, එත්, අති, ඉති, එති
මධ්‍යම පුරුෂ - එහි, හි, හු
උත්තම පුරුෂ - මි, එමි, මූ, ම්හ, එමු

පුරුෂත්‍රයට අයිති අනාගත කාල ක්‍රියා ප්‍රත්‍යයයෝ.

ප්‍රථම පුරුෂ	- අන්නේ	අන්නෝ
මධ්‍යම පුරුෂ	- අන්නෙහි	අන්නහු
උත්තම පුරුෂ	- අන්නෙමි, අන්නෙමු, නෙමු, න්නමෝ	

PAST TENSE

අතීත කාල ක්‍රියා - වස ධාතුව

	එකවචන	බහුවචන
ප්‍රථම	- උෆ විසී, විසූයේ, විසුවේ	ඔවුහු විසූහ, විසුවෝ
මධ්‍යම	- තෝ විසුයෙහි, විසුවෙහි	තොපි විසුවහු,
උත්තම	- මම විසීමි	අපි විසීමු, විසුම්හ

(විසුයෙමි, විසුවෙමි, විසීමි, විසුයෙම්, විසුවෙම්)

මේ ක්‍රියාවල ධාතුව 'වස' යනුයි. මේ ධාතුවෙන් පරව අතීත කාල ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා ප්‍රත්‍යයවූ 'ඊ' යන්න තැබූ විට 'වසඊ' කියා පෙණේ. ධාතුවේ සයන්නේ තිබෙන සවරය ලොප් කළ විට 'වස්ඊ' කියා පෙණේ. ඊ යන ප්‍රත්‍යය සයන්නට ආරූඪ කළ විට 'වසී' කියා වේ. වයන්නේ සවරය විපර්‍යාස වීමෙන් ඉයන්න වූ විට 'විසී' කියා අතීත කාල ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියාව සිද්ධ වේ. පූර්වස්වරලොප සන්ධි විධිය සවර විපර්‍යාසය යන ව්‍යාකරණ විධි දෙකින් මේ ක්‍රියාව සිද්ධ වූ බව පෙණේ.

අතීත කාල අන්‍යකාරක එකවචන 'ඒ' ප්‍රත්‍යය වස ධාතුවෙන් පරව තැබූ විට 'වස ඒ' කියා වේ. යකාරාගමය වූ විට 'වස ය් ඒ' කියා වේ. යයන්නට ඒයන්න ආරූඪ කළ විට 'වයසේ' කියා වේ. වන්නේ තිබෙන අයන්න සවර විපර්‍යාසයෙන් ඉයන්න වී සයන්නේ තිබෙන අයන්නත් උයන්න වූ විට 'විසුයේ' යන ප්‍රථම පුරුෂ අතීත කාල එකවචන ක්‍රියාව සිද්ධ වේ. විසුවේ යන ක්‍රියාපදයේ

සිඬියත් මෙසේමයි. එහි වෙනස වයන්නක් ආගම වීම පමණයි. විසූහ, විසුවෝ යනාදි ක්‍රියාපදවල සිඬියත් මෙලෙස දතයුතුයි. ×

දුව ධාතුවේ අතීත කාල ක්‍රියා.

	එකවචන	බහුවචන.
ප්‍රථම	- උෆ දිවී, දිව්වේ	ඔව්හු දිව්වෝ, දිව්හු, දිව්හ
මඬ්‍යම	- තෝ දිව්වෙහි	තොපි දිව්හු,
උත්තම	- මම දිවීමි, දිව්වෙමි, දිව්යෙමි.	අපි දිව්වෙමු, දිවුම්හ

දුව ධාතුවෙන් පරව 'ඊ' ප්‍රත්‍යය තැබූ විට 'දුව ඊ' කියා වේ. වයන්නේ සවරය ලොප් කොට පූර්‍වසවර ලොප සන්ධි ක්‍රමයෙන් 'ඊ' ප්‍රත්‍යය දුව යන ධාතුවට ගැළපූ විට 'දුවී' කියා වේ. දයන්නේ පිළිපෙරැළි කළ කල 'දිවී' කියා අන්‍ය කාරක අතීත කාල එකවචන ක්‍රියාව සැදේ.

දුව ධාතුවෙන් පරව ඒ ප්‍රත්‍යය තැබූ විට 'දුව ඒ' කියා වේ. දුව ධාතුවේ අග සවරය ලොප් කළ විට 'දුව් ඒ' කියා පෙණේ. වයන්න ද්විත්ව කළ විට 'දුව්ව් ඒ' කියා වේ. පසුව ද්විත්ව වූ වයන්නට ඒ ප්‍රත්‍යය සවර සන්ධි ක්‍රමයෙන් පැමිණවූ විට 'දුව් වේ' කියා වේ. දුයන්නේ පිහිටි උයන්න සවර විපර්‍යාස ක්‍රමයෙන් ඉයන්න කළ කල 'දිව්වේ' යන අතීත කාල ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියාව සැදේ. මේ ක්‍රියාවේ පදසිඬිය වීමට ද්විත්ව රූපවිධිය ඕනෑ විය.

සෙසු ක්‍රියාපදයන්ගේ පදසිඬියත් මෙසේම දතයුතුයි. දිව්හු යනාදි ක්‍රියාපදවල ධාතු අන්තය ලොප් වීමෙන් හා පිළි විපර්‍යාසයෙන් පමණක් පදසිඬිය වන බව පෙණේ.

ප්‍ර - වස යන ධාතුවෙන් අතීත කාල ප්‍රථම පුරුෂ එක වචන ක්‍රියාව කී ප්‍රකාරයකට සැදේද? ඒවා සැදෙන්නේ කෙලෙස ද? වස ධාතුවට ඕ යන ප්‍රථම පුරුෂ බහුවචන ප්‍රත්‍යය වැටී ක්‍රියාව සැදෙන්නේ කෙලෙසද? මී, එමි, එහි,

---

× ඉතිරි ක්‍රියාපද සැදෙන පරිදිත් ගුරුවරුන් විසින් ලියා පෙන්විය යුතුයි.

මිහ යන මේ ප්‍රත්‍යයයන් වැටී ක්‍රියා සෑදෙන්නේ කෙලෙසද? 'විසූහ' යන ක්‍රියාපදය කෙසේ සිඬ වේ ද? දුව ධාතුවෙන් ක්‍රියා සෑදෙන විට වන අමුතු වෙනස කිම? දිව්වෝ, දිවුම්හ මේ ක්‍රියාපද සෑදුනේ කෙසේද? විසුවෙහි, විසුමු, විසුවේ, විසිමි - මේ ක්‍රියා කවර පුරුෂවලට අයත් කවර වචන ක්‍රියාද? කොට, කප, පිස යන මේ ධාතුවලින් අතීත කාල පුරුෂත්‍රයට අයත් ක්‍රියා සෑදෙන්නේ කෙලෙසද? නැගී, නැගීමි, ඇමුණු වෝ, ඇමුණුවෙහි, ඉරුවෝ, ඉරුවෙමි, ඇවිද්දේ, ඇවිද්දෙහි ඇවිද්දහු - මේ ක්‍රියා කවර ධාතුවලින් සෑදුන කවර පුරුෂ යන්ට අයත් කවර වචන ක්‍රියාද? වස ධාතුවට අතීත කාල ප්‍රථම පුරුෂ එකවචන ඒ, ඒ, ප්‍රත්‍යයයන් ගළපා සිඬ කළ ක්‍රියා කෙසේද?

PRESENT TENSE.

වර්තමාන කාල ක්‍රියාපද.

වස ධාතුව.

	එකවචන.	බහුවචන.
3	ප්‍රථම ... ඌ වසයි, වෙසේ,	ඔවුහු වසති, වසත්, වෙසෙති, වෙසෙත්
2	මධ්‍යම ... තෝ වෙසෙහි;	තොපි වසහු
1	උත්තම ... වසමි, වසම්, වෙසෙමි, වෙසෙම්,	අපි වසමු, වසම්හ වෙසෙමු

වස ධාතුවෙන් පරව වර්තමාන කාල ප්‍රථම පුරුෂ එක වචන ක්‍රියා ප්‍රත්‍යය තැබූ විට 'වස ඉ' කියා වේ. යකාරය ආගම වූ විට 'වසය ඉ' කියා වේ. යයන්න ඉයන්නට පැමිණුවූ විට 'වසයි' කියා වර්තමාන කාල ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියාව සෑදේ. මේ ක්‍රියාවද ආගම සන්ධි විධියෙන් සිඬ විය.

වස ධාතුවෙන් පරව ඒ යන ප්‍රත්‍යය තැබූ විට "වස ඒ" කියා වේ. සයන්නේ සවරය ලොප් කළ විට 'වස් ඒ' කියා වේ. සයන්න ඉයන්නට පැමිණුවූ විට වසේ කියා වේ. වයන්නේ අසන්න පිළිපෙරළි විධියෙන් ඒයන්න වූ කල වෙසේ යන ප්‍රථම පුරුෂ වර්තමාන කාල එකවචන ක්‍රියාව සෑදේ. සෙසු ක්‍රියාවල පදසිඬියත් මෙසේමයි.

වස ධාතුවෙන් පරව වර්තමාන කාලය ප්‍රථම පුරුෂ බහු වචන ක්‍රියා ප්‍රත්‍යයවූ අන් යන්න තැබූ විට 'වස අන්' කියා වේ. ප්‍රත්‍යයේ අකාරය ලොප් කළ විට 'වසන්' යයි පද සිද්ධිය වේ.

ප්‍ර - වස ධාතුවෙන් ප්‍රථම පුරුෂ වර්තමාන කාල එක වචන ක්‍රියා කීයක් සෑදේද? සෑදෙන්නේ කෙසේද? වෙසෙහි, වෙසෙමි, වසමි යන ක්‍රියාපද කවර පුරුෂ කවර කාල කවර වචන ක්‍රියාද? පදසිද්ධිය කෙලෙසද? දුවයි, දිවේ, දුවති, දුවමි, දුවහු, මේ ක්‍රියා කෙසේ සිද්ධ වීද? මේ ක්‍රියාවල ධාතු, පුරුෂ, වචන, කාල කවරේද? කර ධාතුවෙන් වර්තමාන කාල පුරුෂ තුණට අයිති ක්‍රියා කෙසේ සෑදේද? තවරයි, තවරති, තවරමි, තවරහු, නික්මෙහි, මිදෙහි, මේ කවර ධාතුවලින් සිද්ධ කවර ක්‍රියාද?

FUTURE TENSE

අනාගත කාල ක්‍රියාපද.

වස ධාතුව.

	එකවචන	බහුවචන.
3 ප්‍රථම	- ඌ වසන්නේ,	ඔව්හු වසන්නාහු, වසන්නෝ,
2 මධ්‍යම	- තෝ වසන්නෙහි,	තොපි වසන්නහු,
1 උත්තම	- මම වසන්නෙමි්, වසන්නෙමි,	අපි වසන්නමු, වසන්නෙමු, වසන්නමෝ.

වස ධාතුවෙන් පරව ප්‍රථම පුරුෂ අනාගත කාල එක වචන ක්‍රියා ප්‍රත්‍යයවූ 'අන්නේ' යනු තැබූ විට 'වස අන්නේ' කියා පෙණේ. අකාරය ලොප් කළ විට 'වසන්නේ' කියා ප්‍රථම පුරුෂ අනාගත කාල එකවචන ක්‍රියාව සෑදේ. සෙසු ක්‍රියාවල පදසිද්ධියත් මෙසේයි.

ප්‍ර - වස ධාතුවෙන් ප්‍රථම පුරුෂ එකවචන අනාගත කාල ක්‍රියාපදය කෙසේ සෑදේද? වසන්නහු යනු කවර පුරුෂ කවර වචන ක්‍රියාවක්ද? දුව ධාතුවෙන් අනාගත කාල ක්‍රියා සෑදෙන්නේ කෙසේද? කියන්නෙමි, කියන්නහු, මේ කවර කාල ක්‍රියාද? දෙඩන්නේ, නගන්නේ, කපන්නෝ, එවති, සරසන්නෙහි, කඩන්නෙහි, උසුලන්නෙමි, උසුලන්නාහු, ඉසුලුවෝ, මේ ක්‍රියාපදවල ධාතු, පුරුෂ, කාල, වචන කිම? උදුරමි, ඉදිරි, උදුරති, උදුරමු, උසුලත්,

කළඹන්නෙමි, කිමිදියේ, නැවැත්තේය, දරයි, දරන්නේ මේ ක්‍රියාපද කවර කාලයන්ට අයිතිද?

වස ධාතුවේ ප්‍රථම පුරුෂ අතීත කාල එකවචන ක්‍රියාව 'විසී' කියා සිඬ වෙන නමුත් කස ධාතුවෙන් තැනෙන ක්‍රියාව 'කැසී' කියා වේ. 'කිසී' කියා නොයෙදේ. කර ධාතුවේ ප්‍රථම පුරුෂ අතීත කාල එකවචන ක්‍රියාව 'කෙළේ' කියා සෑදේ. මෙහි ධාතුවේ රකාරයට ළකාරය ආදේශ විය. නමුත් වස ධාතුවේ ක්‍රියාපදය මෙන් 'කිළී' කියා ඊ ප්‍රත්‍යය නොයෙදේ. මේ නිසා ව්‍යවහාරයට අනුව ප්‍රත්‍යය යොද ක්‍රියාපද සාදගත යුතුයි.

සිංහයා සිව්පාවෙකි, තෝ සොරෙකි, මම කුමාරයෙක්මි මේ පාඨවල නාම අගින් ඒ ඒ පුරුෂවලට අයත් ක්‍රියා ප්‍රත්‍යය යෙදී තිබෙන බව සැලකිය යුතුයි.

ඌත් මමත් කීවෙමු, උඹත් මමත් යමු, ඌත් තෝත් ඇළහු, ඌත් තෝත් මමත් කරමු.

මෙසේ පුරුෂ දෙක තුන සම්බන්ධ ක්‍රියා යෙදෙන පරිදි දත යුතුයි.

දස දවසකින් මහත්මයාගේ පොත ලියා දුනිමි.

මේ පාඨයේ 'දුනිමි' යන ක්‍රියාවේ කර්තෘපදය යොද නොමැතියි. නමුත් දුනිමි යන ක්‍රියාව උත්තම පුරුෂයට අයත් බැවින් උත්තම පුරුෂ එකවචනවූ 'මම' යන්න අධ්‍යාහාර වශයෙන් ගත යුතුයි.

BENEDICTIVE MOOD.
ආශීර්වාද ක්‍රියාව.

යමක් පැතීමෙහි ව්‍යවහාර කරණ ක්‍රියාව ආශීර්වාද ක්‍රියායි. යම් ක්‍රියාවකින් මතු යමක් වීමට කරණ ප්‍රාර්ථනාවක් හැඟේ නම් එය ආශීර්වාද ක්‍රියායයි දත යුතුයි.

ආශීර්වාද ක්‍රියාවද අන්‍ය ශබ්ද, තෂබ්ද, මශබ්ද, යන කාරකත්‍රය භජනය කෙරෙයි. මේ කාරකත්‍රයට අයිති වර්තමාන ක්‍රියා ප්‍රත්‍යය අගින් 'වා' යනු යෙදූ විට ආශීර්වාද ක්‍රියා වේ.

ඌ සුවසේ වෙසේවා, සතුරා මැරේවා, මෙහි තිබෙන වෙසේවා, මැරේවා, යන ක්‍රියා දෙක ආශීර්වාද ක්‍රියායි.

'වෙසේවා' කී විට වාසය කිරීම යම්කිසිවෙකුගේ ප්‍රාර්ථනාවක් බව හැඟේ. මවක් තමන් පුත්‍රයා චිර කාලයක් 'සුවසේ වෙසේවා' යයි කීයේ නම් ඒක මවගේ ප්‍රාර්ථනාවකි. 'සතුරා මැරේවා' කී විටද සතුරාගේ මරණය යමෙක් කරණ ප්‍රාර්ථනාවක් බව හැඟේ.

'වෙසේ, මැරේ' යන ප්‍රථම පුරුෂ වර්තමාන කාල එක වචනය අගින් 'වා' යන ප්‍රත්‍යය යෙදූ විට 'වෙසේවා, මැරේවා, යන ප්‍රථම පුරුෂ එකවචන ආශීර්වාද ක්‍රියාවල පදසිධිය වේ.

'ඔවුහු වෙසෙත්වා, සතුරෝ මැරෙත්වා, තෝ වෙසෙහිවා, තොපි වසහුවා, මම වෙසෙම්වා, අපි වසමුවා'.

මෙසේ ප්‍රථම පුරුෂ බහුවචන ආශීර්වාද ක්‍රියාද උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ආශීර්වාද ක්‍රියාද යෙදෙන පරිදි දත යුතුයි.

ප්‍ර - ආශීර්වාද ක්‍රියාව කුමක්ද? එය සෑදෙන්නේ කෙලෙසද? වස ධාතුවේ පුරුෂත්‍රයට අයිති ආශීර්වාද ක්‍රියා කෙසේද? දිලෙම්වා, සැපතක් වේවා, ගමට යෙහිවා, කෙරෙත්වා, මේ කවර ධාතුවලින් සෑදුන කවර පුරුෂ ආශීර්වාද ක්‍රියාද? දිවේ, කෙරේ, හඬත්, මේ ක්‍රියා කුමක් කළ විට ආශීර්වාද ක්‍රියා වේද? කප, බණ, යන ධාතු දෙකින් සෑදෙන තශබ්ද මශබ්ද ආශීර්වාද ක්‍රියා කෙසේද?

IMPERATIVE MOOD
විධි ක්‍රියාව

යමෙකුට විධාන කිරීමෙහි ව්‍යවහාර කරණ ක්‍රියාව විධි ක්‍රියායි.

යම් ක්‍රියාවකින් යමෙකුට කරන විධානයක් හෙවත් නියෝගයක් හැඟේ නම් ඒ ක්‍රියාව විධි ක්‍රියායි.

මේ ක්‍රියාවේ එකවචනයට 'අ,ව' යන ප්‍රත්‍යය දෙක හා බහුවචනයට 'අව්' යන ප්‍රත්‍යයද යෙදේ.

තෝ වැඩ කරව, තොපි වැඩ කරව්.

මෙහි 'කරව, කරව්' යන ක්‍රියා දෙකින්ම වැඩ කිරීමට නියෝග කරණ බව හැඟේ. මහත්මයෙක් තමන්ගේ වැඩ

කරුවාට,'තෝ මේ වැඩේකරව' කියා කීවේ නම් ඒක මහත්මයා විසින් තමන් වැඩකරුවාට කළ නියෝගයක් වේ. මෙසේ නියෝග කිරීමෙහි ව්‍යවහාර කරන ක්‍රියාව විධි ක්‍රියායි.

කර ධාතුවෙන් පරව 'ව' යන ප්‍රත්‍යය තැබූ විට 'කරව' යන ක්‍රියාව සෑදේ. කර ධාතුවට අගින් 'අව්' ප්‍රත්‍යය තැබුවිට 'කර අව්' කියා පෙණේ. අකාරය ලොප් කළ විට 'කරව්' යන ක්‍රියාව සෑදේ.

'යව්, කව්' යන ක්‍රියා 'යා, කා' ධාතු දෙකින් පරව අව් ප්‍රත්‍යය පූර්ව්ස්වර ලොප සන්ධි ක්‍රමයෙන් ගැළපී සිඬවූ බව පෙණේ.

තෝ දුව, තෝ කර, යනාදි තැන්වල 'අ' ප්‍රත්‍යය යෙදී තිබේ.

වර්තමාන කථා ව්‍යවහාරයෙහි එකවචනයට 'පන්, පිය' යන ප්‍රත්‍යය දෙකද බහුවචනයට 'පල්ලා, පියව්' යන ප්‍රත්‍යය දෙකෙද යෙදේ.

උඹ කරපන්, තෝ කරපිය, උඹ කාපන්, තෝ කාපිය, මේ ක්‍රියාපදවල 'පන්, පිය' යන ප්‍රත්‍යය යෙදී තිබේ.

උඹලා 'කරපල්ලා', තොපි 'කරපියව්', උඹලා 'කාපල්ලා', තොපි 'කාපියව්'

මේ ක්‍රියාවල 'පල්ලා, පියව්' යන ප්‍රත්‍යය යෙදී තිබේ.

ප්‍ර - විධික්‍රියා යනු කුමක්ද? එහි ප්‍රත්‍යය කිම? කව්, කරව් යන ක්‍රියා කෙසේ සිඬ වීද? වෙසෙති, යති, කත්වා, හඬව, මරමි, තළාපිය, දුවපිය, දිවේවා, මේ ක්‍රියා කවරේද කර, යා යන ධාතුවල විධි ක්‍රියා කෙසේද?

CONDITIONAL MOOD.

අසම්භාවන ක්‍රියාව.

1. අනියමාඛ්‍යෙහි ව්‍යවහාර කරන ක්‍රියාව අසම්භාවන ක්‍රියා නමි.

යම් ක්‍රියාවකින් ඒ ක්‍රියාව කිරීම නියත නොවන බව හැඟේ නම් එය අසම්භාවන ක්‍රියාවයි.

අසම්භාවන ක්‍රියාවේ පුරුෂ භෙදයද එකවචන බහුවචන භෙදයද නොමැතියි.

තත්, තොත්, ඔත් යන තුණ ධාතු අගින් අසම්භාවන ක්‍රියාවේ ප්‍රත්‍යය මෙන් යෙදේ.

මරතත් සත්‍යවාදියෝ බොරු නොකියති.

මෙහි 'මරතත්' යන ක්‍රියාවෙන් මැරීමේ නියමයක් නොහැඟේ. එබැවින් 'මරතත්' යනු අසම්භාවන ක්‍රියායි.

නුවණැති කුඩා දරුවන් ඉගෙණීමට උත්සාහ කරතොත් පණ්ඩිතයන් වීම දුෂ්කර නොවෙයි.

මෙහිද 'කරතොත්' යන ක්‍රියාවේ නියමයක් නොමැතියි.

වැසි 'වැස්සොත්' ගඟ පිරේ.

මෙහි 'වැස්සොත්' යන ක්‍රියාව පවතී යන නියමයක් හෝ නොපවතී යන නියමයක් නොහැඟේ.×

වස ධාතුව අගින් ඔත් ප්‍රත්‍යය තැබූ විට 'වස ඔත්' කියා පෙණේ. සකාරය ලිඛ වූ විට 'වස්ස ඔත්' කියා පෙණේ. ඔයන්න ලිඛවූ සකාරයට පැමිණවූ විට 'වස්සොත්' කියා පෙණේ. වයන්නේ පිළිපෙරැළිව ඇයන්න වූවිට 'වැස්සොත්' කියා ක්‍රියාපදය සෑදේ.

2. කාලාඊයෙහිද අසම්භාවන ක්‍රියාව යෙදේ.

යම් ක්‍රියාවකින් ඒ ක්‍රියාව පවත්නා කාලය හැඟේ නම් එය කාලාඊ අසම්භාවන ක්‍රියායි දතයුතුයි.

ද්දී, ආම යන ප්‍රත්‍යය දෙක කාලාඊසම්භාවන ක්‍රියාවට යෙදේ.

කුකුළන් ගස් යද්දී + මම ආවෙමි.

මෙහි 'යද්දී' යන ක්‍රියාවෙන් යන කාලය හැඟේ. කුකුළන් ගස් යන කාලයේ යන අර්ථයි.

ඉර 'බසිද්දී' වැස්සේය.

× ත ප්‍රත්‍යය අසම්භාවන ක්‍රියාවේ ප්‍රත්‍යයකි. අසම්භාවන ක්‍රියාව අනියමාඊ කාලාඊ දෙකේහිම යෙදෙන බැවින් අනියමාඊ අසම්භාවන ක්‍රියාව වඩා ව්‍යක්ත කරන පිණිස 'හොත්' යන අනියමාඊ නිපාතයක් යොදා කරතහොත්, යතහොත් යනාදි වශයෙන් ව්‍යවහාර කරති. දැන් අසම්භාවන ක්‍රියාවට යෙදෙන තත්, තොත් යන ප්‍රත්‍යය දෙකම මේ හොත් යන නිපාතයත් ත යන ප්‍රත්‍යයත් ලොපාදියෙන් එකට ගැළපී සිඬ වීයයි හැඟේ. ඔත් යනුද හොත් යන නිපාතයේ හකාර ලොපයෙන් වීයයි හැඟේ.

+ ත් යන අසම්භාවන ක්‍රියා ප්‍රත්‍යයත් දී යන ආධාරාඊය හඟවන ප්‍රත්‍යයත් පරරූප විධියෙන් ගැළපී 'ද්දී' කියා සිඬවී යයි හැඟේ. යත් - දී යද්දී.

මෙහි බසිද්දී යන ක්‍රියාවෙන් ඉර බසින කාලය හැඟේ. 'ඉර බසින කල වැස්සේය' යන්නත් 'ඉර බසිද්දී වැස්සේය' යන්නත් සමානාර්‍ථයි.

ඉර බැස්සාම මම එමි, වර්‍ෂාව වැස්සාම පොකුණ පිරේ.

මෙහි 'බැස්සාම, වැස්සාම' යන ක්‍රියා දෙකිනුත් බැස්සාවු කාලයද වැස්සාවු කාලයද හැඟේ.

බසිද්දීයයි කී විට බැසීම පවත්නා කාලයත් බැස්සාම කී විට බැසීම කර ඉවරවු කාලයත් හැඟේ. එබැවින් 'ද්දී' යන ප්‍රත්‍යයෙන් ක්‍රියාව පවත්නා කාලයත් 'ආම' යන ප්‍රත්‍යයෙන් ක්‍රියාව අවසන්වු කාලයත් හැඟේ. ×

බස ධාතුවේ අග සකාරස්ථ අකාර ලොප්ව සකාරයට ව්‍යඤ්ජන සන්ධි ක්‍රමයෙන් 'ආම' යන ප්‍රත්‍යය ගැළපී බයන්නේ ස්වරය විපර්‍යාසව ඇයන්න වූ විට බැස්සාම කියා පද සිද්ධියවේ.

ගියාම, කළාම, බැලුවාම, කෑවාම යන ක්‍රියාපදයන්ගේ පදසිද්ධියද යට දැක්වූ පූර්‍වස්වරලොප ස්වරාදේශ සන්ධික්‍රමාදියෙන් වන බව දත යුතුයි.

කියහැකි, කළහැකි, යනාදියද අනියමාර්‍ථ අසම්භාවන ක්‍රියායි. කියහැකියයි යන්නද කියතොත් හැකි යන අර්‍ථයි. කව්වල හා පුරාණ සිංහල වාසගම්වලත් අනියමාර්‍ථ කාලාර්‍ථ අසම්භාවන ක්‍රියාවන්හි 'ත' යන ප්‍රත්‍යය යෙදී තිබේ.

ප්‍ර - අසම්භාවන ක්‍රියාව කුමක්ද? කාලාර්‍ථයේ යෙදෙන්නේ කවර ක්‍රියාවක්ද? අසම්භාවන ක්‍රියාවේ ප්‍රත්‍යයෝ කවරහුද? කීවාම, කියද්දී, මේ දෙක කවර අර්‍ථවල අසම්භාවන ක්‍රියාද? කරතොත්, කරාවි යන ක්‍රියා දෙකේ වෙනස කිම? කරතොත් යන්නට අසම්භාවන ක්‍රියායයි කියන්නේ මන්ද?

PAST PARTICIPLE.

පූර්‍ව ක්‍රියාව

එක කර්‍තෘ කෙනෙක් කරන ක්‍රියා දෙකක් හෝ වැඩි ගණනක් ඇතොත් ඒ ක්‍රියාවලින් පළමු කරන ක්‍රියා පූර්‍ව ක්‍රියායි.

× බැස්සාම යානාදි තැන්වල තිබෙන 'ම' යන්න කාලාර්‍ථ වාචකවූ සමය ශබ්දයෙන් බිඳී පවතීයයිද සිතිය හැකියි. බබළත්ම යනාදි වශයෙන් පුරාණ පොත්වලද කාලාර්‍ථ අසම්භාවන ක්‍රියා අගින් මේ ප්‍රත්‍යය යෙදී තිබේ.

අ, ආ, අලා, ආලා, අගෙන, ආගෙන යන ප්‍රත්‍යයෝ පූර්ව ක්‍රියාවට යෙදෙති.

වඩුවෝ වැඩ කර ගමට ගියෝය.

මෙහි කර, ගියෝයයි ක්‍රියා දෙකකි. මේ ක්‍රියා දෙකේම කර්තෘ වඩුවෝ යනුයි. මේ ක්‍රියා දෙකින් පසුව කළ ක්‍රියාව 'ගියෝ' යනුයි. ඊට පෙරටුව කළ ක්‍රියාව 'කර' යනුයි. එබැවින් එය පූර්ව ක්‍රියාවයි. ගියෝ යනු අපර ක්‍රියාවයි.

කර ධාතුවෙන් පරව පූර්ව ක්‍රියා ප්‍රත්‍යයවූ 'අ' යන්න යෙදී කර යන පූර්ව ක්‍රියාව සෑදේ.

ගෑනු දරුවෝ හිස 'පීරා බැඳගෙන', බත් 'කාලා' විද්‍යා ශාලාවට අවෝය.

මෙහි පීරා, බැඳගෙන, කාලා, ආවෝයයි, ගෑනු දරුවෝ යන එකම කර්තෘ කරන ක්‍රියා සතරකි. පසුව කළ ක්‍රියාව හෙවත් අපර ක්‍රියාව 'ආවෝ' යනුයි. 'පීරා, බැඳගෙන, කාලා' යන ක්‍රියා තුනම ආවෝ යන ක්‍රියාව කිරීමට පූර්වයෙන් කළ ක්‍රියායි එබැවින් ඒ තුනම පූර්ව ක්‍රියායි.

හුලං වැදිලා පාන නිවුණි.

මෙහි වැදිලා යන පූර්ව ක්‍රියාවේ කර්තෘ 'හුලං' යනුයි. නිවුනි යන අපර ක්‍රියාවේ කර්තෘ පාන යනුයි. මෙසේ හින්න කර්තෘක පූර්ව ක්‍රියා පදද තිබේ.

ප්‍ර - පූර්ව ක්‍රියා යනු කුමක්ද? පූර්ව ක්‍රියාවේ ප්‍රත්‍යය කිම? උත්සාහ කරලා ශාස්ත්‍ර උගනිති, ඖෂධ බීලා ලෙඩ සුවකර ගණිති, මේ පාඨවල පූර්ව ක්‍රියා කවරේද? දිව, කප, විඳ යන ධාතුවලින් පූර්ව ක්‍රියා තිබෙන පාඨ කවරේද?

PRESENT PARTICIPLE.

මිශ්‍ර ක්‍රියාව

අන්‍ය ක්‍රියාවක් සමග මිශ්‍රවූ ක්‍රියාව මිශ්‍ර ක්‍රියා නමි. ක්‍රියා දෙකක් එක කර්තෘ කෙනෙක් එකවිට කරතොත් එයින් එකක් මිශ්‍ර ක්‍රියාව වේ.

මිශ්‍ර ක්‍රියාවට 'මින්' ප්‍රත්‍යය යෙදේ.

ඒ මිනිහා කථා කරමින් ගියේයි.

මෙහි කථා කිරීම යාම සමග මිශ්‍ර විය. හෙවත් යාමත් කථා කිරීමත් එකවිට කළ බව පෙණේ. එබැවින් 'කරමින්' යනු මිශ්‍ර ක්‍රියාවයි.

'කරමින්' සිටියා, 'කියමින්' ලීවා, 'බණිමින්' ගියා යනාදියද මිශ්‍ර ක්‍රියායි.

කකා ආවා, කිය කියා දුන්නා,

මෙහි 'කකා, කිය කියා' යන පූර්ව ක්‍රියා මිශ්‍ර ක්‍රියාථීයේ යෙදුනේය. 'කකා ආවා' කී විට කෑමත් ඒමත් දෙක එකවිට කළ බව හැඟේ.

කා යන පූර්ව ක්‍රියාව ද්විත්වවූ විට 'කාකා' කියා වේ. එක පූර්ව ක්‍රියාව දෙකවූ විට පූර්වයෙන් තිබෙන ක්‍රියාවේ අග ස්වරය බොහෝ සේ හ්‍රස්වවේ. එකල 'කකා' කියා පදසිද්ධිය වේ.

ප්‍ර - මිශ්‍ර ක්‍රියාව කුමක්ද? ඒ මිනිහා කථා කරමින් ගියා, මෙහි කරමින් යන්නට මිශ්‍ර ක්‍රියාය කියන්නේ ඇයි? ඒ ක්‍රියාවේ ප්‍රත්‍යය කුමක්ද? වස, දුව යන ධාතුවලින් මිශ්‍ර ක්‍රියා ඇති පාඨ කවරේද? පූර්ව ක්‍රියාවෙත් මිශ්‍ර ක්‍රියාවෙත් එකිනෙකට ඇති වෙනස් කිම?

CAUSAL FORM
ප්‍රයෝජ්‍ය ක්‍රියාව

යම් ක්‍රියාවක් අනුන් ලවා කරවනු ලැබේ නම් එය ප්‍රයෝජ්‍ය ක්‍රියා නමි.

යට දැක්වූ ක්‍රියාවල ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර 'ව' යන ප්‍රත්‍යය ලූ කල ප්‍රයෝජ්‍ය ක්‍රියාව සෑදේ.

වැඩකරුවා දරුවා 'හඬවයි'

මෙහි හඬන්නේ දරුවා වුවත් ඒ හැඬීම දරුවාගේ ඕනෑකමින් කරන ක්‍රියාවක් නොව 'වැඩකරුවා' විසින් කරවන බව හැඟේ. එබැවින් 'හඬවයි' යනු ප්‍රයෝජ්‍ය ක්‍රියායි.

මහත්වරු කම්කරුවන් ලවා 'වැඩ කරවති'.

මෙහිද වැඩ කරන්නේ දෙමළුන් වුවත් ඒ කිරීම මහත්වරුන් විසින් කරවන බව හැඟේ. එබැවින් 'කරවති' යනු ප්‍රයෝජ්‍ය ක්‍රියායි.

මෙසේ යම් ක්‍රියාවක් කී විට එය අනුන් ලවා කරවන ක්‍රියාවක් බව ඒ ක්‍රියාවෙන්ම හැඟේ නම් ප්‍රයෝජ්‍ය ක්‍රියායයි සැලකිය යුතුයි.

හඬ ධාතුවෙන් වර්තමාන කාල ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියාව හඬයි කියා සෑදේ. මේ ක්‍රියාවේ ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර 'ව' යන ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය යෙදූ විට 'හඬවයි' යන වර්තමාන කාල ප්‍රථම පුරුෂ එකවචන ප්‍රයෝජ්‍ය ක්‍රියාව සෑදේ.

තෝ දරුවා 'හඬවයි'[1] තොපි 'හඬවහු' මම 'හඬවමි' අපි 'හඬවමු' 'හඬවාවා' 'හඬවත්වා' 'හඬවහිවා' 'හඬවම්වා' 'හඬවව්' 'හඬවතොත්' 'හඬවාලා' 'හඬවමින්'.

මෙසේ ප්‍රථම මධ්‍යම උත්තම යන පුරුෂත්‍රයෙහිද ආශිර්වාද, විධි, අසම්භාවන ආදි ක්‍රියා විෂයෙහිද ධාතු ප්‍රත්‍යය මැද 'ව' ප්‍රත්‍යය වැටීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියාව සෑදෙන පරිදි දතයුතුයි.

ප්‍රයෝජ්‍ය ක්‍රියාව කරන්නා ප්‍රකාශ වෙන පදයෙන් පරව 'ලවා' යන නිපාතය සමහර තැනක යෙදේ.

වැඩකරුවා ලවා වැඩ කරවති.

මෙහි කරවති යන ක්‍රියාව කරන වැඩකරුවා යන පදයෙන් පරව 'ලවා' යන නිපාතය යෙදුනේයි.

අකර්මක ධාතුවකින් ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් වූවිට එය සකර්මක වෙයි.

මහත්මයා දරුවා හඬවයි.

හඬ යන ධාතුව අකර්මක වුවත් 'හඬවයි' යනු ප්‍රයෝජ්‍ය ක්‍රියාව බැවින් දරුවා යනු මේ ක්‍රියාවේ කර්මය බව සැලකිය යුතුයි. මහත්මයා යනු කර්තෘයි.

සකර්මක ධාතුවකින් ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් වූවිට කර්ම දෙකක් වෙයි.

---

1. ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා මධ්‍යම පුරුෂ එක වචනයෙහිද වෙනස් නොව කිසි තැනක යෙදෙන බැවින් හඬවයි කියාද මධ්‍යම පුරුෂ එකවචන ක්‍රියාව යෙදිය හැකියි.

මහත්මයා පුතාට බත් කවයි.

මෙහි 'කවයි' යන ක්‍රියාවේ කර්තෘ මහත්මයා යනුයි. පුතාට, බත් යන දෙක කර්මයි.

විකර්මක ධාතුවලින් සෑදෙන ප්‍රයෝජ්‍ය ක්‍රියාවට කර්ම තුනක් ඇති වෙයි.

ගුරුවයා පුතා ලවා අතවැස්සාට පද නීතිය උගන්වයි. මෙහි පුතා, අතවැස්සාට, පද නීතිය කියා කර්ම තුනකි.[1]

ප්‍ර - ප්‍රයෝජ්‍ය ක්‍රියාව යනු කුමක්ද? ප්‍රයෝජ්‍ය ක්‍රියාව සෑදෙන්නේ කෙලෙසද? වැඩකරුවා දරුවා හඬවයි. මෙහි හඬවයි යන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාය කියන්නේ ඇයි? දුවති, දුවතොත්, ලියවතොත්, වැඩකෙරෙව්වෝ, ලියවමි, ලීවේය, මෙහි ප්‍රයෝජ්‍ය ක්‍රියා කවරේද? වසමි, කත්, දෙමු, දෙතොත් යන මේ ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා කරන්නේ කෙලෙසද? අකර්මක ධාතුවකින් ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් වූවිට මක්වේද? මහත්මයා වැඩකරුවා ගෙදර සිටුවා රට ගියේයි. මෙහි සිටුවා යන ක්‍රියාව සකර්මකද? අකර්මකද? මක්නිසාද? පියා පුතා ලවා වැඩකරුවාට තළවයි. මෙහි තළවයි යන ක්‍රියාවේ කර්ම කීයද?

උක්ත කර්තෘ හා අනුක්ත කර්තෘ.

ක්‍රියාව කරන්නාවූ කර්තෘ අසවල් පුරුෂයයි ඒ ක්‍රියාවෙන්ම හැඟේ නම් ඒ කර්තෘ උක්ත කර්තෘයි.

කෙළෙමි කී විට මේ කර්තෘ උත්තම පුරුෂයවූ 'මම යන්න බව ක්‍රියාවෙන්ම හැඟේ. 'කෙළෙහි' කී විට මෙහි කර්තෘ මධ්‍යම පුරුෂ ඒකවචනය වූ 'තෝ' යන්න බව ක්‍රියාවෙන්ම හැඟේ. කෙළේ යන ක්‍රියාවේ කර්තෘ ප්‍රථම පුරුෂ එකවචනයවූ 'ඌ' යන්න බව එයින්ම හැඟේ.

---

1. මාගධ සංස්කෘත භාෂාවන්හි ප්‍රයෝජ්‍ය ක්‍රියාව කරන්නා කර්තෘ විභක්තියෙන්ද කර්මවිභක්තියෙන්ද යෙදේ. මෙහෙයුම් ලද ක්‍රියාව කරන්නා කර්තෘයයි සිඳත් සඟරාවේ එකතැනකින් පෙණේ. තවත් තැනකින් ප්‍රයෝජ්‍ය ලද තැනැත්තා කර්මයයි. හැඟේ. සිංහල භාෂාවේ කර්ම කර්තෘ විභක්ති දෙකම බොහෝ සෙයින් එක ස්වරූපයි. සංස්කෘත භාෂාවේ ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ කර්මය සම්ප්‍රදාන විභක්තියෙන්ද ඇතැම් තැනක යෙදේ.

මෙසේ ක්‍රියාවක් කරන්නා අසවල් පුරුෂයා බව ක්‍රියාවෙන්ම හැඟේ නම් ඒ ක්‍රියාවේ කර්තෘ උක්තයයි දත යුතු. උක්ත කර්තෘව ප්‍රථමා විභක්තියෙන් යෙදේ.

ඔවුහු නැවෝ, අපි කෙළෙමු, පණ්ඩිතයෝ පොත් කරති.

මෙහි 'කැවෝ', 'කෙළෙමු' 'කරති' යන ක්‍රියාවලින් උක්ත වන බැවින් 'ඔවුහු' 'අපි' 'පණ්ඩිතයෝ' යන ශබ්ද ප්‍රථමා විභක්තියෙන් යෙදුනේය.

බඹරු රොන් ගනිති, වඩුවෝ ගෙවල් තනති, ලීය පෙරළේ, ගෙඩිය ඉදේ, ඔවුහු ජීවත් වෙත්වා, මම පණ්ඩිත වෙම්වා, තෝ යව, තොපි යව්, මම වැඩ කරමි.

මේ පාඨවල තිබෙන ක්‍රියාවලින් ඒ ක්‍රියා කරණ කර්තෘවරුන් උක්තවන බැවින් බඹරු, වඩුවෝ, ලීය යනාදිය ප්‍රථමා විභක්තියෙන් යුක්ත විය.

පුරුෂත්‍රයට අයිති ත්‍රෛකාලික ක්‍රියා විධික්‍රියා ආශිර්වාද ක්‍රියා යන මේ ක්‍රියාවල කර්තෘ ඒ ක්‍රියාවලින් උක්තවන බැවින් ප්‍රථමා විභක්තියෙන් යොදන බව සැලකිය යුතුයි.

යම් ක්‍රියාවකින් එය කරණ කර්තෘ නොහැඟේ නම් හෙවත් නොකියවේ නම ඒ ක්‍රියාවේ කර්තෘ අනුක්ත කර්තෘ නම්.

කපන ගස.

මෙහි තිබෙන කපන යන ක්‍රියාවෙන්ම ඒ ක්‍රියාව කරන්නාවූ කර්තෘ කවරෙක්දැයි නොහැඟේ. කපමි යයි කීවොත් එහි කර්තෘ 'මම' යන උත්තම පුරුෂය බව හැඟෙන්නාක් මෙන් 'කපන' යන ක්‍රියාවේ කර්තෘ අසවල් පුරුෂයයි නොහැඟේ. එබැවින් 'මා විසින් කපන ගස' කියා හෝ 'තා විසින් කපන ගස' කියා හෝ 'උ විසින් කපන ගස' කියා හෝ කිය හැකියි. මෙසේ කපන යන ක්‍රියාවෙන් උක්තවන කර්තෘවක් නොමැති බැවින් එහි කර්තෘ කොයි පුරුෂය වෙන්ටත් පුළුවන.

අනුක්ත කර්තෘව කර්තෘ විභක්තියෙන් යොදනු ලැබේ.

මිනිසුන් කළ වැඩේ, වඩුවන් තැනූ ගෙය, බඹරුන් රොන් ගත් මල, කළ වැඩේ, තා විසින් ලියූ ලියුම.

මේ පාඨවල තිබෙන කළ තැනූ, ගත්, ලියූ යන ක්‍රියාවලින් ඒ ක්‍රියා කරණ කර්තෘ උක්ත නොවන බැවින් මිනිසුන්, වඩුවන්, බඹරුන්, යනාදි වශයෙන් ඒ ක්‍රියා කරන්නාවු කර්තෘවරු කර්තෘවිභක්තියේ යුක්ත කරණ ලද්දේයි.[1]

මෙසේ කර්තෘකාරක ක්‍රියාවලින් කර්තෘව උක්ත වන්නාක් මෙන් කර්මකාරක ක්‍රියාවෙන් කර්මය උක්ත වේ.

ප්‍ර - උක්ත කර්තෘ යනු කුමක්ද? උක්ත කර්තෘ කුමන විභක්තියකින් යොදනු ලැබේද? අනුක්ත කර්තෘ කුමන විභක්තියකින් යොදනු ලැබේද? කර්තෘ උක්තවන්නේ කවර ක්‍රියාවලින්ද? සිටිමි, ගියෙහි, මේ ක්‍රියා දෙකින් කුමක් උක්ත වේද? වඩුවෝ ගේ තැනුවෝ, වඩුවන් තැනූ ගෙය, ගොවියෝ කුඹුරු කොටති, ගොවියන් කොටන කුඹුර, මෙහි උක්ත කර්තෘ කිම? අනුක්ත කර්තෘ කිම? මක්නිසාද? මුවෝ කෑ වෙල, මුවන් වෙල කෑවෝ, මම කරන වැඩේ, අපි ගිය ගම, මේ පාඨවල කවර වරද තිබේද? මක්නිසාද?

PASSIVE VOICE
කර්ම ක්‍රියාව.

කර්මයට අයිති ක්‍රියාව කර්ම නම්.

කර්ම ක්‍රියාව විධික්‍රියා ආදිය මෙන් අමුතු අර්ථයක යෙදෙන ක්‍රියාවක් නොවෙයි. යට දැක්වූ කර්තෘකාරක ක්‍රියාව කර්තෘව උක්තවනසේ යොදන්නාක් මෙන්ම ඒ අර්ථයේම කර්මය උක්තවනසේ යෙදූ විට කර්ම ක්‍රියා වෙයි.

කර්ම ක්‍රියාවේ ප්‍රත්‍යයද යට දැක්වූ ත්‍රෛකාලික ක්‍රියා ප්‍රත්‍යයමයි. අතීත කාල කර්ම ක්‍රියාවේ පදසිද්ධිය ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර න ප්‍රත්‍යය යෙදිමෙන් හා පිළි විපර්‍යාසයෙන් වෙයි. වර්තමාන අනාගත කාල දෙකේ කර්ම ක්‍රියාවල පදසිද්ධිය පිළි විපර්‍යාසයෙන් වෙයි. වෙනස මෙපමණයි.

---

[1] යට දැක්වූ ප්‍රථමා කර්තෘ විභක්ති ලක්ෂණද මීට එකතු කොට සැලකිය යුතුයි.

මහාබ්‍රහ්මයා විසින් ලොකයතෙමේ මැවිනි.

මෙහි 'මැවිනි' යනු කර්ම ක්‍රියාවයි. 'මහාබ්‍රහ්මතෙමේ ලෝකය මැවී' යයි කර්තෘකාරක කොට කීවත් මෙම අර්ථයමයි. එබැවින් කර්ම ක්‍රියාවේ පදසිද්ධියෙන් මුත් අර්ථයෙන් අමුත්තක් නොමැති බව මෙයින් සැලකිය යුතුයි.

'මැවිනි' යන ක්‍රියාවෙන් මහාබ්‍රහ්මයා යන කර්තෘව උක්ත නොවෙයි. ලොකය යන කර්මය උක්ත වෙයි.

තෝ මහාබ්‍රහ්මයා විසින් මැවුනෙහි.

මෙහිද මැවුනෙහි යන ක්‍රියාවෙන් එය කරන කර්තෘ වූ මහාබ්‍රහ්මයා නොව කර්මය වූ තෝ යන මධ්‍යම පුරුෂය උක්තවේ.

මහාබ්‍රහ්මයා විසින් 'මැවුනෙමි.'

මෙහිද මැවුනෙමි යන ක්‍රියාව කළ මහාබ්‍රහ්මයා යන කර්තෘ නොව කර්මය වූ මම යන්න උක්ත වේ. මෙසේ කර්තෘ නොව කර්මය උක්ත වනසේ ගළපන ක්‍රියා කර්ම ක්‍රියා බව සැලකිය යුතුයි.

'මව' ධාතුවෙන් පරව 'ඉ' යන ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා ප්‍රත්‍යය තැබූ විට 'මව ඉ' කියා පෙණේ. ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර 'න' ප්‍රත්‍යය කළ විට 'මවන ඉ' කියා පෙණේ. ඉයන්න නයන්නට පැමිණවූ විට 'මවනි' කියා පෙණේ. පසුව 'ම, ව' යන අක්ෂර දෙකේ පිළිපෙරළි වී 'මැවිනි' යන කර්මකාරක ප්‍රථම පුරුෂ අතීත කාල එකවචන ක්‍රියාවේ පදසිද්ධිය වේ.

'මැවුනෙහි, මැවුනේ' යන මධ්‍යම පුරුෂ ප්‍රථම පුරුෂ අතීත කාල එකවචන කර්ම ක්‍රියාවල පදසිද්ධිය මෙසේම ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර නකාරය ආගම වීමෙන් හා මකාර වකාර දෙකේ ස්වර විපර්‍යාස වීමෙන්ද වේ.

'මව' ධාතුවෙන් පරව වර්තමාන කාල ප්‍රථම පුරුෂ එකවචන ක්‍රියා ප්‍රත්‍යය වූ 'ඒ' යන්න තැබූ විට 'මව ඒ' කියා පෙණේ. පූර්ව්ස්වරලෝප සන්ධි ක්‍රමයෙන් වයන්නට ඒයන්න ගැලපූ විට 'මවේ' කියා වේ. පසුව මයන්න ස්වර විපර්‍යාසයෙන් ඇයන්න වූ විට 'මැවේ' යන ප්‍රථම පුරුෂ වර්තමාන කාල එකවචන කර්ම ක්‍රියාව සෑදේ. මැවෙහි මැවෙමි යන මධ්‍යම උත්තම පුරුෂ ක්‍රියා පදයන්ගේ පදසිද්ධියද මෙසේයි.

මැවෙන්නේ, මැවෙන්නෙහි, මැවෙන්නෙමි යන අනාගත කාල ක්‍රියාවන්ගේ පදසිද්ධිය මෙසේමැයි.

කම් ක්‍රියාවෙන් වාක්‍ය ගැළපීම සිංහල භාෂාවේ ඉතා ස්වල්පයි. මධ්‍යම පුරුෂ උත්තම පුරුෂවල කම් ක්‍රියා අප්‍රකටයි. යම් ක්‍රියාවක් ඉබේම වේ නම් එයද කම් ක්‍රියා ප්‍රත්‍යය වැටී සිද්ධ වේ.

කඩුව දිලිසුනි.

මෙහි දිලිසීම ඉබේ වූ බැවින් 'දිලිසුනි' යයි කම් ක්‍රියා ප්‍රත්‍යය වැටී පදසිද්ධිය විය.

දරුවාට හැඬුනි, මට විස කැවුනි, මට සිතුනි යන මේ ක්‍රියාද ඉබේ වූ බැවින් කම් ක්‍රියාව ලෙස පදසිද්ධිය වුයේය. මේ ක්‍රියා හා සම්බන්ධ වූ දරුවාට, මට යන දෙතැනම සම්ප්‍රදන[1] විභක්තිය විය.

දුන්න කැඩුනි, ගස ඉදිරෙයි.

මෙහි කැඩුනි, ඉදිරෙයි යන ක්‍රියා ඉබේම විය. නමුත් කඩ, උදුර යන ධාතු සකර්මකයි. එබැවින් මෙසේ සකර්මක ධාතුවලින් ඉබේම කෙරෙන ක්‍රියාවල කර්තෘට 'ස්වයං කර්තෘ ස්වයං කර්ම' යයි කියනු ලැබේ. කර්තෘත් ඒයි, කර්මයත් ඒයි යන අර්ථයි. දුන්න කැඩුනි යයි කී විට කැඩුනි යන ක්‍රියාවේ කර්තෘත් දුන්න මයි, කර්මයත් දුන්න මයි.

කඩුව දිලිසුනි, දුන්න කැඩුනි.

මෙහි දිලිසුනි, කැඩුනි යන ක්‍රියා දෙකින් උකත වන බැවින් කඩුව, දුන්න යන දෙක ප්‍රථමා විභක්තියයි. යම් ක්‍රියාවකින් කර්තෘ උක්ත නම් කර්මය අනුක්තයි.

බ්‍රහ්මයා ලොකය මැවී.

මෙහි 'මැවී' යන ක්‍රියාව කර්තෘකාරක බැවින් එයින් බ්‍රහ්මයා යන කර්තෘව උක්ත වේ. උක්තාර්ථයේ ප්‍රථමාව යෙදෙන බැවින් බ්‍රහමයා යනු මෙහිදී ප්‍රථමා විභක්තියයි. මැවී යන ක්‍රියාවෙන් අනුක්ත බැවින් ලෝකය යනු අනුක්ත කර්මයයි. අනුක්ත කර්මය කම් විභක්තියෙන් යෙදෙන බැවින් ලෝකය යනු කම් විභක්තියයි.

යම් ක්‍රියාවකින් කර්මය උක්ත වේ නම් කර්තෘ අනුක්තයි.

---

1 සබඳ.

බ්‍රහ්මයා විසින් ලොව මැවිනි.

මෙහි මැවිනි යන කම් ක්‍රියාවෙන් ලොව යන කම්ය උක්තයි. එබැවින් ලොව යනු ප්‍රථමා විභක්තියි. මේ ක්‍රියාවෙන් අනුක්ත බැවින් බ්‍රහමයා විසින් යනු කර්තෘ විභක්තියෙන් යුක්තයි.

එක ක්‍රියාවකින් කම්ය කර්තෘව යන දෙකම උක්ත නොවෙයි. ක්‍රියාව කම්කාරක නම් කම්ය උක්ත වන බවත් කර්තෘකාරක නම් කර්තෘව උක්ත වන බවත් කම්ය හෝ කර්තෘව යන දෙකින් කොයික උක්ත වුනත් උක්තාඛ්‍යාතයේ ප්‍රථමා විභක්තිය යෙදෙන බවත් සැලකිය යුතුයි.

ප්‍ර - කම් ක්‍රියාව යනු කිම? කම් ක්‍රියාව කුමන අර්ථයන්හි යෙදේද? කම් ක්‍රියාවෙත් කර්තෘ ක්‍රියාවෙත් වෙනස කිම? දෙවුනි, කැඩුනි, මේ ක්‍රියාවල පදසිද්ධිය කෙසේද? සවයං කර්තෘ සවයං කම් ක්‍රියාව කෙසේද? ගිනි බැබළිනි, මෙහි බැබළිනි යන ක්‍රියාවේ පදසිද්ධිය කොතැන කියා තිබෙන ලෙස සිද්ධ වීද? කම් ක්‍රියාවෙන් උක්ත වන්නේ කුම්ක්ද? එක ක්‍රියාවකින් කම්යත් කර්තෘත් දෙකම උක්ත වේද? දෙසී යන ක්‍රියාව කම්කාරක ක්‍රියාව කරන්නේ කෙසේද? කම් ක්‍රියාවේ ප්‍රත්‍යය කිම? පදසිඬියේදී අමුතු වන වෙනස කිම?

ක්‍රියා මාලාව.

පිස ධාතුව.

පුරුෂත්‍රයට අයිති ත්‍රෙකාලික ක්‍රියා.

පිසි, පිසුවේ	පිසුවෝ, පිසූහු, පිසූහ,
පිසුයෙහි, පිසුවෙහි,	පිසූහු,
පිසුයෙමි, පිසුවෙමි, පිසුයෙම්,	පිසුයෙමු, පිසුවෙමු, පිසුමු,
පිසීමි, පිසීම්,	පිසුම්හ,
පිසයි	පිසති, පිසත්, පිසිත්, පිසිති,
පිසහි,	පිසහු,
පිසමි, පිසම්,	පිසමු, පිසම්හ
පිසන්නේ,	පිසන්නෝ, පිසන්නාහු,
පිසන්නෙහි, පිසනෙහි,	පිසන්නහු,
පිසන්නෙමි, පිසනෙම්,	පිසන්නමු, පිසන්නෙමු,

ආශීර්වාද ක්‍රියා.

පිසේවා, පිසත්වා,
පිසෙහිවා, පිසහුවා,
පිසම්වා, පිසමුවා,

විධි ක්‍රියා.

පිස, පිසව පිසවී, පිසපල්ලා,
පිසාපන්, පිසාපිය, පිසපියවී

අසම්භාවන ක්‍රියා.

පිසතොත්, පිසතත්, පිසද්දී, පිසුවාම,

භූවී ක්‍රියා.

පිස, පිසලා,

මිශ්‍ර ක්‍රියා.

පිසමින්, පිසිමින්,

කම් ක්‍රියා.

පැසුනි, පැසුනෝ,
පැසුනෙහි, පැසුනහු,
පැසුනෙමි, පැසුනෙමු,
පැසේ, පැසෙති,
පැසෙහි, පැසෙහු,
පැසෙමි, පැසෙමු,
පැසෙන්නේ, පැසෙන්නෝ, පැසෙන්නාහු,
පැසෙන්නෙහි, පැසෙන්නහු,
පැසෙන්නෙමි, පැසෙන්නෙමු,1

පද නීතියේ ක්‍රියාධිකාරය මෙතෙකින් නිමි.

---

1. ප්‍රයෝජ්‍ය ක්‍රියාව ධාතුවටත් ප්‍රත්‍යයටත් අතර ව ප්‍රත්‍යය වැටීමෙන් සිඛ වන බැවින් පිසී යන ක්‍රියාව 'පිසවී' කියාද පිසූහ යන ක්‍රියාව 'පිසවුහ' කියාද යන මේ ආදි වශයෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ පදසිඛි ක්‍රමය ව්‍යවහාරයට අනුව කටයුතුයි.

පැසිලා, පැසෙමින්, පැසෙතොත් යනාදි වශයෙන් සවයං කර්‍ෘ සවයං කම් භූවී ක්‍රියා ආදිය ධාතුවේ පිළිවිපය්‍යාස වීමෙන් වන බවද දතයුතුයි. මේ අනුසාරයෙන් ගුරුවරුන් විසින් ධාතු වරනගවා ක්‍රියාමාලාව පුහුණු කටයුතුයි. පොත මහත් වන බැවින් සංක්‍ෂෙප කළෙමු. සියල්ල ව්‍යවහාරයට අනුව වරනැගිය යුතුයි. ප්‍රථම පුරුෂ අතීතකාල වර්‍තමාන කාල ක්‍රියා එලෙසම මඛ්‍යම පුරුෂයෙහිද යෙදේ. සමහර ධාතුවලින් හි, හු යෙදීම අඩු බැවින් එසේ යොදතියි සිතේ.

SYNTAX

ක්‍රියාකාරක පදසම්බන්ධය.

කාරක හා ක්‍රියා ගැළපීම ක්‍රියාකරන පදසම්බන්ධ නමි.

කාරක නම් කර්, කර්ෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යන විභක්ති සයයි.

පණ්ඩිතයෝ උත්සාහයෙන් ගුරුවරුන්ගෙන් ඉගෙණ හැම කල්හිම ලෝකයාට අවවාද දෙති.

මෙහි පණ්ඩිතයෝ යනු කර්ෘකාරකයි. උත්සාහයෙන් යනු කරණ කාරකයි. ගුරුවරුන්ගෙන් යනු අවධි කාරකයි, හැම කල්හිම යනු ආධාර කාරකයි. ලෝකයාට යනු සම්ප්‍රදාන කාරකයි. අවවාද යනු කර්ම කාරකයි. මෙසේ මේ ක්‍රියාකාරකම් සම්බන්ධයේ කාරක සයම යෙදී තිබේ. හැමතැන්හිම කාරක සය නොයෙදේ. ලැබුන පරිද්දෙන් එක දෙක තුන යනාදි වශයෙන් යෙදේ.

ගොණා සිටී මෙහි කර්ෘකාරකය පමණක් යෙදුනේය. ගොණා තණ කයි මෙහි කර්ෘ කර්ම යන කාරක දෙක යෙදී තිබේ. ගොණා කටින් තණ කයි. මෙහි කර්ෘ, කර්ම, කරණ යන කාරක තුනක් යෙදුනේයි. මෙසේ ක්‍රියාකාරක සම්බන්ධයෙහි ලැබුන පරිද්දෙන් කාරක එක දෙක යනාදි වශයෙන් යෙදේ. කර්ෘකාරකය පමණක් අවශ්‍යයෙන්ම යෙදේ.

ඕනෑ වූ අභිප්‍රායක් ප්‍රකාශ කරන පිණිස කියන ලියන කොයි වාක්‍යවලත් ක්‍රියාකාරක සම්බන්ධය යෙදේ. ක්‍රියා කාරක සම්බන්ධයෙන් වෙන්ව ඕනෑවූ අර්ථයක් ප්‍රකාශ කරණ වාක්‍යයක් නොමැතියි.

ප්‍ර - ක්‍රියාකාරක සම්බන්ධ යනු කිම? කාරක කවරේද? මහත්මයා ගොණාට තණකොළ දෙයි. මෙහි කාරක කීයද? ක්‍රියාකාරක පදසම්බන්ධයේ අවශ්‍යයෙන් යොදන කාරක කිම?

පද නීතියෙහි ක්‍රියාකාරක පදසම්බන්ධාධිකාරය මෙතෙකින් නිමි.

ATTRIBUTE AND SUBJECT
විශෙෂණ විශෙෂ්‍ය.

ප්‍රධාන පදය විශෙෂ්‍ය නමි. එහි උස්, මහත්, හොඳ, නොහොඳ ආදි වෙනස් ප්‍රකාශ කරණ පද විශෙෂණයි.

උස් මහත් මිනිහා එයි.

මෙහි මිනිහා යනු ප්‍රධාන පදයයි. එබැවින් එය විශෙෂ්‍යයයි. උස්, මහත් යන පද මිනිහා යන ප්‍රධාන පදයේ වෙනස් දක්වන පදයි. එබැවින් විශෙෂණයි.

උගත් බ්‍රාහ්මණයා

මෙහිද බ්‍රාහ්මණයා යනු ප්‍රධානයි. උගත් යනු එහි විශෙෂණයි.

වෙළෙන්දේ ගැල්වල බඩුලා බරණැස අභිමුඛව එන්නෝ මාගීයෙහි විඩා සංසිඳවති.*

මෙහි විශේෂ්‍යය වෙළෙන්දේ යනුයි, එන්නෝ යන්න ඊට විශේෂණයි.

විශෙෂණ විශෙෂ්‍ය පද කාව්‍යභාෂාවෙහිද පුරාණ වාසගම් පොත්වලද කොතනත් යෙදේ. වර්තමාන භාෂාවේ විශේෂණය මුලිනුත් විශේෂ්‍යය අගිනුත් නිතරම යෙදේ. මෙම විශෙෂ්‍යය තෙම යම් ලිඞග විභක්ති වචන භජනය කෙරේ නම් එම විශෙෂණයද ඒ ලිඞග විභක්ති වචනම භජනය කරයි.

'උස් මහත් මිනිහා එයි' යන පාඨයේ තිබෙන මිනිහා යන ශබ්දය පුරුෂලිඞග ප්‍රථමා විභක්ති එකවචන පදයකි. ඊට විශෙෂණවූ උස් මහත් යන ශබ්ද දෙකද පුරුෂලිඞග ප්‍රථමාවිභක්ති එකවචනයි. යට දැක්වූ පාඨයේ වෙළෙන්දේ යන්න ප්‍රථමාවිභක්ති බහුවචනයවූ බැවින් ඊට විශෙෂණවූ 'එන්නෝ' යනුද ප්‍රථමාවිභක්ති බහුවචනය විය.

ප්‍ර - විශෙෂ්‍යය යනු කිම? විශෙෂණයෙත් විශෙෂ්‍යයෙත් වෙනස කිම? සුදුමල, මෙහි විශෙෂණය කුමක්ද? විශෙෂ්‍යය කුමක්ද? වර්තමාන භාෂාවේ විශෙෂණය කොහෙන් යෙදේද?

---

* අමාවතුර, රත්නාවලිය ආදී පුරාණ සිංහල වාසගම් පොත්වල සමහර තැන්වල යෙදී තිබෙන්නාක් මෙන් මෙහි විශෙෂණය විශෙෂ්‍යයට අගින් යොදනලදී.

සිංහයා, මීට යෙදෙන විශෙෂණයේ ලිඞ්ග විභක්ති කවරේද? මහලු ස්ත්‍රී, මෙහි මහලු යනු කුමන ලිඟුද? මක්නිසාද?

පද නීතියෙහි විශේෂණ විශෙෂ්‍යාධිකාරය මෙතෙකින් නිමි.

NOMINAL DERIVATIONS

තද්ධිත හෙවත් ප්‍රත්‍යයාර්ථ නාම.

නාමයක අගින් ප්‍රත්‍යය යෙදී සිධ වන අමුතු නාම ප්‍රත්‍යයාර්ථ නාම නමි.

ඇති යන අර්ථයෙහි 'වත්' 'මත්' යන ප්‍රත්‍යය දෙක නාම අගින් යෙදේ.

ගුණවත්, සිරිමත්

මේ දෙක ප්‍රත්‍යයාර්ථ නාමයි. ගුණවත් යන්නෙන් ගුණ ඇත්තා යන අර්ථය ප්‍රකාශ වේ. සිරිමත් යන්නෙන් ශ්‍රී ඇත්තා යන අර්ථය හැඟේ. ගුණ, සිරි යන නාම දෙකින් පරව ඇති යන අර්ථයෙහි වත්, මත් යන ප්‍රත්‍යය යෙදී ගුණවත් සිරිමත් යන නාම දෙක සිඬ විය.

යම් තැනක නියුක්තවූවෙක් කියන විටද ඒ ස්ථාන වාචක ශබ්දයෙන් පරව 'ඉ' යන ප්‍රත්‍යය යෙදේ.

තොටි, මගි.

තොට යන නාමයෙන් පරව ඉ ප්‍රත්‍යය යෙදූ විට තොටි යන ප්‍රත්‍යයාර්ථ නාමය සිඬ විය. තොටියාට හෙවත් තොටෙහි නියුක්ත වූ තැනැත්තාට 'තොටි යන නාමය ව්‍යවහාර කරති. මග යන නාමයෙන් පරව 'ඉ' ප්‍රත්‍යය යෙදූ විට 'මගි' යන ප්‍රත්‍යයාර්ථ නාමය සිඬ විය. මගි ශබ්දය මග යන තැනැත්තාට කියන නමකි. මෙසේ යම් නාමයක අග ප්‍රත්‍යය යෙදීමෙන් සිඬ වන අමුතු නාම ප්‍රත්‍යයාර්ථ නාමයි දතයුතුයි.

නාම ශබ්දවල අගින් ඒ ප්‍රත්‍යය යොදා ස්ත්‍රීන්ට කියන නාම සිඬ කරණු ලැබේ.

කුකුළු ශබ්දයේ අග 'ඒ' ප්‍රත්‍යය යොදා කකාරයන්ගේ පිළිවිපයාස කිරීනේ කිකිළී යන නාමය සිඬ විය. කිකිළී යන නාමයෙන් ඒ ජාතියේ ස්ත්‍රිය ප්‍රකාශ වේ.

---

* ස්ථාන වාචක ශබ්දය, ස්ථානය ප්‍රකාශ කරන නාමය.

කරන,* ලියන යන නාම අග ඒ ප්‍රත්‍යය යෙදූ විට කරන්නී, ලියන්නී යන සත්‍රීලිඞ්ගික නාම සිඬ විය.

මෙහි කරණ ලියන යන කීතක නාම දෙකේ නකාර ලිඛවයද විය.

රතු සුදු යන නාමවල අගට ඒ ප්‍රත්‍යය යෙදූ විට රත්තී සුද්දී යන සත්‍රීලිඞ්ගික නාම සෑදේ.

රත්තී යන්නෙන් රතු වණ් ඇති තැනැත්තියක්ද, සුද්දී යන්නෙන් සුදු වණ් ඇති තැනැත්තියක්ද කියනු ලැබේ. මෙහි රතු සුදු ශබ්දවල අග ලිඛ විය.

මෙසේ නාමවල අග ඒ ප්‍රත්‍යය යෙදීමෙන් සත්‍රීන්ට කියන නාම සෑදේ. හැපින්නී, ඇතින්නී යන නාමපද සත්‍රීලිඞ්ගික ප්‍රත්‍යයාථී නාමයි.

ප්‍රත්‍යයාථී නාමද නාමපදයේ කොටසකි.

ප්‍ර - තද්ධිත හෙවත් ප්‍රත්‍යයාථී නාම යනු කවරේද? ගුණවත්, සිරිමත්, මේ නාම දෙක කෙසේ සිඬ වීද? ගුණ යන නාමයට වඩා ගුණවත් යන නාමයේ තිබෙන අමුතු අථීය කිම? මගියා අම්බලමේ සැතපේ, ධනවතුන් විසින් පවා නැණවත්හු පුදනු ලැබෙත්. මෙහි තිබෙන තඬිතනාම කවරේද?

පුවක් යන නාමය පුවක් ගසටද ගෙඩිවලටද කියනු ලැබේ.

කුරුඳු යන නාමය කුරුඳු ගසටද පොතුවලටද කියනු ලැබේ.

මෙසේ ගස් වැල්වලට කියන නාම ඒ ඒ ගස් වැල්වල මල්, ගෙඩි, පොතු ආදි අවයවයන්ටද ව්‍යවහාරයි.

ඉද්දමල්ගොඩ, පාණබොක්ක, පැලහැල යන නාම ඒ ඒ ගම්වලට හා එහි ප්‍රධානීන්ටත් ව්‍යවහාර කෙරෙති. මේවා ප්‍රත්‍යය නොමැතිව අභෙදෙපචාරයෙන් වන බව සැලකිය යුතුයි.

---

* උච්චාරණානුසාරයෙන් ප්‍රත්‍යය නකාරයට ණකාරය, විය. පසුව හල්වීමේදී දනත්‍ය විය. නැවත ලිඛවයද විය. සෙසු තන්හිද මෙසේයි.

VERBAL DERIVATIONS.
කිතක හෙවත් ප්‍රත්‍යයාත්‍ථ නාම.

ධාතු අගින් ප්‍රත්‍යය යෙදීමෙන් සිඬ වන නාම කිතක නාමයි, හෙවත් ප්‍රත්‍යයාථ නාමයි.

ලියන්නා, කරන්නා, උයන්නා, මේ නාම ප්‍රත්‍යයාථ නාමයි. ලිය, කර, උය යන ධාතු අගින් කතෘ අථයෙහි 'න' යන ප්‍රත්‍යය යෙදුන විට ලියන, කරන, උයන යන නාම සෑදේ. යට දැක්වූ විභක්ති පදසිද්ධියේ තුන්වෙනි ප්‍රභාරයට උකුසු ශබ්දයේ මෙන් අග ව්‍යඤ්ජනාක්ෂරය ලිපි වී ප්‍රථම විභක්ති එකවචනය ලියන්නා, කරන්නා, උයන්නා, කියා වීය.

කෙටූ කුඹුර, ලියූ ලියුම,

මෙහි කෙටූ, ලියූ, යන ශබ්දද කොට, ලිය යන ධාතුවලින් පරව කම්ාථයේ 'ඌ' යන ප්‍රත්‍යය යෙදී සිඬ වූ කිතක නාම බව පෙණේ.

කෙටූ කුඹුර යයි කී විට කෙටූ යන ශබ්දයෙන් කොටන ලද දෙයක් හැඟේ. හෙවත් ක්‍රියාවෙන් කරණු ලබන්නක් හැඟේ.

ලියන ලියුම, කරන වැඩ යනාදියෙන් න ප්‍රත්‍යය කම්ාථයෙහිද යෙදෙන බව දත යුතුයි. කුඹුරු කෙටූ මිනිහා, ලියුම ලියූ තැනැත්තා යනාදියෙන් 'ඌ' ප්‍රත්‍යය කතෘ අථයෙහිද යෙදෙන බව දත යුතුයි.

මෙසේ යම් ධාතුවකින් ප්‍රත්‍යය යෙදී ක්‍රියාව කරන්නා නොහොත් කරණු ලබන කම්ය හැඟෙනසේ සිද්ධ වන නාම කිතක නාමයි දත යුතුයි.

ගත් දෙය, විඳි දුක, කළ වැඩේ, මළ මිනිහා, දිවූ ගොණා යනාදියෙහි තිබෙන ගත්, විඳි යනාදියද කිතක නාම බව දතයුතුයි.

කිතක ප්‍රත්‍යය මේ මේයයි නිශ්චය කිරීම දුෂ්කරයි. කරණ ආදි ඉතිරි කාරකාථවලද කිතක නාම සෑදේ. ලියන උල්කටුව, දන් ලැබූ හිඟන්නා, ලේනා වැටුන අත්ත, මිනිහා සිටි ගෙය.

මෙහි ලියන, ලැබූ, වැටුන, ශබ්ද කරණ, සම්ප්‍රදාන, අවධි, ආධාර යන කාරකවල යෙදුන ප්‍රත්‍යයාථ නාමයි.

ක්‍රියා කිරීම පමණක් ප්‍රකාශ කරන ශබ්දද කිතක නාමයි.

මැරීම, විඳීම, ලියනු, කරණු, යාම යන මේ ආදිය ක්‍රියාවේ වීම පමණක් ප්‍රකාශ කරන ශබ්දයි.

මැරීමයයි කීවිට මරණ කෙණෙක්වත් මරණු ලබන්නෙක් වත් නොහැඟේ. අනික් අතට මැරීම යනු ත්‍රෙකාලික ක්‍රියාවක් හෝ විධික්‍රියා ආදි අන්‍ය ක්‍රියාවකුත් නොවේ. 'මැරීමට' මැරීමෙන් යනාදි වශයෙන් නාම ශබ්දය ලෙස වරනැඟේ. එබැවින් මැරීම යනාදිය ධාතුවෙන් සෑදුන නාම කොටසකි. මෙහි 'ඊම්' 'නු' යන ප්‍රත්‍යය යෙදේ.

මේ දෙකොටස අථීක්‍රියා භාවක්‍රියා යයි සිදත් සඟරාවෙ උගන්වන ලදී. කිතකය නාමපදයේ කොටසකි.

ප්‍ර - කිතක නාම කවරේද? ලියන්නා යන්නෙන් කවර අර්ථයක් හැඟේද? කරන්නා යන්නට නාමයයි කියන්නේ ඇයි? කිතක නාමවලට යෙදුන ප්‍රත්‍යය කිම? කරන්නා, කිරීම, කරති, මේ තුණේ එකිනෙකට ඇති වෙනස කිම?

පද නීතියෙහි ප්‍රත්‍යයාර්ථ නාමාධිකාරය මෙතෙකින් නිමි.

COMPOUNDS

සමාස

සමාසය නම් නොයෙක් අර්ථ ඇති පද දෙකක් හෝ වැඩි ගණනක් එකතු කොට එක අර්ථයක් ප්‍රකාශවන ලෙස ගැළපීමයි.

සුදු මල,

මෙහි සුදු යන නාමයෙන් ගස්, වැල්, සත්තු යන මේ ආදිවු නොයෙක් වර්ගවල තිබෙන ශුභ්‍රවර්ණය ප්‍රකාශ වේ. 'මල' සහ නාමයෙන් වෘක්ෂලතාවල පිපෙන මල් කියනු ලැබේ. මෙසේ 'සුදු' ශබ්දයෙන් එක අර්ථයක්ද 'මල්' ශබ්දයෙන් තවත් අර්ථයක්ද කියනු ලැබේ. නමුත් මේ දෙක එකතුව ගැළපුනු 'සුදුමල' යන නාමයෙන් එකම මලක් කියනු ලැබේ.

නිල් මානෙල් මල්දම

මෙයද සමාසයකි. මෙහි නිල්, මානෙල්, මල්, දම් කියා ශබ්ද සතරකි. මේ ශබ්ද සතර වෙන් වෙන්ව ගත් කල අර්ථ සතරකි. හෙවත් සතර වර්ගයකට කියන නාමයි නමුත් එකට ගැළපූ 'නිල් මානෙල් මල්දම' යන සමාස පදයෙන් එකම ද්‍රව්‍යයක් හෙවත් එක මල්දමක් කියනු ලැබේ.

මෙසේ නොයෙක් අර්ථ ඇති ශබ්ද එකතුවී එක අර්ථයක් ප්‍රකාශ වන සේ ගැළපීම සමාසයයි දතයුතුයි.

සුදුකුඩේ පොල්මල, ලොකුමැටිකළේ, රතුරෙද්ද, පින්කරන්නා යන මේ නාමද සමාන නාමයි.

ප්‍ර - සමාස යනු කිම? සුදුමල යන්නට සමාසයයි කියන්නේ මන්ද? රතු කුකුළා, දෙඔමල, දෙල්, උෆ සිටී, උඹ හොඳයි, මෙහි සමාස නාම කවරේද? ගොණා ගෙඩිය, කලු, ලොකු තර යන මේ ශබ්ද වලින් සමාස සැදෙන්නේ කෙසේද?

විශෙෂණ සමාසය.

විශෙෂණ පදයක් සමග වන සමාසය විශේෂණ සමාසයයි.

සුදු මල,

මෙහි සුදු යන්නෙන් මලේ වෙනසක් කියනු ලැබේ මෙසේ විශෙෂණය සමග සාමාසවූ බැවින් 'සුදුමල' යනු විශෙෂණ සමාසයි.

ලොකු ගොනා, කලු ගොනා යනාදියද විශෙෂණ සමාසයි.

විශෙෂණ සමාසයට අයිති ශබ්ද සියල්ලෙන්ම කියවෙන අර්ථ සමාස ශබ්දයෙන් කියවෙන ද්‍රව්‍යයෙහිත් පිහිටි සවභාවයෝයි.

'ලොකු ගොනා, යයි කී විට ලොකු ස්වභාවත් ගොනා කෙරෙහිම පිහිටි ගුණයක් බව පෙණේ.

සුදු මල, යයි කී විට සුදු වූයෙත් මල වූයෙත් එකම ද්‍රව්‍යය බව පෙණේ.

'ලියන මිනිහා' යන මෙහිද ලියන සවභාවත් මිනිහා කෙරෙහි පිහිටි බව පෙණේ.

ගණන් ශබ්ද පෙරටුවන සමාසද විශේෂණ සමාසයි. එක් මිනිහා, තුන් සිවුරු, දසදෙනෙක්, නවදෙර යනාදිය එක්, තුන්, දස, නව යන සංඛ්‍යා ශබ්ද පෙරටුව වූ සමාස බැවින් විශෙෂණ සමාසයි.

ප්‍ර - විශෙෂණ සමාස යනු කිම? සුදු මල යන්නට විශෙෂණ සමාසයයි කියන්නේ ඇයි? පාන, මිල, සුදු, නිල්, ලොකු ඇතා, මේ නාමවලින් විශෙෂණ සමාසය ඇති පාඨ කවරේ ද?

අව්‍යයීභාව සමාසය.

උපසර්ග නිපාත මුලට ගැළපී වන සමාසය අව්‍යයීභාව සමාසයි.

සුදන, දුදන, පබල

සු, දු, ප, යන උපසර්ග මුලට වැටී මේ සමාස පද සෑදි තිබේ.

අකුසල්, අනදර

න කුසල් යනු 'අකුසල් කියා සමාස විය. මෙසේ සමාස වන විට 'න' යන නිපාතයට අකාරයක් ආදෙශ වෙයි. න + අදර යනු 'අනදර' කියා සමාස වෙයි. සමාස වන ශබ්දයේ මුලකුර සවරය වුවොත් ඊට නකාර ආගමය වේ. එබැවින් 'අනදර' යන්නේ අයන්නට නකාරයක් ආගම විය.

අකුසල්, අනදර යන දෙක නිපාත පෙරටුවවූ සමාසයි. මෙසේ උපසර්ග, නිපාත පෙරටුව වන සමාස අව්‍යයීභාව සමාසයි.

ප්‍ර - අව්‍යයීභාව සමාස යනු කිම? 'සුදන' යන්නට සමාසය කියන්නේ මන්ද? උපලේකම් 'ලොකු ලියුමක් ලියයි', මෙහි තිබෙන අව්‍යයීභාව සමාසය කිම?

උපසර්ග නිපාත මුලට වැටුන පමණින්ම අව්‍යයීභාව සමාසයි මාගධ සංස්කෘත ව්‍යාකරණවල නොදක්වන ලදී. සිංහල ව්‍යාකරණයෙහි අව්‍යයීභාව සමාස කොටසට ගණන් ගණු ලබන සමහර සමාස මාගධ සංස්කෘත ව්‍යාකරණවල විශෙෂණ සමාස, අන්‍යාර්ථ සමාස ලෙස හෙවත් කර්මධාරය, බහුව්‍රිහි සමාස ලෙස ගණන් ගණු ලැබේ.

දකාරාථී සමාසය.

'ද' යන නිපාතයාගේ අර්ථයෙහි වන සමාසය දකාරාථී සමාසයයි. මේ දකාරය සංස්කෘතයෙහි 'ව' යන නිපාතයට සමානයි.

ගස්ද වැල්ද යනු 'ගස්වැල්' යයි කියති. මෙහි 'ද' යන නිපාතය ලොප් විය. පොල්ද, පුවක්ද, කොස්ද යන්න 'පොල් පුවක් කොස්' යයි කියති. මෙහිද 'ද' යන නිපාතය ලොප් විය.

මෙසේ 'ද' යන නිපාතය ලොප්ව ඒ නිපාතයාගේ අර්ථයෙහි වන සමාසය දකාරාථී සමාසයයි දතයුතුයි.

ප්‍ර - දකාරාථී සමාස යනු කිම? අලබතල, සුදුකුඩේ මෙයින් දකාරාථී සමාසය කිම? ඇයි?

විභක්ති සමාසය.

ප්‍රථමා, ආලපන යන විභක්ති දෙක හැර ඉතිරි විභක්ති සත හා වන සමාසය විභක්ති සමාසයයි. සමාසය නම් පදයන් සංක්ෂෙප කිරීමයි. විභක්ති සමාසයෙහි විභක්තිය බොහෝ සේ ලොප් වේ.

රජපිරිස්, බමුණු දන්

මෙහි 'රජුගේ පිරිස්' බමුණු දන්' යන පාඨවල විභක්ති රූප ලොප් වී 'රජපිරිස්' 'බමුණු දන්' කියා සමාස වූ බව පෙණේ. මේ සමාස දෙක සම්බන්ධ විභක්ති අර්ථයේ වූ බැවින් සම්බන්ධ විභක්ති සමාස නමි.

වැඩකරුවා, පොත් ලියන්නා.

වැඩ, පොත් යන දෙක කරු, ලියන අර්ථ ක්‍රියා ශබ්දයන්ට කම් වන බැවින් වැඩකරුවා, පොත්ලියන්නා යන දෙක කම්විභක්ති සමාසයි.

වෙඩිවලට හෙවත් වෙඩි පිණිස ගන්නා බෙහෙත් 'වෙඩි බෙහෙත්' නමි. සම්ප්‍රදන විභක්ති සමාසයි.

'රහුගෙන් මිදුනේ රහුමුත්' නමි, අවධිවිභක්ති සමාසයි.

කැලේ තිබෙන දෙල් 'කැලෑදෙල්' නමි, ආධාර විභක්ති සමාසයි.

සමාසයද නාමපදයේ කොටසකි.

ප්‍ර - විභක්ති සමාස යනු කිම? සමාස යන්නේ අභිප්‍රාය කිම? අඹමල්, සිත්තරු, කොළඹබඩු, සිවුරුරෙදි, නූල්වැඩ, මේ කවර සමාසද? ගම්කුකුළා යන්න කෙසේ සමාස වීද?

සමාස කීපයද එකට ගැළපෙන බව පෙණේ. එසේ ගැළපුන සමාසවල නම් මෙපරිද්දෙන් කිය යුතුයි.

සපන් ලියුම්කරුවා,

ලියුම් කරන්නේ ලියුම්කරු නමි, විභකති සමාසයි සපන්වූයේත් ලියුම්කරුවූයේත් එක තැනැත්තාම බැවින් 'සපන් ලියුම්කරු' යනු විශෙෂණ සමාසයයි. මෙසේ මේ එක සමාස පදයේ සමාස දෙකක් තිබේ. මීට "විභකති සමාස ගහී විශෙෂණ සමාස" යයි කිය යුතුයි.

තල්කිතුල් වනය,

තල්ද කිතුල්ද 'තල්කිතුල්' නමි, දකාරාථී සමාසයි. තල් කිතුලුන්ගේ වනය තල්කිතුල්වන' නමි, විභකති සමාසයි. මීට "දකාරාථී සමාසගහී විභකති සමාස" යයි කිය යුතුයි. මක්නිසාද යත්? 'තල්කිතුල් වනය' යන විභකති සමාසය ඇතුළේ 'තල් ද කිතුල් ද' යන දකාරාථී සමාසය ඇති බැවිනි.

අන්‍යාථී සමාසය.

සමාසයෙහි පෙණෙන ශබ්දවලින් හැඟෙන අර්ථය හැර අමුතු අර්ථයක් ප්‍රකාශ කරණ සමාසය අන්‍යාථී සමාස නමි. බස්නාහිර යයි කී විට මේ ශබ්ද දෙකේ අර්ථය බසින්නාවු ඉර යයි හැඟේ. නමුත් මෙයින් කියන්නේ ඉර බසින්නේ යම් දිසාවකට නම් ඒ දිසාවයි. 'නැගෙනහිර' යන ශබ්ද දෙකේ අර්ථයක් නැගෙන්නාවු සූයර්‍යයා කියා හැඟෙතත්

එයින් කියන්නේ ඉර නැගෙන්නේ යම් දිසාවකින් නම් ඒ දිසාවයි. 'සිව්පා' යන්නේ අථීය සතර පාදය යනුයි. නමුත් මෙයින් පා සතරක් ඇති සතෙක් යන අර්ථය ප්‍රකාශ වේ. මෙසේ සමාස පදයේ පෙණෙන ශබ්දවල නොමැති අර්ථ ප්‍රකාශ කරණ සමාසය අන්‍යාර්ථ සමාසයයි. වර්තමාන සිංහල භාෂාවේ අන්‍යාර්ථ සමාසයෙන් වාක්‍ය ගැළපීමක් නොමැතියි. නමුත් අන්‍යාර්ථ සමාස නාම සවල්පයක් භාෂාවේද දක්නා ලැබේ.

පද නීතියෙහි සමාසාධිකාරය මෙතෙකින් නිමි.

ත්‍රිවිධ ශබ්ද.

නිෂ්පන්න, තත්සම, තද්භව යයි සිංහල භාෂාවේ ශබ්ද ත්‍රිවිධයි. පාලි, සංස්කෘත, දෙමළ, ඉංග්‍රීසි ආදි භාෂාවලින් බිඳී ආ ශබ්ද තද්භවයි. ඒ භාෂාවලට සමාන වන සිංහල ශබ්ද තත්සමයි. මේ කොයි භාෂාවකට වත් සම්බන්ධයක් නොමැතිව ලඬකාවේම සෑදුන ශබ්ද නිෂ්පන්න ශබ්ද නමි. කිතක, තධිත, සමාස යන තුනටම අයත් ශබ්ද මේ භාෂාවලින් බිඳී එන බව පෙනේ. ඒ බිඳෙන ශබ්දවල ප්‍රකෘති ප්‍රත්‍යයාදිය විනිශ්චය කිරීම ඉතා දුෂ්කරයි. භාගිනෙය, පිතෘ, බුඬදාස යනාදී ශබ්දවලින් බෑන, පිය, බුජස් යනාදි සිංහලට බිඳී තිබෙන තධිත, කිතක සමාස නාමවලින් ඒ බව පෙණේ. මෙසේ අන්‍ය භාෂාවලින් බිඳෙන සමහර සිංහල තධිත, කිතක, සමාස නාමවල විශෙෂ විභාග කිරීම දුෂ්කර බවත් පිළිවෙළකට පදසිධියක් පෙන්විය නොහැකි බවත් සැලකිය යුතුයි.

මේ පොතේ පිළිවෙළ පරිද්දෙන් චතුර්විධ පදවිභාග හා උක්තානුක්තය පමණක් දක්වන විග්‍රහයක් මෙහි දක්වනු ලැබේ.

PARSING

ආණ්ඩුව වැසියන්ගෙන් බදු ගෙණ පඩි දෙමින් නිතර රට රකී.

මේ පාඨයේ සංක්ෂෙප විග්‍රහය මෙසේයි.

ක්‍රියාකාරක පද සම්බන්ධය	උකතා නුකත		පද			
			නාම පද	ක්‍රියා හෙවත් ආඛ්‍යාත පද	උපසර්ග පද	නිපාත පද
"ආණ්ඩුව රට රකී" යනු මෙහි ක්‍රියා කාරක පද සම්බන්ධයි	'රකී' යන ක්‍රියාවෙන් උක්ත බැවින් 'ආණ්ඩුව' යනු උක්ත කර්තෘයි එයින් අනුක්ත බැවින් 'රට' යනු අනුක්ත කර්මයි.	ආණ්ඩුව වැසියන් ගෙන් බදු ගෙන පඩි දෙමින් නිතර රට රකී	ප්‍රථමාවිභක්ත්‍යන්ත නාමපදය අවධිවිභක්ත්‍යන්ත නාමපදය කර්මවිභක්ත්‍යන්ත නාමපදය එම - එම -	පූර්ව ක්‍රියායි - මිශ්‍ර ක්‍රියායි. වර්තමානකාල ප්‍රථම පුරුෂ කර්තෘකාරක එකවචන ක්‍රියා පදයි.	-	නිරන්ත--රාථ ද්‍යොතක නිපාත පදයයි.

නිවැරදි ව්‍යවහාර.

ඒ ඒ භාෂාවන්හි ශබ්ද ලියනවිට ඒ ඒ ශබ්දයන්ට අයිති අක්ෂර යෙදිය යුතුයි.

අභිප්‍රාව, සවඥානය, ප්‍රත්‍ය, භික්ති යන සංස්කෘත ශබ්ද අභිප්‍රාය, සවභාවඥානය, ප්‍රත්‍යය, භිත්ති කියා ලිය යුතුයි.

එති, ඔෆරුදු, ලේඛම් කියා වැරදි ලෙස ලියන සිංහල ශබ්ද අයිති, අවුරුදු, ලේකම් කියා නිසිලෙස ලිය යුතුයි.

විරුද්ධතාවයට, විරුද්ධතාවයෙන් කියා වරනැගීම වැරදියි. මෙහි ශබ්දන්තය 'ව' නොව 'තා' යනුයි. එය අගට 'අට්' 'එන්' යන ප්‍රත්‍යය යෙදුන විට 'විරුද්ධතාවට, විරුද්ධතාවෙන්, විරුද්ධතායෙන්' කියා වරනැගේ. සෝෂාව, මෙඛලාවය යනාදියද මෙසේම සෝෂාව, මෙඛලාව කියා වරනැගිය යුතුයි.

ගෙවල්වල, වළවල්වල යනාදියද වැරදියි. ගේ, වළ යනු මෙහි ප්‍රකෘතියි එබැවින් මෙහි අගට වල් යනු යෙදූ විට ගේවල, වළවල කියා බුහුබස යෙදේ. මීට අගින් තව වල් ප්‍රත්‍යයක් බහුවචනය ඇඟවීමට යෙදීම වැරදියි.

ඔහුව, ළමයාව, අම්මාව, මාව කියා විභක්තියට අගින් වකාරය යෙදීම වැරදියි. ඔහු, ළමයා, අම්මා, මා කියා ලිය යුතුයි.

කර්තෘ විභක්ති අගින් යෙදිය යුතු 'විසින්' යනු 'අපි විසින්, මම විසින්, ගොවියෝ විසින්' කියා ප්‍රථමාවිභක්තිය අගින් යෙදීම වැරදියි.

ප්‍රථමා විභක්ති අගින් යෙදිය යුතුවූ තෙම, තොම යනු එතෙමේට, ඕතොමෝට යනාදි වශයෙන් වෙන විභක්තිවලට නොයෙදිය යුතුයි.

මම කරනවා, මම කළා, ඌ යනවා, තෝ ගියා කියා පුරුෂ විශෙෂ අවබොධ නොවන ප්‍රත්‍යය යෙදීමද වැරදියි.

මම කරමි, මම කෙළෙමි, උෆ යයි, තෝ ගියෙහි යනාදී වශයෙන් ඒ ඒ පුරුෂ විශෙෂයත් කාලවිභාගයත් ඇඟෙනසේ ක්‍රියා යෙදිය යුතුයි.

මෙසේ වැරදි ව්‍යවහාර අත්හැරදමා නිවැරදි ලෙස භාෂාව ලිවීමට පණ්ඩිතයන් කළ පොත්පත් බලා එහි වාක්‍ය රචනාවේ අක්ෂර විනාසය විභක්ති ක්‍රියා ආදිය යොදූ තිබෙන පරිදි බලාගෙන ඊට අනුව ලියන්ට පුහුණු කළ යුතුයි.

මලනුවෝ, තෙරණුවෝ, ගිරාණෝ, පියානෝ යනාදි තැන්වල 'අනු' 'ආන' යන ප්‍රත්‍යයද 'ඕ'යන ප්‍රථමා බහුවචන යද ගෞරව ප්‍රකාශ කරන පිණිස යොදන ලදී. බුදුන්, තෙරුන් යනාදි වශයෙන් එක්කෙනා ප්‍රකාශ කරණ නාම අගින්ද ගෞරවය පිණිස බුහුබස යොදති. මෙසේ ගෞරව ප්‍රකාශ කිරීමට යොදන ප්‍රත්‍යය හා බුහුබසද නිවැරදියි.

ණ, ළ යෙදිය යුතු විධිය.

සංස්කෘත භාෂාවේ සෘ, ර, ෂ යන මූර්ධජාක්ෂරවලින් පරව යොදන නකාරයද මූර්ධජ වේ. එබැවින් තෘණ, වර්‍ණ, ප්‍රාණ යනාදි ශබ්දවලින් බිඳෙන තණ, වණ, පණ යනාදිය මූර්ධජ ණකාරයෙන්ම ලිය යුතුයි. ලවණ, කල්‍යාණ යනාදි සංස්කෘත ශබ්දවල මූර්ධජ ණකාරය යෙදේ. එයින් බිඳෙන ලුණු, කළණ යනාදියේ මූර්ධජ ණකාරය ලිය යුතුයි. මෙසේ මූර්ධජ දන්තජ නිවරද ලෙස ලිවීමට සිංහල ශබ්ද බිඳී ආ සංස්කෘත මාගධ ශබ්ද අවබෝධ කටයුතුයි.

පාටලී, අටඨාරස, කූට යන ශබ්දවලින් 'පළොල්' 'අටළොස්' 'කුළ' කියා බිඳේ. එහි මව් භාෂාවේ මූර්ධජාක්ෂර යන්ට ආදෙශ වූ ළකාරය මූර්ධජ විය යුතුයි.

රණ, කරණ, රළ යනාදිය රකාරයෙන් පරවද මූර්ධජ ලිය යුතුයි.

'තණ' කියා මූධීජ ලීවොත් මෙහි තේරුම තෘණ වගීයයි. 'තන' කියා දන්තජ ලියූවිට මෙහි තේරුම සත්‍රී පයොධරයි. වළ කියා මූධීජ ලියූ විට 'ආවාටය' යන අර්ථයද දන්තජ වූ 'වල්' යන්නෙන් 'කැලේ' යන අර්ථයද හැඟේ. මෙසේ දන්තජ මූධීජ යෝග්‍ය ලෙස ලිවීම ශබ්දව අර්ථය ඉක්මනින් අවබොධ වීමට හා නිෂ්පන්නාදි ශබ්ද ප්‍රකෘති දැනගැණීමට ද උපකාරයි.

වැරදි පාඨ හා නිවැරදි පාඨ

මා විසින් ගිය සෙනසුරාද නුවරට ආවා, ඒ අය සත් පුරුෂයෙකි, වෙළෙඳන් යනවා, ඒ අය මා මිත්‍රතාවයෙන් පිළිගත්තේය. කිකිළියෝ බිජුලති, ඉසතුතීයෙන් ලියමි, මොනරා නටයි, වෙළෙන්ද කොටළුවා ගෙන ගියෝ. බදුද මලයා එන්නේය, ඒ සත්‍රීතොමෝ විසින් ගොතන වැඩ හොඳයි, කන්නු වීණා වාදනා කරති, අපි කළ වැඩ හොඳයි. පාරවල්වල ඇවිදිති, ඔවුන් විසින් හරක් මරා කෑවෝ, පණ්ඩිතයෝ ලියූ පොත් ලෝකාර්ථදයකයි, ගොවියෝ කුඹුරු වැඩ කරති, ඉස්ත්‍රී පුෂීයෝ මෙන් ඔවුන් සිටිති, ඔහුට විභක්තියක් වත් නොතේරෙයි, තාත්තා මාව ගේන්වුයේයි, බොහෝ වේලාවක් මම එහි සිටියා. ඊෂ්‍යාවයෙන් සිටීම නොහොබී, ඔහුට හොඳ චෙතනාවක් නැත, ගොණා දුවති, අශ්වයා පිට යමි, ධර්මදෙශනාව හොඳයි, කුඹුර මුවෝ කෑවෝය. ශිකුරාද කළ වැඩ, ධර්ශ්‍රවණයට ගියා, පිළිවෙලකට නැති වැඩ,අප එද ගියෙමු, ඔව්හු සිටින ගමට මම ගියෙමු, පොල් පලගත් වත්ත, ඇත්තු ලවා ඇද්දාවු කඳ, දරුවන් තණේ බොති, වනේ රිදෙයි, ඔවුන් පිළිනොගෙණ සිටියා, ඇත්තු කෑ කිතුල්ගස, ඔවුන් මරාදමමු, මිත්‍රයාව දුටුවෙමි, ගොණා දුවනවා, මම ඒ පොත එවන්නෙමි, මුවෝ ගොයම් කනවා, ලේනුන් අතු උඩ යති, තොපි කළ වැඩේ හොඳ නෑ, බුඩාගම් කාරයෝ මල් පුදති, මෝඩයන්ට ශ්‍රඩාව වැඩියි, වඳුරෝ සිටින ගස සෙලවෙයි, සර්පයෝ සිටින ගෙයි නොසිටිය යුතුයි. බෙන්ත්‍රට ගියා, හාමුදුරුවෝ වෙත ලැබෙන පිණිස ලියුම්

යවමි, මඩබදුලේකම්වරු ඉඩම් ලියනවා, මහා රාජනී තොමෝව ගෞරව කරති, එතෙමේට යහපතක් වේවා, ගස කැඩෙයි, තොපි ශාස්ත්‍ර දත්තහු, මම සත්පුරුෂයෙක්මි, ලියන්නන් පොත් ලියති.

ප්‍ර - මේ පාඨවල කවර වරද තිබේද? මක්නිසාද? කවර සූත්‍රයක් ලෙස වැරදිද? ශුඬකටයුතු විධිය කෙසේද? මක්නිසා ශුධද? නිවරද පාඨ කවරේද? කවර සූත්‍ර නිවැරදිද?

උප ග්‍රන්ථය.

ව්‍යාකරණ විධි.

ශුද්ධ සිංහල භාෂාවේ ප්‍රධාන ව්‍යාකරණ විධි විස්සකි. එනම් - සංඥාය, සන්ධිය, ලිඞ්ගය, විභක්තිය, සමාසය, ප්‍රකෘතිය, ප්‍රත්‍යය, ක්‍රියාය, ලොපය, ආදෙශය, ආගමය, පූර්ව රූපය, පශ්චරූපය, විපර්‍යාසය, වෘඩිය, හානිය, නිපාතය, නියම විධිය, අනියම් විධිය, අවිද්‍යමාන විධිය යන මේයි. සිදත් සඟරාවේ මෙසේ දක්වා තිබෙතත් වර්‍තමාන ව්‍යවහාර භාෂාවේ පැණෙන බොහෝ ව්‍යාකරණ විධීන් විසතර කිරීමෙන් පද නීතිය සම්පාදනය කර තිබේ. වර්‍තමාන භාෂාවේ දක්නට නොලැබෙන විභක්ති ප්‍රත්‍යයාදිය සිදත් සඟරාවේ ද, සිදතෙහි දක්නට නොලැබෙන ව්‍යාකරණ විධි වර්‍තමාන භාෂාවේද දක්නට ලැබෙත්.

සංස්කෘත, පාලි භාෂාවන්ට අයත් ව්‍යාකරණ විධීන් ශුඬ සිංහල භාෂාවේ ව්‍යාකරණ වශයෙන් දැක්වීම ආධුනික යන්ගේ මුළාවට හේතු වන්නේය. පැරණි භාෂාවේ යෙදුම් වර්‍තමාන භාෂාවට ඉඳුරාම වෙනස්ව දක්නා ලැබෙතත් ඒ විශෙෂය අවබොධ කරගැණීම ආධුනිකයන්ට මහත් ප්‍රයෝජන වන්නේය.

විභක්ති විධානය

පද නීතියේ විභක්ති ප්‍රත්‍යය දක්වන ලද්දේ වර්තමාන භාෂාවේ යෙදෙන ප්‍රමාණයෙනි. සිදතෙහි ප්‍රථමාවිභක්ති එකවචනයට 'එ' 'ආ' යන ප්‍රත්‍යය දෙක දක්වා 'බෙළේ බළාම් කෙරේ, හරා අරා කෙලෙස් කුළු යන නිදර්‍ශන දැක්වූහ. 'ඒ' යන ප්‍රත්‍යය යෙදීමෙන් සිද්ධ වූ ප්‍රථමාවිභක්තිය එකවචනය වර්තමාන ව්‍යවහාර භාෂාවේ දුර්ලභය. කාව්‍ය භාෂාවේ සහ පුරාණ භාෂාවෙහිත් එබදු යෙදුම් දක්නට ලැබෙත්, මේ නිසා පද නීතියේ පෙරවිබත් එකබස අ, ආ යන ප්‍රත්‍යය දෙක දක්වා තිබේ.

'අත්' ආදි හලන්ත ශබ්දයන්ගේ පෙරවිබත් එකබස අත කියා සැදේ. 'බඹර' ආදි සවරාන්ත ශබ්දයන්ගේ පෙර විබත් එකබස 'බඹරා' කියා සැදේ. කම් කර්‍තෘ ආදි අවශේෂ විභක්ති ප්‍රත්‍යයන් සම්බන්ධවද මේ ක්‍රමය සලකාගත යුතුයි. එහෙත් පුරාණ වර්තමාන භාෂාද්වයම අවබෝධ කරගැණීමට පහසු වන පිණිස සාමාන්‍ය ප්‍රත්‍යය පරිපාටිය මෙහි යොදනු ලැබේ.

විභක්ති ප්‍රත්‍යයෝ.

එකවචන.

ප්‍රථමා - අ, ආ, ඒ.
කම් - අ, උ, ආ, හු, ට.
කර්‍තෘ - අ, උ, ආ, හු.
කරණ - ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නි.
සම්ප්‍රදාන - ට, අට, ආට, උට, හුට, හට.
අවධි - {ඉන්, එන්, නෙන්, අගෙන්.
ආගෙන්, උගෙන්, හුගෙන්.
සම්බන්ධ - {අගේ, ආගේ, උගේ, හුගේ.
අට, උට, ආට, අ, උ, ආ, හු.
ආධාර - ඇ, එහි, ඒ, හි.
ආලපන - අ, ආ, ඇ, එ, ඒ, ඕ.

බහුවචන.

ප්‍රථමා = ඕ, හු, උ, වල්.
කර්ම = උන්, න, ආන, න්, නට, අන්, වල්.
කර්තෘ = උන්, න, ආන, න්, අන්, .
කරණ = ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි.
සම්ප්‍රදාන = අන්ට, අනට, ආනට, උන්ට, න්ට, නට.
අවධි = {නෙන්, අන්ගෙන්, ඉන්, ගෙන්. / උන්ගෙන්, න්ගෙන්.}
සම්බන්ධ = {උන්ගේ, අන්ගේ, උන්ට, නට, අනට, / න්ට, අන්ට, උන්, න්, අන්}
අධිකරණ = අන්හි, ඇ.
ආලපන = ඉනි, එනි, නෙනි, නි.

මේ ප්‍රත්‍යය සියල්ලම වර්තමාන ව්‍යවහාර භාෂාවේ නොයෙදේ. වැඩි කොටස පුරාණ භාෂාවේද සවල්පයක් වර්තමාන භාෂාවේද යෙදේ.

අවිද්‍යමාන විධිය.

විභක්ති ප්‍රත්‍යයත් සමග යෙදීමෙන් විභක්තිරූප නොගෙන සවකීය රූපයෙන් සිටින ශබ්දද උපසර්ග නිපාත වශයෙන් ද්විපකාරවූ අව්‍යය ශබ්ද පද මධ්‍යයේ සන්ධි වියයුතු තන්හි සන්ධි නොව භින්න ප්‍රකෘතිව (විසන්ධිව) සිටින ශබ්දද යන මේ සියල්ල අවිද්‍යමාන විධි නම් වේ. සාමාන්‍ය ක්‍රමයෙන් වෙනස් වූ විශෙෂ ක්‍රමය මෙයින් දක්වන ලද්දේය. 'නිලු ද වට 'බිඟුපෙල අද තඹර නිලු' යන මෙහි 'බිඟුපෙල' යන ස්වරාන්ත ශබ්දය ප්‍රකෘතියෙන් සිටගෙණම 'නිලු' යන බහුවචන ක්‍රියාව භජනය කළේය. ක්‍රියාව බහුවචන බැවින් ඊට අනුරූප වන පරිද්දෙන් 'බිඟුපෙලෝ' කියා හෝ 'බිඟුපෙලහු' කියා නොයොදන ලද්දේය. මේ අවිද්‍යමාන විධියයි.

'තොප තුඩ තුළට කිරිරස දියහැර වදිය' මෙහි කිරිරස යන්න ස්වරාන්ත ශබ්දප්‍රකෘතියි. එය පෙර විඛත් එකබස භජනය කරන්නේම 'වදිය' යන ක්‍රියාව සමග ගැළපී අර්ථය ප්‍රකාශකෙරෙයි.

බහුවචන.

ප්‍රථමා = ඕ, හු, උ, වල්.
කර්ම = උන්, න, ආන, න්, නට, අන්, වල්.
කර්තෘ = උන්, න, ආන, න්, අන්, .
කරණ = ඉන්, ඉනි, එන්, එනි, නෙන්, නෙනි, නි.
සම්ප්‍රදාන = අන්ට, අනට, ආනට, උන්ට, න්ට, නට.
අවධි = {නෙන්, අන්ගෙන්, ඉන්, ගෙන්. / උන්ගෙන්, න්ගෙන්.}
සම්බන්ධ = {උන්ගේ, අන්ගේ, උන්ට, නට, අනට, / න්ට, අන්ට, උන්, න්, අන්}
අධිකරණ = අන්හි, ඇ.
ආලපන = ඉනි, එනි, නෙනි, නි.

මේ ප්‍රත්‍යය සියල්ලම වර්තමාන ව්‍යවහාර භාෂාවේ නොයෙදේ. වැඩි කොටස පුරාණ භාෂාවේද සවල්පයක් වර්තමාන භාෂාවේද යෙදේ.

අවිද්‍යමාන විධිය.

විභක්ති ප්‍රත්‍යයත් සමග යෙදීමෙන් විභක්තිරූප නොගෙන සවකීය රූපයෙන් සිටින ශබ්දද උපසර්ග නිපාත වශයෙන් ද්විපකාරවූ අව්‍යය ශබ්ද පද මධ්‍යයේ සන්ධි වියයුතු තන්හි සන්ධි නොව භින්න ප්‍රකෘතිව (විසන්ධිව) සිටින ශබ්දද යන මේ සියල්ල අවිද්‍යමාන විධි නම් වේ. සාමාන්‍ය ක්‍රමයෙන් වෙනස් වූ විශෙෂ ක්‍රමය මෙයින් දක්වන ලද්දේය. 'නිලු ද වට 'බිඟුපෙල අද තඹර නිලු' යන මෙහි 'බිඟුපෙල' යන ස්වරාන්ත ශබ්දය ප්‍රකෘතියෙන් සිටගෙණම 'නිලු' යන බහුවචන ක්‍රියාව භජනය කළේය. ක්‍රියාව බහුවචන බැවින් ඊට අනුරූප වන පරිද්දෙන් 'බිඟුපෙලෝ' කියා හෝ 'බිඟුපෙලහු' කියා නොයොදන ලද්දේය. මේ අවිද්‍යමාන විධියයි.

'තොප තුඩ තුළට කිරිරස දියහැර වදිය' මෙහි කිරිරස යන්න ස්වරාන්ත ශබ්දප්‍රකෘතියි. එය පෙර විඛත් එකබස භජනය කරන්නේම 'වදිය' යන ක්‍රියාව සමග ගැළපී අර්ථය ප්‍රකාශකෙරෙයි.

'ගියේ බෝසත් තමාගේ ගෙට' මෙහි 'බෝසත්' යනු හලනත ශබ්ද ප්‍රකෘතියකි. එහෙත් ප්‍රථමා විභක්‍යාර්ථය භජනය කරන්නේම 'ගියේ' යන ක්‍රියාව සමග ගැළපී යථාර්ථය ප්‍රකාශ කෙරෙයි. 'විදපියා නිලඹර යන් නොවී මැළි' මෙහි 'නිලඹර' යන්න ප්‍රකෘතියෙන් සිටගෙනම කර්මවිභක්තිය භජනය කෙරෙයි. මේ ගමනාර්ථයෙහි කර්මවිභක්තියි.

'ගස් වැටෙයි, ගස් වැටෙත්' මේ පාඨය ගැණ පරීක්ෂා කටයුතුයි. එක් තැනෙක්හි 'වැටෙයි' යන එකවචන ක්‍රියාව සමගද එක් තැනෙක්හි 'වැටෙත්' යන බහුවචන ක්‍රියාව සමගද 'ගස්' ශබ්දය යෙදී තිබේ. 'ගස්' ශබ්දය හලනත ප්‍රකෘතිකව සිටගෙනම දෙතන්හි පිළිවෙළින් එකවචන බහුවචනාර්ථයන් භජනය කෙරේ. මේ අවිද්‍යමාන විධියයි.

'සුද අත්, පඬු ඇඹුල්' යන දෙතැන පද මධ්‍යයේ සන්ධි විය යුතුයි. 'සුච හත්' කියා හෝ 'සුදත' කියා සන්ධි නොවී විසන්ධියෙන් සිටගෙණම ශුඬනත හෙවත් අනතඃපුරය යන අර්ථය ප්‍රකාශ කෙරෙයි.

පාණඩුකම්බල ශබ්දයෙන් 'පඬැඹුල්' කියා භින්න විය යුතුයි. එසේ නොවී පඬු - ඇඹුල් කියා සිටියේම පාණ්ඩු කම්බල* යන අර්ථය ප්‍රකාශ කෙරෙයි. මෙබඳු යෙදුම් පුරාණ භාෂාවේ දක්නට ලැබෙත්.

අව්‍යය ශබ්ද ද විභක්තිරූප නොගණින්. 'නිති ගේදෙර හැමද' යනාදිය නිදර්ශනයි. ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට මේ විශේෂය ඉගන්විය යුතුයි. අවිද්‍යමාන විධියේ නාමපද පිළිබඳ ව්‍යවහාර ක්‍රමය පුරාණ වර්තමාන භාෂාවයෙහිම බොහෝ සේ දක්නා ලැබේ.

---

* 'සුරිඳු පඬුපුල් අස්න උණුවී' යන තන්හි 'පඬුපුල් ශබ්දය දක්නට ලැබේ. මෙහි පාණඩු උපල ශබ්දයන්ගෙන් පඬුපුල් කියා භින්න වී තිබේ පරීක්ෂා කටයුතුයි.

අන්‍යාර්ථී සමාසය.

එකිනෙකට වෙනස් අර්ථ ඇති නොයෙක් පදයන් සඞ්ගත වී ඒ සමස්ත පදයන්හි දක්නට නොලැබෙන අන්‍යාර්ථයක් ප්‍රකාශ වේ නම් ඒ "අන්අරුත්සමස්" නම් වන්නේය. සමාස වූ පදයන්හි නැත්තාවූ සෙසු පදයන්ගේ අර්ථයෙහි අන්‍යාර්ථී සමාසය වන්නේය. මේ සමාසය 'බහුබ්‍රිහී සමාසය'යි. පාලි සංස්කෘත ව්‍යාකරණාචාර්‍යවරයෝ කීහ. අන්‍යපදාර්ථී සමාසයයිද කියති. නාම දෙකක් හෝ වැඩී ගණනක් සමාස කරණු ලැබේ. මේ සමාසය කර්මාදි සප්ත විභක්තියෙහි යෙදේ.

කර්මවිභක්ති - එරුණු හස් - (හස් එරුණේ යමකටද ඒ) තළා
කර්තෘ - දැමිදුරු - (දමන ලද ඉඳුරෝ යමක්හු විසින් ද) මුනි
කරණ - සුන්බත් - (යම් කරණෙන් බත්සුන්) අට
සම්ප්‍රදාන - දුන්බත් - (දෙන ලද බත් යමක්හටද) බමුණු
අවධි - ගුලුගොනඟුල් - (ගිලිහුනුගොනඟුල් යමකින්ද) රුක්
සම්බන්ධ - දසබල - (බල දසයක් ඇතිතේ) බුදු
ආධාර - මත්නේගජ - (මත්නේ ගජන් ඇත්යේ) රන්

එරුණු හස් - මෙහි කර්තෘපදය වූ හස් ශබ්දයද ක්‍රියා පදයවූ එරුණු ශබ්දයද සඞ්ගත වීමෙන් ඊට කර්මයවූ තඩාගය යන අන්‍ය පදාර්ථයක් ප්‍රකාශ කෙරෙයි. ඒ වර්ණිත පදය වූ තළා යන්න උකහා කර්මයයි. එරුණු හස් - තළායයි ගත්කල තළා ශබ්දය ප්‍රධානයි. හෙවත් විශෙෂයි එරුණු හස් ශබ්දය අප්‍රධානයි. හෙවත් විශෙෂණයි. කර්තෘ විභක්ති ආදියෙහිද මේ ක්‍රමයමයි.

අබ්භාස සංඥක පද.

අබ්භාස සංඥය කුමක්දැයි සිංහල ව්‍යාකරණයෙහි දක්වා නොමැතියි. පාලි සංස්කෘත ව්‍යාකරණයන්හි පෙණෙන මේ ව්‍යාකරණ විධියට අනුගතව සිඬ වූ පද සවල්පයක් සිංහල භාෂාවේ දක්නට ලැබේ. යම් ධාතුවක මුල් අක්ෂරය දෙක කොට ඊට අබ්භාස යන නාමය දෙනු ලැබේ. ඉන්පසු අබ්භාස සංඥාවත් අක්ෂරයට සූත්‍ර නියමයේ ප්‍රකාර ආදෙශ කොට පද සාධනය කරණු ලැබේ. මේ ක්‍රමයෙන් සිඬ වූ ක්‍රියාපද රාශියක් දක්වා තිබේ. නාමපද සම්බන්ධවද මේ ක්‍රමය යෙදිය යුතුයි.

මේ පිළිවෙළින් සිඬ වූ පද සවභාෂාවෙහි දක්නා ලැබේ.

සුරඟන ගත් සෙම ර
දිදුලෙන් දිලෙන හැම ව ර

යනු ඊට එක් නිදර්ශනයකි. මෙහි 'දිදුල' යනු සිඬපදයයි. එය පළමුකොට දුල කියා සිටියි. පසුව දුල යන්නට ළිඹකොට පූර්වයට අබ්භාස සංඥා කළ කල්හි දුලදුල කියා සිටී. මුල දයන්නේ උයන්නට ඉකාරයක් පිළිපෙරළි වශයෙන් පැමිණි කල්හි ලකාරය ලොප්ව දිදුල කියා පදය සෑදේ.

ගිගුම්, යනුද මෙබඳු පදයකි. මෙහි ගුම් යනු ශබ්ද ප්‍රකෘතියි. ගුම් යන්නට ළිඹ කොට පූර්වයට අබ්භාස සංඥා කල කල්හි ගුම්ගුම් කියා සිටියි. මුල ගයන්නේ තිබෙන උයන්නට ඉකාරයක් පිළිපෙරළි වශයෙන් පැමිණි කල්හි හල් මකාරය ලොප්ව 'ගිගුම්' කියා පදය සෑදේ. සවභාෂාවේ පැනෙන මෙබඳු වෙනත් පද ව්‍යාකරණඥයන් විසින් ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතුයි.

ISBN : 978-955-

පූජාර්ථයෙහි කරණ විභක්තය.

පූජාර්ථ ධාතූන්ගේ යෙදීමක් ඇති කල්හි පූජාවාචක ශබ්දය කරණ විභක්තයෙන්ද සෑදේ. එබඳු යෙදුම් සිංහල භාෂාවේද බොහෝසෙයින් දක්නා ලැබෙත්.

පරසතු මලින් පූ ද
ලද මුනිසඳුට දියන ද
වනපස මලින් පූ ද
කළැයි පවසනු කවර වරද ද

මෙහි 'පරසතු මලින් වනපස මලින්' කියා පූජාර්ථ වාචක ශබ්දය කරණ විභක්තයෙන් යෙදුනේයි.

'මෙසේ ගඳින් මලින් බුදුන් පුදනුවෝ - නෘත්‍යගීත වාද්‍යාදියෙන් සත්කාර කළාහුය. සහම්පති නම් බඹරද තෙමේ මහමෙරසා රුවන්දමකින් භාග්‍යවතුන් පිදී - බුදුන් මෙසේ ප්‍රතිපත්ති පූජාවෙන් පුදනුවන් විසින් - යනාදි යෙදුම් මීට නිදර්ශන වශයෙන් සැලකිය යුතුයි. මේ නිදර්ශනයන්හි පූජාර්ථ වාචක ශබ්දය කරණ විභක්තියෙන් යෙදී තිබේ.

මෙහි තත්ත්වය.

මහා ප්‍රාණාක්ෂර ඇති මාගධ සංස්කෘත ශබ්දවලින් සිංහලට බිඳෙනවිට ඒ මහා ප්‍රාණාක්ෂරය ළඟ හකාරය වැටී ශබ්දය බිඳෙන බවත් ඒ හකාරය ප්‍රකෘති හකාරය බවත් ඇතැම් අයගේ මතයකි. මේ මතයද පිදිය යුතු මතයකි. නමුත් ධම්ම, ධම් යන ශබ්දවලින් බිඳුණු දහම් යන්නේ හකාරය ආගමවීයයි මෙහි සිදත් සඟරා මතය ලෙස ලීමු. මේ මත දෙකින් කොයික සත්‍යය වුවත් ආගම විධිය ඉගෙණ ගන්නන්ට අපේ උදාහරණයෙන් මුළාවක් නොවෙයි.

ගමට ගියා යනාදි තැන්වල ගමට යනු සම්ප්‍රදාන විභක්තියමයි යන මතයක් තිබේ. ගමනාර්ථයෙහි සම්ප්‍රදාන කම් යන විභක්ති දෙකම යෙදෙන බව සංස්කෘතයෙහි උගන්වන බැවින්ද 'ට' යන විභක්තිප්‍රත්‍යය සම්ප්‍රදාන කාරකයට හිමි නියම ප්‍රත්‍යය බැවින්ද මේ මතයත් යහපති.

රඹුක්කන යනාදි අප විසින් යෙදූ ඇතැම් උදාහරණවල පදසිද්ධිය වෙනින් අතකට තෝරන්ටත් පුළුවන් වෙයි. සමහරවිට අපේ පදසිද්ධිය භජනය නොකොට ඒ ශබ්ද සෑදෙන්නටත් ඇත. ඒ කොයි හැටි උවත් ආධුනික ජනයාට අපේ සූත්‍රවලින් සිංහල භාෂාවේ සවභාවය අවබොධවීමට බාධා නොමැතියි.

ලොප, ආදෙශ ආදී පදසිද්ධිය අත්හැර ශබ්දරූපය පමණක් පළමුකොට ඉගැන්විය යුතුයයි සමහරු සිතති. එබැවින් මේ පොතේ 17 පිට පටන් 45 පිට කෙළවර කොට පදසිද්ධිය සම්බන්ධව අතරතුර ලියා තිබෙන පාඨ හැර ඉතිරිවා පළමුවෙනි අවුරුද්ද එතැන් පටන් 70 පිට දක්වා පදසිද්ධිය හැර ඉතිරිදේ දෙවැනි අවුරුද්දේ පොත මුල පටන් කෙළවර දක්වා ඉතිරි සියල්ල හා වෙන ව්‍යාකරණ පොත්වල

තිබෙන අතිරික්ත දේත් සමග තුන්වැනි අවුරුද්දේද පාඨශාලාවන්හි ඉගැන්විය හැකියි. නමුත් අපේ මතය නම් එක් අවුරුදු හමාසයකින් මේ පොත මුල පටන් අග දක්වා උගන්වා ඉතිරි මාස හයේදී සිදත් සඟරාවේ ඇති වෙනසත් සමග පොත මුල පටන් නැවතත් කියවා සිංහල ව්‍යාකරණ ශිෂ්‍යයන්ට හොඳ රඟට පුහුණු කරවා දැවුරුද්ද කින් ඉවර කළ යනුයි.

මේ පොත ඉතා ශිථිල භාෂාවෙන් ව්‍යවහාර උදාහරණ දක්වා කර තිබෙන බැවින් මීට වඩා සුවල්ප කාලයක් තුළදී ව්‍යාකරණ උගන්වන්ටත් සමර්ථ ගුරුවරුන්ට උගහට නොවේ.

ඝෝෂ, අඝෝෂ, ඌෂ්ම, අන්තඃස්ථ ආදි සංස්කෘත භාෂාවේ අක්ෂර විභාගය වඩා ප්‍රයෝජන නොමැති බැවිනුත් වෙන ව්‍යාකරණවලින් ගෙණ ගුරුවරුන්ට ඉගැන්වීම ඉතා පහසු බැවිනුත් මෙහි නොදැක්වීමු.